

වාර්ෂික වාර්තාව

2018

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

© DMC 2018

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

විද්‍යා මාවත

කොළඹ 07

ශ්‍රී ලංකා

වෙබ් අඩවිය

www.dmc.gov.lk

විද්‍යුත් තැපෑල

info@dmc.gov.lk

හදිසි ඇමතුම්

0112136222 / 2670002 / 117



පටුන

01. විධායක සාරාංශය **1**

1.1 හැඳින්වීම **1**

1.2 ආපදා කළමනාකරණය සඳහාවන ජාතික සභාව **1**

1.3 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා **2**

02. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක් **3**

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ **3**

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් **3**

2.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය **4**

2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව හා කාර්යය මණ්ඩලය **5**

2.4.1 කාර්යය මණ්ඩලය බඳවා ගැනීම **5**

2.4.2 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක **6**

2.5 **2018** වර්ෂයේ ඇතිවූ ආපදා තත්වයන් පිළිබඳ විග්‍රහය **7**

2.5.1 ආපදාවල බලපෑම් විශ්ලේෂණය - **2018** **7**

i. සමස්ත බලපෑම් - **2018** **7**

ii. නිවාස හානි - **2018** **8**

iii. එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස - **2018** **9**

iv. මරණ / අතුරුදහන් වීම් හා තුවාල **9**

v. ඩිස්ඉන්වෙන්ට්‍රා දත්ත අනුව ආපදාවල බලපෑමේ සාරාංශය - **2018** **10**

03. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම් **11**

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම **11**

3.2 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම **11**

3.3 ආයතනික ආපදා පෙර සූදානම් සැලැස්ම **11**

3.4 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව **12**

3.5 විගණන සහ කළමනාකරණ කමිටුව **12**

3.6 ජාතික සුරක්ෂිත දිනය **13**

3.7 හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව **13**

3.8 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය **13**

3.9 ඩිස්ඉන්වෙන්ට්‍රා **(Desinventor)** දත්ත ගබඩාව **14**

04. අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය **14**

4.1 හැඳින්වීම **14**

4.2 අංශයේ වගකීම් හා කාර්යභාරය **16**

4.3 අංශයේ ක්‍රියාකාරකම් **16**

4.4 අංශයේ පොදු ක්‍රියාකාරකම් **18**

4.5 **2018** වර්ෂයේ ප්‍රගතිය **19**

4.6	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	20
4.7	ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම	23
4.8	ආපදා අවදානම් තක්සේරුව	26
4.9	"ඩිස්ඉන්වෙන්ට්‍රා" දත්ත ගබඩාව	27
4.10	"රිස්ක්ඉන්ෆෝ" අවදානම් තොරතුරු වෙබ් අඩවිය	28
4.11	චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර ආපදාවට පාත්‍ර වූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම	28
4.12	දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම	29
4.13	අභියෝග	30
05. පෙර සූදානම් හා සැලසුම් අංශය		32
5.1	හැඳින්වීම	32
5.2	දිස්ත්‍රික් මට්ටමේ පෙර සූදානම් සැලසුම්	32
5.3	ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා පෙර සූදානම් ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම	33
5.4	අන්තර් ජාතික / ජාතික / දිස්ත්‍රික් / ප්‍රාදේශීය මට්ටමේ පෙරහුරු වැඩසටහන්	34
5.4.1	කලාපීය හා ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන **(2018.09.05) (IOWAVE – 2018)**	34
5.5	ග්‍රාමීය මට්ටමෙන් පවත්වන ලද "ආපදාවට පෙර සූදානම්" වැඩසටහන්	36
5.6	විශාල ජලාශ වේළි ආශ්‍රිත ව්‍යසන සම්බන්ධයෙන් පෙර සූදානම් කටයුතු	36
5.7	රට තුළ දියේ ගිලීම් නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම	37
5.8	රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම	37
5.9	පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන්	37
5.10	ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන	38
5.11	මෝසම් පෙර සූදානම් වැඩසටහන - ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය	39
5.12	ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2018 - 2030**	39
5.13	උමා ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතියේ බලපෑමට ලක්වූ ප්‍රදේශ ආශ්‍රිත විශේෂ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	40
5.14	පාර්ශ්වකාර ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කල වැඩසටහන්	41
5.14.1	දේශගුණික ප්‍රත්‍යාස්ථ ඒකාබද්ධ ජල කළමනාකරණ වැඩසටහන	41
5.14.2	පාසල් සුනාමි ආපදා පෙරහුරු වැඩසටහන	42
06. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය		43
6.1	හැඳින්වීම	43
6.2	ජාතික මට්ටමේ පුහුණු වැඩසටහන්	44
6.2.1	ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ සමාජ සුභ සාධන අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කෙරෙන ඒකාබද්ධ දැනුවත් කිරීමේ වැඩසටහන	44
6.2.2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික යොවුන් සේනාංකය එක්ව ක්‍රියාත්මක කරන ආපදා තරුණ ස්වේච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන	47

6.2.3	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන	48
6.2.4	ආපදා කළමනාකරණය පිළිබඳ මහජනතාව සහ පාසල් සිසුන් ප්‍රදර්ශන හරහා දැනුවත් කිරීම	49
6.2.5	ආපදා කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ බාලදක්ෂයින් ආපදා කළමනාකරණය පිළිබඳ ස්වේච්ඡා කණ්ඩායම් ලෙස පුහුණු කිරීමේ ජාතික වැඩසටහන	50
6.3	සෙවීම් හා මුදවා ගැනීමේ වැඩසටහන	50
6.4	ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන	51
6.5	මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම	53
6.6	අත්පත්‍රිකා සහ දැනුවත් කිරීමේ මුද්‍රණ කටයුතු	53
6.7	දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන	54
6.8	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන්	57
6.9	ජාතික සුරක්ෂිත දිනය	59
07. හදිසි මෙහෙයුම් අංශය		60
7.1	හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය	60
7.2	ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීම	60
7.3	ගංවතුර සහ අනෙකුත් ව්‍යසන පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම	66
7.4	සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ ආපදා කළමනාකරණ නේවාසික පුහුණු පාඨමාලාව	66
7.5	හදිසි ආපදාවන්හිදී මාධ්‍ය සම්බන්ධීකරණය	68
7.6	හදිසි අවස්ථාවන්හිදී ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණය	68
7.7	ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම	69
7.8	තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන / අනෙකුත් සන්නිවේදන	69
7.9	ඇමතුම් මැදිරිය	70
7.10	2018 වර්ෂය තුළදී කරන ලද හදිසි මෙහෙයුම් අංශයට අදාළ අනෙකුත් කාර්යන්	70
08. මූල්‍ය හා ගිණුම් අංශය		71
8.1	2018 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය ප්‍රගතිය	71
09. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව හා එම වාර්තාව වෙනුවෙන් වූ පිළිතුරු වාර්තාව		92

01. විධායක සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක ආයතනය ලෙස, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනතෙහි 13වන වගන්තිය ප්‍රකාරව මෙම ආයතනය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමෙන් ක්‍රමෝපායික මඟපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය, ජාතික සභාව වෙත පැවරී ඇති අතර, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඒ සඳහා මඟපෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමුවෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්ය රාමුවක් බවට 2005 අංක 13 දරන මෙම පනත පත්විය.

මෙම පනත මඟින් පිහිටුවන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වනුයේ, ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනිකුත් ප්‍රධාන ආයතන හා එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

1.2 ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතින් පවරා ඇති පරිදි ආපදා කළමනාරකරණය සඳහා වන ජාතික සභාව 2005 වසරේදී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරාගත් විෂයයන් භාරව සිටින අමාත්‍යවරුන්, පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුන්ගෙන් යුතු කණ්ඩායමකි. (සටහන 1.1)

ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ සංයුතිය



සටහන 1.1: ජාතික සභාවේ සංයුතිය

1.3 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා

2005 අංක 13 දරන පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයෑම්
- සුළි සුළඟ
- ගං වතුර
- නියඟය
- කාර්මික ආපදා
- සුනාමි
- භූමි කම්පා
- ගුවන් උවදුරු
- මුහුදු උවදුරු
- ගිනි
- වසංගත තත්වයන්
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගල
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනිගැනීම්
- වෙරළ ඛාදනය
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි ගිගුරුම් සහිත කුණාටු

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ජාතික වගකීම වන්නේ, ශ්‍රී ලංකාව සුරක්ෂිත සමාජයක් බවට පත් කිරීමයි. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ නායකත්වය යටතේ අංශ හයකින් සමන්විතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය සකස් වී ඇත.

ඒ අනුව එහි ප්‍රධාන අංශ පහත දැක්වේ.

1. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පෙර සූදානම් හා සැලසුම් අංශය
3. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය
4. හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය
5. මානව සම්පත් අංශය
6. මූල්‍ය අංශය

මෙම ජාතික වගකීම දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සෑම දිස්ත්‍රික්කයක් තුළම ස්ථාපිත කර ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රටතුළ ක්‍රියාත්මක කෙරේ.

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

<u>දැක්ම</u>

ශ්‍රී ලංකාවේ සුරක්ෂිත ප්‍රජාවක් ස්ථාපිත කිරීම තුළින් තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීම.

<u>මෙහෙවර</u>

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ආපදා ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව තුළත් පොදුවේ පවුල් ඒකක තුළත් සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැගීම.

<u>අභිමතාර්ථ</u>

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයක් තුළින් පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති කාර්යයන්.

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මක් සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.
- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.

- පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා ප්‍රතිචාර දැක්වීමට පෙර සූදානම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් සිදුකිරීම සහ ඒවා ප්‍රචාරය කිරීම.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෝදිසි සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම.
- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අඩු කිරීම සඳහා සංවර්ධන ක්‍රියාවලියට අන්තර්ගත කිරීම.
- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිද හමුදාව සහ පොලිසිය, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන දේශීය සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

සටහන **2.1**හි දක්වා ඇති පරිදි ආපදා කළමනාරණ මධ්‍යස්ථානය විසින් ඉටුකරනු ලබන විවිධ කාර්යයන් හා වැඩසටහන් සැලකිල්ලට ගනිමින් මෙම ආයතනික ව්‍යුහය සකස් කර ඇත.



සටහන **2.1:** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩලය

2.4.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නව බඳවා ගැනීම් පටිපාටිය අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කර ඇති අතර වසර අවසාන වන විට ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික්ක මට්ටමේ තිබූ පුරප්පාඩුවලින් **35.1%**ක් බඳවා ගනු ලැබීය.

2018.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අධ්‍යක්ෂ	6	3	3
අභ්‍යන්තර විගණක	1	1	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ	18	0	18
සහකාර අධ්‍යක්ෂ	15	14	1
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	25	25	0
ගිණුම් නිලධාරී	1	1	0
පරිපාලන නිලධාරී	1	0	1
පුද්ගලික සහකාර	1	0	1
විමර්ශන නිලධාරී	1	0	1
දුර දැනීම / භූ තොරතුරු දත්ත පද්ධති විශ්ලේෂක	1	0	1
දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
තොරතුරු තාක්ෂණ නිලධාරී	1	0	1
ජාල පද්ධති පරිපාලක	1	0	1
පුස්තකාලයාධිපති	1	1	0
සංවර්ධන නිලධාරී	101	1	100
භාෂා පරිවර්ථක	2	0	2
තොරතුරු තාක්ෂණ සහකාර	6	6	0
චලන හා නිෂ්චල කැමරා ශිල්පි	1	1	0
සන්නිවේදන කාර්මික ශිල්පි	3	3	0
ගුවන් විදුලි ක්‍රියාකරු	1	1	0
කළමනාකරණ සහකාර/ ආපදා කළමනාකරණ සහකාර	201	201	0
රියදුරු	39	38	1
කාර්යාල සහායක	35	35	0
එකතුව	465	334	131

වගුව **2.1: 2018.12.31** වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව

2018.12.31 දිනට නව බඳවා ගැනීම්

තනතුර	සංඛ්‍යාව
සහකාර අධ්‍යක්ෂ (අවම කිරීම්)	1
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	6
විමර්ශන නිලධාරී	1
පරිපාලන නිලධාරී	1
පුස්තකාලයාධිපති	1
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	28
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	1
රියදුරු	2
කාර්යාල සහායක	5

වගුව **2.2: 2018.12.31** දිනට බඳවා ගැනීමේ ප්‍රගතිය

2018.12.31 දිනට අයදුම්පත් කැඳවීම්

තනතුර	සංඛ්‍යාව
අධ්‍යක්ෂ (මානව සම්පත්)	1
අධ්‍යක්ෂ (මුදල්)	1
නියෝජ්‍ය අධ්‍යක්ෂ	15
පුස්තකාලයාධිපති	1
දුර දැනීම් / භූ තොරතුරු පද්ධති විශ්ලේෂක	1
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	1
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	25

වගුව **2.3: 2018.12.31** දිනට අයදුම්පත් කැඳවීම්

මධ්‍යස්ථානයේ පවතින අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු **03** අතුරින් අධ්‍යක්ෂ (හදිසි මෙහෙයුම්) තනතුර සඳහා ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරියෙකු වසර **02**ක කාලයක් සඳහා අනුයුක්ත කර ඇති අතර අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) සහ අධ්‍යක්ෂ (මුදල්) තනතුරු සඳහා වැඩබැලීමේ පදනමින් ඒකාබද්ධ පරිපාලන සේවයේ නිලධාරීන් දෙදෙනෙකු පත්කර ගෙන ඇත.

සංවර්ධන නිලධාරී තනතුරු **100**ක් **2017** වර්ෂයේදී අනුමත වී ඇති අතර ඒ අනුව ඊට අදාළ බඳවා ගැනීමේ පටිපාටි සකස් කොට අනුමත කරවා ගැනීමෙන් අනතුරුව මේ වනවිට එම පුරුප්පාඩු පිරවීම සඳහාද අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. **2018.12.31** දිනට පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගෙන **2019** වසර අවසාන වීමට ප්‍රථම එම කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත.

2.4.2 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

මෙම ඒකක දිස්ත්‍රික් **25** තුළම පිහිටුවා ඇත. මෙම එක් එක් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල කාර්ය මණ්ඩලය, සහකාර අධ්‍යක්ෂවරයෙකු (දිස්ත්‍රික්) සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන්ගෙන්, කළමනාකරණ සහකාරවරුන්ගෙන්, කාර්යාල සහායකවරුයෙකු

මෙන්ම රියදුරුවරයෙකුගෙන් සමන්විත වේ. දිස්ත්‍රික්කය ආපදාවලට භාජනය වීමට ඇති නැඹුරුතාවය අනුව දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සහායකයින් සංඛ්‍යාව වෙනස් වේ. මුළු එකතුව ගත් කල සහකාර අධ්‍යක්ෂවරුන් (දිස්ත්‍රික්) 25 දෙනෙකු සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහායකයින් 100 දෙනෙකු දිස්ත්‍රික්ක 25 තුළ සේවයේ යොදවා ඇත.

කොළඹ, කළුතර, ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලට යුධ හමුදා සහ ගුවන් හමුදා සේවකයින් අනුයුක්ත කර ඇත. කළුතර දිස්ත්‍රික්කය හැර සෙසු දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ස්ථාපිත කර ඇත. පහත රූප සටහනෙහි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය දැක්වේ.

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය පහත 2.2 රූප සටහනෙහි දක්වා ඇත.



සටහන 2.2: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ

2.5 2018 වර්ෂයේ ඇතිවූ ආපදා තත්වයන් පිළිබඳ විග්‍රහය

2.5.1 ආපදාවල බලපෑම විශ්ලේෂණය - 2018

i. සමස්ත බලපෑම- 2018

2018 වසරේ ගංවතුර, නායයෑම්, දැඩි සුළං, ගිනි ගැනීම්, සහ අකුණු යනාදියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 492,852ක් පමණ වේ. නියඟය නිසා පමණක් බලපෑමට ලක්වූ පුද්ගලයින් සංඛ්‍යාව 925,947 වේ. පසුගිය 2017 වසර සමඟ සන්සන්දනාත්මකව බැලීමේදී ඉහත බලපෑමට ලක්වූ පුද්ගලයින්ගේ අඩුවීමක් දක්නට ලැබේ. මරණයට පත්වූ සහ තුවාල ලැබූ සංඛ්‍යාව පිළිවෙලින් 62ක් සහ 110ක් වේ.

තවද, 2017 සමඟ සන්සන්දනය කිරීමේදී හානියට පත්වූ සහ විනාශයට පත්වූ නිවාස සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබේ.







සටහන :
ආපදා නිසා බලපෑමට ලක්වූ පුද්ගලයින්ගේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමේදී සමුච්චිත එකතුව භාවිතා කර ඇත.

උදා: එක් පුද්ගලයෙක් එක් වසරක් තුළදී යම්කිසි ආපදාවක් නිසා දෙවරක් බලපෑමට ලක්වුයේ නම් එකතුව 02ක් ලෙස ගණනය කරනු ලැබේ.

සටහන : ඉහත සටහන හේතුකොටගෙන, නියඟය විසින් බලපෑමට ලක්වූ පුද්ගලයින් මේ සඳහා ඇතුළත් කොට නැත.

ii. නිවාස හානි - 2018

2018 වසරේ වැඩිම නිවාස හානි වාර්තා වී ඇත්තේ මැයි මාසයේය. දැඩි සුළං හා ගංවතුර හේතුවෙන් වැඩිම හානිය වාර්තා වී ඇති අතර එය නිවාස 5,364 කි. එම හානියට පත් වැඩිම නිවාස වර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. එනම්, ගංවතුර හේතුවෙන් නිවාස 2,271කට හානි වී ඇත.

කෑගල්ල, පුත්තලම, රත්නපුරය යන දිස්ත්‍රික්කවලින් ද සැලකිය යුතු නිවාස හානියක් වාර්තා වී ඇත.



iii. එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස- 2018



නිවාස 2,679ක් පමණ විනාශ වූ අතර නිවාස 46,908කට වැඩි ප්‍රමාණයක් හානියට පත්විය. වැඩිම හානිය සිදු වී ඇත්තේ ගංවතුර හේතුවෙනි.

සටහන 2.3 එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස



සටහන 2.4: පූර්ණ නිවාස හානි



සටහන 2.5: අර්ධ නිවාස හානි

iv. මරණ / අතුරුදහන් වීම් සහ තුවාල

ගංවතුර හේතුවෙන් මැයි මාසය තුළ වැඩිම මරණ හා අතුරුදන් වීම් ප්‍රමාණයක් වාර්තා වී ඇත. අකුණු නිසා වැඩිම මරණ සංඛ්‍යාවක් පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර කුරුණෑගල, පුත්තලම, ගම්පහ යන දිස්ත්‍රික්කවලද ආපදා හේතුවෙන් සැලකිය යුතු වැඩිම අතුරුදන් වීම් හා මරණ වාර්තා වී ඇත.

ජූලි මාසයේ වැඩිම තුවාල සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් වන අතර එය දැඩි සුළං හේතුවෙන් සිදු වී ඇත.



සටහන 2.6: මරණ / අතුරුදහන් වීම් හා තුවාල

2018 වසරේ අතුරුදහන්වූ සහ මරණයට පත්වූ සංඛ්‍යාව 199ක් වන අතර එයින් 39%ක් පමණ දියේ ගිලීම් නිසා සිදුවී ඇත. දෙවැනි වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තා වූයේ ගංවතුර මඟිනි. එය 19%කි. අකුණු ගැසීම්, සත්ව ප්‍රහාර හේතුවෙන් සිදු වී ඇති මරණ සංඛ්‍යාව පිළිවෙලින් 12%ක් හා 10%ක් පමණ වේ.



සටහන 2.7: එක් එක් ආපදාවලින් සිදුවූ මරණ හා අතුරුදහන් වීම්

v. "ඩිස්ඉන්වෙන්ට්‍රා" (Desinventor) දත්ත අනුව ආපදාවල බලපෑමේ සාරාංශය- 2018

- 2018 වසර තුළ වැඩි වශයෙන් පීඩාවට පත්වූ ජනතාව සිටින දිස්ත්‍රික්ක ලෙස පුත්තලම, කිළිනොච්චිය, මඩකලපුව, යාපනය සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක හැඳින්විය හැකිය.
- ජනතාවට සැළකිය යුතු බලපෑමක් ඇතිවූ අනෙකුත් දිස්ත්‍රික්ක ලෙස මන්නාරම, ගම්පහ සහ මුලතිව් දිස්ත්‍රික්ක හැඳින්විය හැකිය.
- සමස්තයක් ලෙස 2018 වසරේදී ගංවතුර හේතුවෙන් දිස්ත්‍රික්ක 23කට බලපෑම් සිදු වී ඇති අතර නියඟය හේතුවෙන් දිස්ත්‍රික්ක 18කට බලපෑම් සිදු වී ඇත.
- සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් නියඟය හේතුවෙන්ද, උතුරු හා බටහිර පළාත්වල ගංවතුර හේතුවෙන්ද ආපදාවට ලක් වී ඇත.

3. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමේ කාර්යය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවසන් කර ඇති අතර එම සංශෝධිත පනත් කෙටුම්පත නීතිපති අනුමැතිය සඳහා යොමුකර ඇත.

3.2 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම (ජා.හ.අ.මෙ.සැ.) (NEOP)

ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත මඟින් පෙන්වා දී ඇත. ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම මඟින් රට තුළ ව්‍යසන ඇති විය හැකි අවස්ථා පැහැදිලි කරනු ලබන අතර ශ්‍රී ලංකාව තුළ සිදුවන කාලගුණ, ජල, ජීව විද්‍යාත්මක, තාක්ෂණික හා මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යසන සඳහා ප්‍රතිචාර යාන්ත්‍රණයන් එමඟින් ආවරණය කරනු ලැබේ. ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පරිශීලනය කිරීමේ පහසුව සඳහා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම 1-වෙළුම සහ 2-වෙළුම ලෙස වෙළුම් දෙකකින් භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලදී. කිසියම් ආයතනයක සක්‍යතාවය සහ නිත්‍ය වගකීම ඉක්මවා යන ආකාරයේ හදිසි අවස්ථාවකදී ආයතන හා පුද්ගලයින් වෙත වගකීම් පවරාදීම සඳහා පහසුකම් සැලසීම, පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය සක්‍රිය කිරීම සහ හදිසි අවශ්‍යතා මෙහෙයුම් සම්බන්ධීකරණය ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම 1-වෙළුම මඟින්ද, ආයතනික වගකීම් හා කාර්ය භාරය, ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම 2-වෙළුම මඟින්ද, විස්තර කර ඇත.

භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලද ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සඳහා, ඉදිරියේදී ආපදා කළමනාකරණය ජාතික සභාවෙහි අනුමැතිය ලබා ගන්නා තෙක් ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම 1-වෙළුම මාර්ගෝපදේශ කර ගනිමින් හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සිදු කරන කටයුතු සඳහා අන්තර් කාලීන කළමනාකරණ කමිටුවේ එකඟතාවය ලබා දී ඇත.

3.3 ආයතනික ආපදා පෙර සූදානම් සැළැස්ම (IDMP)

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතට අනුව ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සඳහා මාර්ගෝපදේශයන් සකස් කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පවරා ඇත. ඒ අනුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය යන ආයතන සමඟ එක්ව මාර්ගෝපදේශයන් සකස් කරන ලදි. එම මාර්ගෝපදේශය ක්‍රියාවේ යෙදවීමට ප්‍රථමව ප්‍රධාන පාර්ශවකාර ආයතන 10ක් සඳහා නේවාසික වැඩමුළුවක් සංවිධානය කර එම මාර්ගෝපදේශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ආයතන මට්ටමින් නිරීක්ෂණ ලබාගන්නා ලදි. අවසාන මාර්ගෝපදේශය අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර නැවත ඉහත ආයතන හා ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව, සෞඛ්‍ය අමාත්‍යාංශය, පොලිසිය සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව යන ආයතන සඳහා ඉදිරිපත් කරඇති අතර ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

මාර්ගෝපදේශයන් සකස් කරගෙන ඇත. අනෙකුත් ආයතනද මේ වනවිට මාර්ගෝපදේශයන් සකස් කරමින් පවතී. මෙහි ක්‍රියාකාරීත්වයේ දුර්වලතා හා ගැටළු ඇත්නම් ඒවා ප්‍රතිශෝදනය කිරීමට සැලසුම් කරඇත.

3.4 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණමය කටයුතු සම්බන්ධව තීරණ ගැනීම ගන්නා වූ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය අන්තර්කාලීන කළමනාකරණ කමිටුව නම් වේ. එය ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2018 වර්ෂය තුළදී රැස්වීම්වාර 8ක් පවත්වා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

1) ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සභාපති
2) මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය - නියෝජිත-සාමාජික
3) ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය- නියෝජිත - සාමාජික
4) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය - නියෝජිත- සාමාජික
5) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - සාමාජික
6) ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සාමාජික
7) අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - ලේකම්

3.5 විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් විගණනයට ලක් කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධව විගණනාත්මක උපදේශණ මෙහෙයුම් කමිටුව විගණන සහ කළමනාකරණ කමිටුව නම් වේ. එහි 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සාමාජිකයන්ගේ සංයුතිය පහත දැක්වේ.

ඒ.වී. ජනාදර මහතා (සභාපති)	-	අධ්‍යක්ෂ, භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය
ආචාර්ය එස්. අමලනාදන් (සමාජික)	-	අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
එච්.යූ.ආර්. ෆොන්සේකා මහතා (සමාජික)	-	ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
කේ.ඒ. සුභද්‍රා වල්පොල මහත්මිය (සමාජික)	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
ඒ.බී.ආර්. අමරකෝන් මහත්මිය (නිරීක්ෂක)	-	විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව
කේ.ඒ. නිශාන්ත මහතා (සමාජික)	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ - මූල්‍ය (රා.ඉ.) ,ආ.ක.ම.
ජේ.එච්.පී. ජයලත් මහතා (සමාජික)	-	අභ්‍යන්තර විගණක, ආ.ක.ම.

ජාතික විගණන කාර්යාලයෙන් හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශයෙන් නිකුත් කර තිබූ විගණන විමසුම්වලින් මතුකර ඇති නිරීක්ෂණ පිළිබඳව කරුණු මෙහිදී සාකච්ඡාවට භාජනය කරඇත. ඒ

අනුව මුදල් රෙගුලාසි 133 හා 134 මඟින් දැක්වෙන කාර්යභාරයන්, කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛණවල දැක්වෙන උපදෙස් හා ජාතික විගණන පනතේ නියමයන්ට අනුව විගණන හා කළමනාකරණ කමිටුවේදී කරුණු සාකච්ඡා කර අදාළ නිවැරදි කර ගැනීම් සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකාරීත්වය වෙත අවශ්‍ය මඟපෙන්වීම් සිදුකර ඇත.
එමෙන්ම විගණන විමසුම් හා වාර්තාවලින් මතුකරන නිරීක්ෂණ හා විගණන කළමනාකරණ කමිටුවේ නිර්දේශ සඳහා මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන නිවැරදි කර ගැනීම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳවද මෙහිදී වැඩිදුරටත් කරුණු සොයා බලනු ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2018 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර තුනක් (03) පවත්වා අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත්ව හා නිවැරදිව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් කළමනාකාරීත්වය වෙත ලබා දී ඇත. එහෙත් වර්ෂයට අදාළ හතරවන විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්වීමට නොහැකි විය.

ශ්‍රී ලංකාවේ සම්පත්වලට මූලිකත්වය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් භාර ගන්නා ලද ව්‍යාපෘති, වැඩසටහන් හා කාර්යභාර්යන්වල පූර්ව නිශ්චය කරගත් අරමුණු ලඟා කර ගැනීමේ පර්මාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිතා කර ඇති බවට සහතික වීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සෑම අංශයක්ම සමාලෝචනය කිරීම සහ එකී ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද අරමුදල් වියදම් කිරීම සඳහා, අවසරලත් කාල සීමාව තුළ එකී පරමාර්ථ සැබෑවටම අත්කර ගෙන තිබේද යන්න සහ නිම කළ ව්‍යාපෘති හෝ වැඩසටහන්, සැලසුම්වලින් අපේක්ෂිත වූ පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න නිර්ණය කිරීම සිදුකිරීම විගණන හා කළමනාකරණ කමිටුවට පැවරී ඇති කාර්යන් වේ. එය ඉදිරි වර්ෂවලදී ද මනාව ඉටුකිරීමට කමිටුව විසින් අපේක්ෂා කර ඇත.

3.6 ජාතික සුරක්ෂිත දිනය

2018 වර්ෂයේ දෙසැම්බර් මස 26 දිනට යෙදී ඇති ජාතික සුරක්ෂිත දිනය වෙනුවෙන් වැඩසටහන් රැසක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදි. සියලුම දිස්ත්‍රික් කාර්යාලවල සර්ව ආගමික වැඩසටහන්වලට මුල් තැන දෙමින් මහජනතාව ව්‍යසන කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම් සිදුකරන ලදි. සියළුම දිස්ත්‍රික් වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා ක්‍රියාත්මක විය. ජාතික වැඩසටහන ගාල්ල පැරැලිය සුනාමි ස්මාරකය අභියසදී සිදු කරන ලදි.

3.7 හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව

අත්‍යාවශ්‍ය සේවාවන්වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ හදිසි අවස්ථාවන්හිදී ප්‍රතිචාර දක්වන පාර්ශව කණ්ඩායම් ආපදා අවස්ථාවකදී අදාළ ආයතන සමඟ සම්බන්ධ වී හදිසි ප්‍රතිචාර කටයුතු ඉටුකිරීම සඳහා පාර්ශවකාර ආයතන මෙහෙයවීම් සිදුකරනු ලබන ඍජු කමිටුව හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව නම් වේ.

3.8 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය ***www.dmc.gov.lk*** යථාවත් කිරීම හා නඩත්තු කිරීම අවම කිරීම් හා පර්යේෂණ අංශයේ කාර්යභාරය වන අතර 2018 වසරේදී ආයතනය විසින් සිදු කල

ප්‍රධාන ක්‍රියාකාරකම් බොහෝමයක් වෙබ් අඩවියට යොමුකොට ඇති අතර සියලු ආපදාවන්ට සම්බන්ධ තත්ත්ව වාර්තා දෛනිකව වෙබ් අඩවිය වෙත යොමු කරනු ලැබේ.

3.9 "ඩිස්ඉන්වෙන්ට්‍රා" (Desinventor) දත්ත ගබඩාව

ආපදා අවදානම් අවම කරමින් සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම පර්යේෂණ කටයුතු පියවරෙන් පියවර දීර්ඝ කාලීනව පුළුල් පරාසයක් තුළ විනිදයන ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කල යුතු වේ. මෙහිදී ආපදා අවදානම් අවමකර ගැනීම පිළිබඳ අධ්‍යන සඳහා පාදක කරගැනීමට නිවැරදිව යාවත්කාලීන වන දත්ත පදනමක් අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම අවශ්‍යතාවය හඳුනාගත් අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් 2008 වසරේ සිට "ඩිස්ඉන්වෙන්ට්‍රා" දත්ත ගබඩාව පවත්වාගෙන යනු ලබයි. මෙම සියලු දත්ත අන්තර්ජාලය තුළට විවෘතව පවතින අතර මෙම දත්ත අවශ්‍ය ඕනෑම අයෙකුට අන්තර්ජාලය මඟින් නොමිලේ ලබාගැනීමේ පහසුකම් ලබාදී ඇත.

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventor.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර එක් එක් සිද්ධීන්ට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුව අදාළ ආපදාවන් යටතේ අදාළ කාලයන් තුළ සිදුවූ මරණ, විපතට පත් ජනතාව හා හානියට පත් දේපල පිළිබඳ තොරතුරු සංඛ්‍යාත්මක වශයෙන් මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් හදිසි මෙහෙයුම් අංශයෙන් නිකුත් කරනු ලබන තත්ව වාර්තාවලින් මෙන්ම සෞඛ්‍ය, වනසංරක්ෂණ, වාරිමාර්ග සහ රිය අනතුරු පිළිබඳ පොලිස් වාර්තා (www.police.lk) වැනි අංශවලින් ලබාගන්නා තොරතුරුද මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. මෙම දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන වන අතර නව දත්ත මූලාශ්‍රයන් හඳුනාගනිමින් වඩාත් නිවැරදි දත්ත පද්ධතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගනිමින් ඉදිරියේදීද ක්‍රියාත්මක කරනු ලබයි.

4. අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

4.1 හැඳින්වීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලද අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ආපදා පෙරසුදානම්, පුහුණු කිරීම්, අවමකිරීම් / පර්යේෂණ හා සංවර්ධන සහ හදිසි ආපදා ප්‍රතිචාර ලෙස ප්‍රධාන අංශ හතරකින් සමන්විතවේ. මෙම එක් එක් අංශය වෙත පැවරී ඇති කාර්යභාරයන් එම අංශය මඟින් ඉටුකරනු ලබයි.

මහා භාණ්ඩාගාරය මඟින් පහත සඳහන් පරිදි 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය වෙත වෙන්කරන ලද අතර එම වර්ෂයේ භෞතික සහ මූල්‍ය ප්‍රගතියද පහත පරිදි වේ.

2018 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන සහ 2018 වර්ෂයේ මූල්‍ය හා භෞතික ප්‍රගති සාරාංශය.

වැය ශීර්ෂය	ව්‍යාපෘතිය	2018 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)
3-2509	ආපදා අවමකිරීමේ ව්‍යාපෘති	480	75.13	95
10-2509	ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේදය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තග්‍රහණය	15	87	87
7-2509	ආපදා අවදානම් තක්සේරුව	50	45	45

වගුව 4.1: 2018 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන සහ 2018 වර්ෂයේ මූල්‍ය හා භෞතික ප්‍රගති සාරාංශය

<u>මීට අමතරව පහත සඳහන් වැඩසටහන් සහ ක්‍රියාකාරකම්ද මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.</u>

- **"ඩිස්ඉන්වෙන්ට්‍රා" (Desinventra) දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම**

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventor.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇත. මෙම දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන වන අතර නව දත්ත මූලාශ්‍රයන් හඳුනාගනිමින් වඩාත් නිවැරදි දත්ත පද්ධතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

- **"රිස්ක්ඉන්ෆෝ" අවදානම් තොරතුරු වෙබ්අඩවිය" (riskinfo web potal)**

භූ විද්‍යාත්මක දත්ත (Geospatial Data) මෙම වෙබ් අඩවියට ඇතුළත් කිරීම (upload) මෙහිදී සිදුකරනු ලබයි. මෙම භූ විද්‍යාත්මක දත්ත දෙස් විදෙස් පර්යේෂකයින් විසින් භාවිතා කරනු ලබන අතර එමඟින් ආපදා සිදුවන, සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ අධ්‍යනය කිරීම්, තීරණගැනීම් ඉදිරි සැලසුම් සැකසීම් සිදුකරනු ලබයි.

එමෙන්ම ආපදා කළමනාකරණ කටයුතු සඳහා රාජ්‍ය, පුද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන මඟින් සිතියම් සහ දත්ත ඉල්ලුම් කිරීමේ අවස්ථා 27ක් 2018 වසර තුළ වාර්තා වූ අතර එම ඉල්ලුම්කරුවන් සඳහා අදාළ සිතියම් සහ දත්ත මෙම අංශය මඟින් ලබාදී ඇත.

- **චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකර ආපදාවට පාත්‍රවූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම**

2018 වර්ෂය තුළ මැයි මාසයේ සිදුවූ ආපදා තත්වයේදී "ඉන්ටනැෂනල් චාටර්" (International Charter) ආයතනය මඟින් චන්ද්‍රිකා ඡායාරූප ඉල්ලුම්කර ලබාගන්නා ලද අතර මැයි සහ දෙසැම්බර් මාසවලදී "සෙන්ටුඅල් එශියා" (Sentiual Asia) ආයතනය මඟින් චන්ද්‍රිකා ඡායාරූප ඉල්ලුම්කර ලබාගන්නා ලදී.

- **දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම**

ආපදා අවම කිරීමට අදාළව මහජනතාව විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමුකරනු ලබන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීමද මෙම අංශය මඟින් සිදුකරනු ලබන අතර යොමුකර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම තීරණය වනු ඇත.

2018 වර්ෂය තුළ මෙවැනි ලිපි 271ක් ලැබී ඇති අතර ඒ සියලුම ලිපි සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

4.2 අංශයේ වගකීම් හා කාර්යභාරය

➢ ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවදානම් අවම කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම

සියලුම ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවදානම් අවම කිරීම සඳහා වන උපායමාර්ගික සැලසුම් සකසා ඉදිරිපත් කිරීම. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආපදා අවදානම් අවම කිරීම සඳහා ලැබෙන ප්‍රතිපාදන භාවිතා කර දිස්ත්‍රික් මට්ටමින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු මඟින් සම්බන්ධීකරණය සහ ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම.

ජාතික මට්ටමින් ආපදා අවදානම් අවම කිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ, ආයතන යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී දායකත්වය ලබාදී ආපදා අවදානම අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය සිදු කිරීම. ඒ පිළිබඳ ප්‍රගතිය වාර්තා කිරීම.

➢ ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධීකරණය තුළින් අදාළ ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ එක් එක් ක්ෂේත්‍ර සඳහා ආපදා අවදානම් අවම කිරීම සඳහා මාර්ගෝපදේශ නිර්මාණය තුළින් ජාතික මට්ටමේ ආපදා අවදානම් අවමකිරීම් සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාර්ගෝපදේශයක් නිර්මාණය කිරීම සහ එම මාර්ගෝපදේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා වන පසුගමනීය කටයුතු සිදුකිරීම.

➢ දේශගුණික විපර්යාස සඳහා අනුහුරුවීම, අනුගතවීම හා අවමකිරීමට අදාළ කාර්යයන් අනිකුත් ආයතන සහ සම්බන්ධීකරණය කොට ක්‍රියාත්මක කිරීම.

➢ අමාත්‍යාංශයේ උපදෙස් මත පදනම්ව ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම. පාර්ශවකාර ආයතන හා සම්බන්ධීකරණය කර පශ්චාත් ආපදා ප්‍රතිසංස්කරණ, නැවත යථාතත්වයට පත්කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

➢ ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම

- ආපදා සම්බන්ධ දත්ත පද්ධතීන් පවත්වාගන යාම සහ යාවත්කාලීන කිරීම
- ආපදා අවදානම් දිස්ත්‍රික්ක හා සම්බන්ධීකරණය කොට ආපදා අවදානම් තක්සේරුකරණය සම්බන්ධ කාර්යයන් සිදුකිරීමට ආපදා අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශ ලබාදීම.

4.3 අංශයේ ක්‍රියාකාරකම්

01. ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවදානම් අවම කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම

<u>දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

- ඉදිරි වසර සඳහා, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් මඟින් දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කරන ක්‍රියාකාරකම් තෝරාගැනීම සහ දිස්ත්‍රික් මට්ටමේ අදාළ නිර්දේශ සහිතව (අධ්‍යක්ෂ

ජනරාල්වරයා විසින් දිස්ත්‍රික් වෙත ලබාදී ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ගෝපදේශය අනුව) මූලික ව්‍යාපෘති යෝජනා ගෙන්වා ගැනීම.

- ඉදිරි වසර සඳහා, දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන මූලික සුදුසුකම් සපුරා ඇතිද යන බව සහතික කර ගැනීම, ඒ පිළිබඳ වාර්තා සැකසීම සහ දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපෝෂණ ඉදිරිපත් කිරීම.

- අවමකිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවමකිරීම් අංශය වෙත වෙන්කර ඇති ප්‍රතිපාදනවලට අනුරූපව ප්‍රමාණවත් මට්ටමින් දිස්ත්‍රික්ක මඟින් ව්‍යාපෘති යෝජනා ගෙන්වා ගැනීම සඳහා කටයුතු කිරීම.

- ඉදිරි වසර සඳහා දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘති යෝජනා සාරාංශය යාවත්කාලීන කිරීම සහ ව්‍යාපෘති තෝරා ගැනීම සඳහා ජාතික මට්ටමේ කමිටු සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලියකියවිලි සැකසීම.

- ජාතික මට්ටමින් ව්‍යාපෘති තෝරාගැනීමෙන් අනතුරුව (අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දිස්ත්‍රික් වෙත ලබාදී ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ගෝපදේශය අනුව) තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ වාර්තාකරණය සිදුකිරීම.

- තෝරාගත් ව්‍යාපෘති සඳහා වන ඇස්තමේන්තු සහ අනෙකුත් ලියකියවිලිවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සහ ඊට අදාළ ලිපිගොනු යාවත්කාලීන කිරීම අධීක්ෂණය කිරීම.

- තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී උද්ගතවන ප්‍රයෝගික ගැටළු විසඳීම සඳහා මැදිහත්වීම සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය වේගවත් කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම.

- ව්‍යාපෘති නිමකිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය සාර්ථකව අවසන්කල බවට වාර්තා ගෙන්වාගැනීම සහ මූල්‍ය වාර්තාකරණය නිසියාකාරව අවසන් කිරීමට කටයුතු කිරීම.

- ආපදා අවම කිරීමේ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය වාර්තාකරණය (භෞතික හා මූල්‍ය)

<u>ජාතික මට්ටමින් ආපදා අවදානම් අවමකිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ, ආයතන යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් සහ ව්‍යාපෘති</u>

- විවිධ වූ තාක්ෂණික ප්‍රවීණත්වය සහිත අමාත්‍යාංශ සහ ආයතන තුළින් ආපදා අවදානම් අවමකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමේදී ඒ සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම සහ මැදිහත්වීම් සිදුකිරීම.

- ආපදා අවමකිරීමේ වැඩසටහන් ඊට අදාළ තාක්ෂණික ආයතන සහ රේඛීය අමාත්‍යාංශ මඟින් සිදුකර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීම.

- වෙනත් අමාත්‍යාංශ, ආයතන මඟින් සිදුකරනු ලබන ආපදා අවදානම් අවමකිරීමේ වැඩසටහන් අධීක්ෂණය සහ වාර්තාකරණය කිරීම.

02. ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම පිළිබඳ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය.

- තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමේ තාක්ෂණික නිර්දේශ තුළින් සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.

- එක් එක් ක්ෂේත්‍රයන්වල ආපදා අවදානම් අවමකිරීමට මාර්ගෝපදේශ නිර්මාණය කිරීම සඳහා උපදේශන සේවාවක් තෝරාගැනීමට අවශ්‍ය කටයුතු සඳහා සහය වීම.

- මාර්ගෝපදේශ සැකසීම සඳහා තෝරාගනු ලබන උපදේශක සේවාව මඟින් නියමිත කාලය තුළ ගුණාත්මක සේවාවක් ලබාගැනීමට කටයුතු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.
- මාර්ගෝපදේශ සැකසීම, පරිවර්ථනය කිරීම සහ මුද්‍රණය කිරීම සඳහා කටයුතු කිරීම.
- රැස්වීම්, දැනුවත් කිරීම්, වැඩමුළු ආදිය සංවිධානය කිරීම.
- වාර්තාකරණය සිදුකිරීම.
- ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.
- මාර්ගෝපදේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා වන පසුගමනීය කටයුතු සිදුකිරීම.

03. දේශගුණික විපර්යාස සඳහා අනුහුරුවීම, අනුගතවීම හා අවම කිරීමට අදාළ කායීන් අනිකුත් ආයතන සහ සම්බන්ධීකරණය කොට ක්‍රියාත්මක කිරීම.

- දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීම, අනුගතවීම හා අවමකිරීමට අදාළ ව්‍යාපෘති යෝජනා පිළිබඳ කටයුතු සිදුකිරීම.
- දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීම, අනුගතවීම හා අවමකිරීමට අදාළ වැඩසටහන්, පුහුණුවීම්, වැඩමුළු ආදිය නියෝජනය කිරීම සහ එම වැඩසටහන්වලට අදාළ ඉදිරි කටයුතු සිදුකිරීම.
- දේශගුණික විපර්යාස සඳහා අනුහුරුවීම, අනුගතවීම හා අවමකිරීමට අදාළ වාර්තා සැකසීම.

04. ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිලිබඳ තක්සේරුකරණය කිරීම

- අමාත්‍යාංශයේ උපදෙස් මත පදනම්ව ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම.
- පාර්ශවකාර ආයතන හා සම්බන්ධීකරණය කොට පශ්චාත් ආපදා ප්‍රතිසංස්කරණ, නැවත යථාතත්වයට පත්කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

05. ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම.

- ආපදා සම්බන්ධ දත්ත පද්ධතීන් පවත්වාගන යාම සහ යාවත්කාලීන කිරීම අධීක්ෂණය කිරීම
- ආපදා අවදානම් දිස්ත්‍රික්ක හා සම්බන්ධීකරණය කොට ආපදා අවදානම් තක්සේරුකරණය සම්බන්ධ කායීන් සිදුකිරීමට ආපදා අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශ ලබාදීම.
- ආපදා අවදානම් පැතිකඩට අදාළ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ආපදා අවදානම් පැතිකඩ සැකසීම පිළිබඳ අධීක්ෂණය සිදුකිරීම.
- අදාළ අංශ සහ ආයතන වෙත ආපදා පිළිබඳ තොරතුරු ලබාදීමට කටයුතු කිරීම.
- අවශ්‍යතාවයන් අනුව තොරතුරු වාර්තා, සිතියම් ආදිය සැකසීම.
- වාර්තාකරණය සිදුකිරීම.

4.4 අංශයේ පොදු ක්‍රියාකාරකම්

- ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් යොමුකරනු ලබන ආපදා අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන විෂයට අදාළ ඉල්ලීම්, යෝජනා, චෝදනා සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම.
- අමාත්‍යාංශය මඟින් ඉල්ලුම් කරනු ලබන වාර්තා සැකසීම.

- ආපදා අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය නියෝජනය කරනු ලබන කමිටු, රැස්වීම්, වැඩමුළු සඳහා සහභාගී වීම / තොරතුරු ලබාදීම් / වාර්තා සැකසීම.
- අංශයේ සමස්ථ ප්‍රගති වාර්තා සැකසීම. (මූල්‍ය සහ භෞතික)
- අංශයේ සමස්ත වාර්ෂික වැඩසටහන් සැලසුම් සැකසීම.
- ලිපිගොනු නඩත්තු කිරීම අධීක්ෂණය කිරීම.
- සම්පත් කළමනාකරණය කිරීම. (මානව, භෞතික සහ මූල්‍ය)

4.5 2018 වර්ෂයේ ප්‍රගතිය

පසුගිය වසරවල සිදුවූ ආපදා සහ ඉදිරියේදී තීව්‍ර විය හැකි ආපදා පිළිබඳ අධ්‍යනය කරමින් අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා පදනම් කර ගනිමින් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාකාරී සැලසුම් සකසනු ලබයි. එමෙන්ම ආපදා කළමනාකරණ විෂයට අදාළ පර්යේෂණ කටයුතු, ආපදා අවදානම් තක්සේරුව සහ සංවර්ධන ප්‍රවාහය තුළ ආපදා අවදානම් අවමකිරීම අන්තර්ග්‍රහණය කිරීම සඳහා වන කටයුතු ද අදාළ තාක්ෂණික කමිටු හරහා සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලැබේ.

මහා භාණ්ඩාගාරය මඟින් පහත සඳහන් පරිදි 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය වෙත වෙන්කරන ලදී.

වැය ශීර්ෂය	ව්‍යාපෘතිය	2018 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන (රුපියල් මිලියන)
3-2509	ආපදා අවමකිරීමේ ව්‍යාපෘති	480
10-2509	ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේදය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තග්‍රහණය කිරීම	15
7-2509	ආපදා අවදානම් තක්සේරුව	50
එකතුව		545

වගුව 4.2: 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවම කිරීම් අංශය වෙත ලබා දී ඇති ආකාරය



සටහන 4.1: 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ආපදා හඳුනාගැනීම සහ දිස්ත්‍රික් මට්ටමේ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම, ආපදා කළමනාකරණ කටයුතු සඳහා පර්යේෂණ දායකත්වය ලබාදීම සහ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම යන වැඩසටහන් සඳහා ප්‍රමුඛස්ථානය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වගකීම් සහ කාර්යභාරය ඉටුකිරීමට දායකත්වය ලබාදෙනු ලැබේ. ඒ අනුව **2018** වර්ෂයේ මූල්‍ය සහ භෞතික ප්‍රගති සාරාංශය පහත පරිදි වේ.

වැය ශීර්ෂය	ව්‍යාපෘතිය	**2018** වර්ෂය තුළ මුල්‍ය ප්‍රගතිය (රු. මී.)	මුල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)
3-2509	ආපදා අවමකිරීමේ ව්‍යාපෘති	**480**	**73.13**	**98**
10-2509	ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේදය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තග්‍රහණය	**15**	**87**	**87**
7-2509	ආපදා අවදානම් තක්සේරුව	**50**	**45**	**45**

වගුව **4.3: 2018** වර්ෂයේ මූල්‍ය සහ භෞතික ප්‍රගති සාරාංශය

4.6 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව තුළ ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රධානතම කාර්යයක් වන අතර එහිදී එක් එක් වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය මඟින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන කළමනාකරණය කරමින් ආපදා අවමකිරීමේ ව්‍යාපෘති යෝජනාවල ප්‍රමුඛතා ගතකිරීම අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මෙහිදී විවිධ වූ ආපදා අවම කිරීමේ වැඩසටහන් ඊට අදාළ රේඛීය අමාත්‍යාංශය මඟින් එම අමාත්‍යාංශ සතු ප්‍රතිපාදන මඟින් සිදුකරගැනීම සඳහා යොමුකෙරෙන අතර ප්‍රමුඛතාවය මත අනෙකුත් ආපදා අවම කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබයි.

මෙහිදී දිස්ත්‍රික් මට්ටමින් කැඳවනු ලබන ආපදා අවමකිරීමේ ව්‍යාපෘති යෝජනා සලකා බලමින් ජාතික මට්ටමින් පත්කරනු ලබන කමිටුවක් මඟින් ආපදා අවමකිරීමේ ව්‍යාපෘති තෝරාගනු ලබන අතර ඉන් අනතුරුව එම ව්‍යාපෘති යෝජනාවලට අදාළ විස්තරාත්මක තක්සේරු වාර්තා සහ අදාළ වන අනෙකුත් තාක්ෂණික වාර්තාද සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික් ලේකම්වරු වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා සිදුකරනු ලැබේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලබන අතර ජාතික මට්ටමින් ද ව්‍යාපෘති ප්‍රගතිය අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි. එක් එක් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන විවිධ වූ තාක්ෂණික දායකත්වයන් දිස්ත්‍රික් මට්ටමින් ඊට අදාළ තාක්ෂණික ආයතන මඟින් ලබාගනු ලබන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මූල්‍ය සංසරණය සිදුකරනු ලබයි. ව්‍යාපෘතිය නිමකිරීමෙන් අනතුරුව විධිමත් ක්ෂේත්‍ර පරීක්ෂණයකින් අනතුරුව ව්‍යාපෘතිය සාර්ථකව නිමකල බවට අදාළ තාක්ෂණික නිර්දේශයන් සමඟ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂ මඟින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත වාර්තා කරනු ලැබේ.

ආපදා පිළිබඳ තොරතුරු සහ දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කරන ලද යෝජනා පදනම් කර ගනිමින් ඉදිරිපත් කරන ලද අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 480ක් 2018 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය මඟින් අනුමත කොට ඇත.

වසර	වෙන්කරන ලද මුදල (රු.මිලියන)
2011	114
2012	122
2013	274
2014	500
2015	500
2016	500
2017	480
2018	480

වගුව 4.4: 2018 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා ලබාදුන් ප්‍රතිපාදන

දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 278 ක් ක්‍රියාත්මක වූ අතර, 2018 වසරේ දෙසැම්බර් මස 31වන විට ව්‍යාපෘති 271ක් භෞතික වශයෙන් අවසන් කොට ඇති අතර ව්‍යාපෘති 07ක් මේවන විටත් ක්‍රියාත්මක වෙමින් පවතී. 2018 වසරේ දෙසැම්බර් මස 31 දින වන විට මෙම ව්‍යාපෘතිවල සමස්ථ භෞතික ප්‍රගතිය 98 % ක් හා මූල්‍ය ප්‍රගතිය 75.13% ක් වේ.

ආපදා අනුව මෙම ව්‍යාපෘති බෙදීයාම පහත වගුවෙහි දක්වා ඇති අතර අනෙකුත් ආපදාවන්ට අදාළ අවම කිරීමේ වැඩසටහන් ඊට අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු සිදුකර ඇත.

ආපදාව	ව්‍යාපෘති ගණන	ප්‍රතිපාදන (රුපියල්)
ගංවතුර	213	336,564,987.80
නායයාම් කන්ඩි කඩාවැටීම් ස්ථාවර කිරීම	41	76,555,513.34
නියඟය	21	39,465,391.74
සුනාමි	03	4,499,469.50
එකතුව	278	457,085,362.30

වගුව 4.5: එක් එක් ආපදා අනුව ව්‍යාපෘති බෙදීයාම

- මීට අමතරව 2017 වසරේ ව්‍යාපෘති සඳහා රු. 22,137,935.91ක ගෙවීම් 2018 වසර තුළ සිදුකර ඇත.



සටහන 4.2: ආපදා අනුව ව්‍යාපෘති බෙදී යාම

	දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන	වැඩ නිමකළ ව්‍යාපෘති ගණන	වෙන්කර ඇති මුළු ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය(%)	භෞතික ප්‍රගතිය (%)
01	අම්පාර	03	03	14,312,145.13	100	100
02	අනුරාධපුර	93	93	105,222,290.27	48	100
03	බදුල්ල	6	6	17,562,571.31	100	100
04	මඩකලපුව	2	2	16,361,782.08	96	100
05	කොළඹ	2	2	5,662,827.31	96	100
06	ගාල්ල	3	3	7,105,887.73	74	100
07	ගම්පහ	8	8	5,743,149.66	98	100
08	හම්බන්තොට	5	4	19,297,966.84	83	100
09	යාපනය	18	18	22,665,034.57	81	100
10	කළුතර	8	8	18,034,878.60	30	100
11	මහනුවර	16	16	27,886,900.13	94	100
12	කෑගල්ල	15	15	21,892,474.07	97	100
13	කිළිනොච්චි	11	11	9,722,073.85	100	100
14	කුරුණෑගල	3	3	5,445,227.44	0	100
15	මන්නාරම	4	4	10,350,194.05	69	100
16	මාතලේ	7	7	15,978,686.28	94	100
17	මාතර	3	2	2,939,178.62	80	100
18	මොණරාගල	3	3	9,931,307.00	80	100
19	මුලතිවු	3	3	6,830,000.00	19	100
20	නුවරඑළිය	6	2	9,468,191.77	74	70
21	පොළොන්නරුව	7	6	25,379,981.78	57	90
22	පුත්තලම	18	18	26,726,069.44	80	100
23	රත්නපුර	21	21	16,322,831.52	98	100
24	ත්‍රිකුණාමලය	5	5	15,780,400.00	99	100
25	වවුනියාව	7	7	19,667,687.96	94	100
ගංවතුර හදිසි ආපදා ප්‍රතිචාර ව්‍යාපෘති සඳහා වව්නියාව, පොළොන්නරුව සහ පුත්තලම දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිපාදන ලබාදීම				795,625.00		
එකතුව		278	271	457,085,362.30	75.13	98

වගුව **4.6:** දිස්ත්‍රික් අනුව ව්‍යාපෘති ප්‍රගතිය

ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හී රූප රාමු





ජලගැලීම් අවමකිරීම සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගල්තම්බරාව ග්‍රාමයේ ජල අපවහන පද්ධතියක් සැකසීම




ජලගැලීම් අවමකිරීම් සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යාය 25-26 යාකරන කුණුඇල බෝක්කුව ඉදිකිරීම




නායයෑමේ අවදානම අවමකිරීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය කදිරේශන් විදුහලේ ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම




ගංවතුර ආපදා අවමකිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ ඇල පද්ධති සුද්දපවිත්‍ර කිරීම

4.7 ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම

ආපදා කළමනාකරණ විෂය සාමූහික ක්‍රියාදාමයක් වියයුතු අතර මේ සඳහා සියලු ක්ෂේත්‍රයන්හි දායකත්වය අත්‍යවශ්‍ය කාරණයක් වේ. ස්වභාවික සහ මිනිසා විසින් ඇතිකරනු ලබන ආපදා රටේ ඕනෑම ස්ථානයක සිදුවීමේ අවදානම පවතින බැවින් ජලය, ගොඩබිම සහ ගුවන යන සෑම ක්ෂේත්‍රයකම ක්‍රියාකාරකම් සමඟ ආපදා අවදානම් අවම කිරීම බද්ධ විය යුතුව ඇත. ප්‍රායෝගිකත්වය සලකා බලමින් සෘජුවම ආපදා අවදානම් කළමනාකරණය සඳහා දායක කරගත යුතු ක්ෂේත්‍ර 10ක් හඳුනාගෙන එම ක්ෂේත්‍ර 4 තුළ ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

මෙහිදී මෙම ව්‍යාපෘතිය රාජ්‍ය සහ පුද්ගලික යන ප්‍රවාහයන් දෙකම සහසම්බන්ධ කරගනිමින් ක්‍රියාත්මක වන අතර මෙම ක්ෂේත්‍ර තුළ පුළුල් ලෙස ආපදා අවදානම් අවමකිරීම පිළිබඳ අවධානයට ලක්කිරීම තුළින් සංවර්ධන ප්‍රවාහය තුළට අවදානම් අවමකිරීම අන්තර්ග්‍රහණය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙමඟින්

ආපදා සිදුවීමේ ප්‍රවණතාවය ඉතාමත් සීඝ්‍රයෙන් අවමකර ගත හැකි අතර එමඟින් මානව, භෞතික සහ මූල්‍ය සම්පත් ආරක්ෂා කරගනිමින් තිරසාර සංවර්ධනයක් කරා රට මෙහෙයවීම සඳහා දායකත්වය ලබාදිය හැක.

ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික ක්‍රියාකාරී කමිටුවක් නිර්මාණය කර ඇති අතර විවිධ වූ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් මෙම තාක්ෂණික කමිටුව නියෝජනය කරනු ලබයි. මෙම කමිටුව රැස්වී ව්‍යාපෘතියට අදාළ ඉදිරි ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි.

2018 වර්ෂයේ තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් වාර දෙකක් පවත්වා ඇති අතර එම රැස්වීම්වලදී ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පුද්ගලික අංශය දායක කරගැනීම, ආපදා අවදානම් කළමනාකරණය සඳහා එක් එක් ක්ෂේත්‍ර සඳහා මාර්ගෝපදේශ සැකසීම සහ ඒ සඳහා උපදේශන සේවා ලබාගැනීම, ජාතික මට්ටමේ වැඩමුළු සංවිධානය කිරීම යන කරුණු පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කර තීන්දු තීරණ ගෙන ක්‍රියාත්මක කර ඇත. පහත සඳහන් දිනයන්හි තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් පවත්වන ලදී.

01. 2018/ 07/ 19

02. 2018/ 09/ 27

තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමේ නිර්දේශයන්ද අවධානයට ගනිමින් **2018/09/06** දින ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පුද්ගලික අංශය දායක කරගැනීම වෙනුවෙන් ජාතික මට්ටමේ වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද අතර මේ සඳහා පුද්ගලික අංශය නියෝජනය කරමින් බහුජාතික සහ ජාතික මට්ටමේ ව්‍යාපාරවල ඉහළ කළමනාකරණයේ නිලධාරීන් **52** දෙනෙකු සහභාගී වන ලදී. එහිදී ආපදා අවදානම් කොතෙක් දුරට පුද්ගලික ක්ෂේත්‍රය තුළට බලපෑම් කරනුයේද සහ පුද්ගලික ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීත්වය කොතරම් ආපදා අවදානම් කෙරෙහි බලපෑම් කරන්නේද යන්න පිළිබඳ බුද්ධිමය සංවාදයක් ඇතිකරගත් අතර ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පුද්ගලික ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ එකඟතා ඇතිකරගනිමින් වැඩමුළුව අවසන්කරන ලදී.

තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් සාකච්ඡා මඟින් සහ පෙර වසරවල දී ජාතික මට්ටමින් සිදුකරන ලද වැඩමුළු මඟින් ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා, ප්‍රධාන වශයෙන් පහත සඳහන් ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී.

1. ජාතික සැලසුම් සම්පාදන
2. නාගරික සංවර්ධන
3. ජාතික සහ පළාත් මහාමාර්ග ඉදිකිරීම් හා සංවර්ධන
4. පළාත්පාලන
5. සංචාරක
6. පුද්ගලික අංශය
7. සෞඛ්‍ය
8. ජල හා ඝනීපාරක්ෂාව
9. පාරිසරික බලපෑම් අධ්‍යන
10. දේශීය ආපදා කළමනාකරණ ක්‍රමෝපාය

ඒ අනුව හඳුනාගත් ක්ෂේත්‍ර දහය තුළ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීමට උපදේශක සේවා ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම මෙම වසර තුළ ආරම්භ කර සිදුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මේ වන විට සුදුසු උපදේශන සේවා ආයතනයක් හඳුනාගෙන, උපදේශන සේවා සිදුකිරීම සඳහා ගිවිසුම්වලට එළඹ ඇත. උක්ත මාර්ගෝපදේශ සැකසීම පිළිබඳ උපදේශන සේවා ආයතනය සමඟ මූලික සාකච්ඡා මේ වන විට සිදු කෙරෙමින් පවතී. මේ වන විටද සෞඛ්‍ය අංශයට අදාළ මාර්ගෝපදේශයන් බොහොමයක් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිර්මාණය කර ඇති අතර එම මාර්ගෝපදේශයන් සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කර මුද්‍රණය කිරීමේ කටයුතු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදුකරමින් පවතී.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සෑම දිස්ත්‍රික්කයකම සේවයහි නියුතු එක් කළමනාකරණ සහකාර නිලධාරියෙකු සහ තෝරාගත් ජාතික මූලස්ථානයේ සේවයහි නියුතු කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා **MS-Office** පිළිබඳ දෙදින පරිගණක පුහුණුවක් **NIBM** ආයතනයන් සිදුකරන ලදී. මෙමඟින් දත්ත ගබඩා සැකසීම සහ යාවත්කාලීන කිරීම ඇතුළුව **MS-Office** පිළිබඳව විධිමත් පුහුණුවක් නිලධාරීන් වෙත ලබාදෙන ලදී. මෙමඟින් අවමකිරීම්, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වන පරිගණක කටයුතු තාක්ෂණිකව නිවැරදිව ඉටුකිරීම තුළින් ආපදා කළමනාකරණ කටයුතු ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීම අපේක්ෂා කරන ලදී.

සෙන්දායි වැඩසටහන් රාමුව පදනම් කරගනිමින් ජාතික තිරසර සංවර්ධන අරමුණු ද සාක්ෂාත් කරගනීමින් ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මට්ටමේ දායකත්වය පිළිබඳ අමාත්‍යාංශය ද එක්ව සිදුකරන ලද වැඩමුළුව **2018** දෙසැම්බර් **17** වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. පුද්ගලික අංශයේ සහ රජයේ පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගීත්වයෙන් ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම පිළිබඳ ජාතික මට්ටමේ වැඩමුළුවක් සංවිධානය කරමින් පවතින අතර එම වැඩමුළුව **2019** වසර තුළ සිදුකිරීමට අපේක්ෂා කෙරේ.



2018/ 09/ 06 දින පුද්ගලික අංශය සඳහා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද වැඩමුළුව

4.8 ආපදා අවදානම් තක්සේරුව

රටතුළ සිදුවී ඇති ආපදා, කාලගුණ සහ දේශගුණික රටා, භූ විෂමතා, ආර්ථික සමාජීය සහ භෞතික පසුබිම, ආදී විවිධ වූ කරුණු පදනම් කරගනිමින් ආපදා අවදානම් තත්වයන් පිළිබඳ යම් පුරෝකථනය විද්‍යාත්මකව සිදුකිරීමේ හැකියාවක් පවතින අතර මේ සඳහා විවිධ වූ තාක්ෂණික ආයතන මඟින් සිදුකරනු ලබන පරීක්ෂණ, වාර්තා ආදිය ද ඉවහල් වේ. එමෙන්ම ආපදා තත්වයක් ඇතිවුව හොත් එක් එක් ආපදාව අනුව ගොදුරුවිය හැකි ප්‍රදේශ, ආරක්ෂිත ස්ථාන ආදී විවිධ වූ තොරතුරු විධිමත්ව නවීන තාක්ෂණය භාවිතා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සිදුකරනු ලබන නිලධාරීන්ට පරිශීලනය කළහැකි පරිදි සැකසීමද ඉතාමත් වැදගත් කාරණයක් වේ. එමෙන්ම ආපදා අවදානම් තක්සේරුවට අදාළ තොරතුරු මඟින් ආපදා කළමනාකරණයට අදාළ විවිධ වූ තීරණවලට එළඹීම සහ වැඩසටහන් සැලසුම් කිරීමද පහසුකරවනු ලැබේ.

උක්ත කරුණු සාක්ෂාත් කරගැනීම සඳහා ආපදා අවදානම් තක්සේරුවක් සිදුකර දිස්ත්‍රික් මට්ටමේ ආපදා අවදානම් පැතිකඩ සැකසීම මෙම අංශය මඟින් සිදුකරනු ලබන තවත් ව්‍යාපෘතියක් වේ.

දින පහකින් සමන්විත ගෝලීය තොරතුරු පද්ධති **(GIS)** පිළිබඳ පුහුණු වැඩසටහනක් **2018.03.26** දින සිට **2018.03.30** දින දක්වා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී පශ්චාත් උපාධි ආයතනයේ පවත්වන ලදී. මේ සඳහා **40** දෙනෙකු සහභාගී වන ලද අතර ගංවතුර ආපදාවලට අදාළ සිතියම්කරණය, වර්ෂාපතන දත්ත විශ්ලේෂණය, ආපදා අවදානම් තක්සේරුකරණය, ගොදුරුවීමේ හැකියාව තක්සේරුකරණය ආදී කරුණු සම්බන්ධව නූතන තාක්ෂණික මෙවලම් භාවිතයෙන් කටයුතු කිරීම පිළිබඳ ගුණාත්මක භාවයෙන් ඉහළ මට්ටමක පුහුණුවක් මෙම දින පහ තුළ සිදුකරන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරු, සහකාර අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු, මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අනෙකුත් නිලධාරීන්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් ඇතුළු පිරිසක් මෙම පුහුණුව සඳහා සහභාගී විය. මෙම පුහුණු වැඩසටහන, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්යවරු, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරු, ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතන **(IWMI)** නියෝජිතයන්, ආසියානු ආපදා පෙරසුදානම් මධ්‍යස්ථාන **(ADPC)** නියෝජිතයින් සහ එක්සත් ජාතීන්ගේ සංවිධාන **(UN-SPIDER/ UNOOSA-UNSPIDER)** නියෝජිතයින් ගෙන් සමන්විත විද්වත් කමිටුවක් මඟින් පහසුකරණය සිදුකරන ලදී.

ගෝලීය තොරතුරු පද්ධති **(GIS)** පිළිබඳ දැනුම භාවිතයෙන් ආපදා අවදානම් පැතිකඩ සැකසීම, ආපදා පුරෝකථනය සඳහා දත්ත විශ්ලේෂණය කිරීම, ආපදා කළමනාකරණයට අදාළ විවිධ අංශයන් හි ක්‍රියාකාරිත්වය සඳහා උපකාර වන භූවිද්‍යාත්මක දත්ත සැකසීම සහ භාවිතය ඇතුළු කටයුතු සඳහා මානව සම්පත සංවර්ධනය කිරීම මෙම පුහුණුවෙහි ප්‍රධාන අරමුණ විය.

2018 අගෝස්තු **20** සහ **21** යන දිනවල මහනුවර පොල්ගොල්ල සමුපකාර පුහුණු මධ්‍යස්ථානය තුළ පවත්වන ලද දිස්ත්‍රික් ආපදා පැතිකඩ නිර්මාණය කිරීමේ වැඩසටහන සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ජාතික මූලස්ථානයේ නිලධාරීන් සහ දිස්ත්‍රික් සහකාර සම්බන්ධීකාරකවරුන් ඇතුළුව **42**

දෙනෙකු සහභාගී වන ලදී. දිස්ත්‍රික් මට්ටමින් ආපදා පැතිකඩ නිර්මාණය කිරීම සඳහා ක්‍රමවේදයක් නිර්මාණය කිරීම සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතා ඇතිකර ගැනීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය.

ඇතිකරගත් එකඟතාවයන් අනුව දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවදානම් තක්සේරු කිරීම සඳහා දත්ත ඒකරාශී කිරීමට කටයුතු කරන ලද අතර මේ සඳහා දිස්ත්‍රික් මට්ටමින් දත්ත ඒකරාශී කිරීම සහ දත්ත පරිගණක ගත කිරීම සඳහා තාවකාලික පදනම මත (පුහුණුවන්නන්) පිරිස් බඳවාගන්නා ලදී. දිස්ත්‍රික් මට්ටමින් පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහා ග්‍රාමනිලධාරී වසම් මට්ටමින් දත්ත ඒකරාශී කිරීම සිදුකරන ලද අතර මේ සඳහා සම්පත් පැතිකඩ වැනි ද්විතීක දත්ත මූලාශ්‍ර ද පාදක කරගන්නා ලදී. දත්ත ඒකරාශී කිරීම සඳහා ක්ෂේත්‍ර රාජකාරීවල නියුතු රාජ්‍ය නිලධාරීන් ගේ සහය ද ලබාගන්නා ලදී.

මෙම කටයුත්ත සඳහා ජාතික මට්ටමින් ද තාවකාලික පදනම මත පුහුණුවන්නන් බඳවාගන්නා ලද අතර දිස්ත්‍රික් මට්ටමින් ලබාගත් දත්ත භාවිතයෙන් දිස්ත්‍රික් අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම ජාතික මූලස්ථානයේදී සිදුකරනු ලැබේ.

4.9 "ඩිස්ඉන්වෙන්ට්‍රා" (Desinventor) දත්ත ගබඩාව

ආපදා අවදානම් අවම කරමින් සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම පර්යේෂණ කටයුතු පියවරෙන් පියවර දීර්ඝ කාලීනව පුළුල් පරාසයක් තුළ විනිදයන ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කල යුතු වේ. මෙහිදී ආපදා අවදානම් අවමකර ගැනීම පිළිබඳ අධ්‍යන සඳහා පාදක කරගැනීමට නිවැරදිව යාවත්කාලීන වන දත්ත පදනමක් අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම අවශ්‍යතාවය හඳුනාගත් අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් 2008 වසරේ සිට "ඩිස්ඉන්වෙන්ට්‍රා" දත්ත ගබඩාව පවත්වාගන යනු ලබන අතර "රිස්ක්ඉන්ෆෝ" වෙබ් පිටුවද යාවත්කාලීන කරනු ලබයි. මෙම සියලු දත්ත අන්තර්ජාලය තුළ විවෘතව පවතින අතර මෙම දත්ත අවශ්‍ය ඕනෑම අයෙකුට අන්තර්ජාලය මඟින් නොමිලේ ලබාගැනීමේ පහසුකම ලබාදී ඇත.

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventor.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර එක් එක් සිද්ධීන්ට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව අදාළ ආපදාවන් යටතේ අදාළ කාලයන් තුළ සිදුවූ මරණ, විපතට පත් ජනතාව හා හානියට පත් දේපල පිළිබඳ තොරතුරු සංඛ්‍යාත්මක වශයෙන් මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් හදිසි මෙහෙයුම් අංශයෙන් නිකුත් කරනු ලබන තත්ව වාර්තාවලින් මෙන්ම සෞඛ්‍ය, වනසංරක්ෂණ, වාරිමාර්ග සහ රිය අනතුරු පිළිබඳ පොලිස් වාර්තා (www.police.lk) වැනි අංශවලින් ලබාගන්නා තොරතුරුද මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. මෙම දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන වන අතර නව දත්ත මූලාශ්‍රයන් හඳුනාගනිමින් වඩාත් නිවැරදි දත්ත පද්ධතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

4.10 "රිස්ක්ඉන්ෆෝ" අවදානම් තොරතුරු වෙබ්අඩවිය (riskinfo web potal)

භූ විද්‍යාත්මක දත්ත (Geospatial Data) මෙම වෙබ් අඩවියට ඇතුළත් කිරීම (upload) මෙහිදී සිදුකරනු ලබයි. මෙම භූ විද්‍යාත්මක දත්ත දෙස් විදෙස් පර්යේෂකයින් විසින් භාවිතා කරනු ලබන අතර එමඟින් ආපදා සිදුවන, සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ අධ්‍යනය කිරීම්, තීරණ ගැනීම් ඉදිරි සැලසුම් සැකසීම් සිදුකරනු ලබයි.

කිසිඳු අයකිරීමකින් තොරව අන්තර්ජාලය හරහා මෙම දත්ත ලබාගත හැකි අතර එමඟින් ආපදා කළමනාකරණය පිළිබඳ කටයුතු කරනු ලබන ආයතන සහ පුද්ගලයින් සඳහා සහය වීමත් පර්යේෂණ කටයුතු සඳහා දිරිමත් කිරීමත් සිදුකරනු ලබයි. විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් සඳහා අවශ්‍ය පුහුණු අවස්ථා ලබාදීම ද මේ හරහා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් සිදුකරනු ලබන අතර එමඟින් ආපදා කළමනාකරණ කෂේත්‍රය සඳහා නව මානව සම්පත් බිහිවීමද මෙහි අතුරු ප්‍රතිඵලයක් ලෙස හැදින්විය හැක.

එමෙන්ම ආපදා කළමනාකරණ කටයුතු සඳහා රාජ්‍ය, පුද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන මඟින් සිතියම් සහ දත්ත ඉල්ලුම් කිරීමේ අවස්ථා 27ක් 2018 වසර තුළ වාර්තා වූ අතර එම ඉල්ලුම්කරුවන් සඳහා අදාළ සිතියම් සහ දත්ත මෙම අංශය මඟින් ලබාදී ඇත.

4.11 චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර ආපදාවට පාත්‍රවූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම

ආපදා පෙර සුදානම් වීම සඳහා මෙන්ම හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම් සඳහා, ආපදා සිදුවිය හැකි සහ ආපදා සිදුවී ඇති ප්‍රදේශ මෙන්ම ආපදාවට ලක්වූ පිරිස් පිළිබඳ දත්ත ඉතාමත් වැදගත් සාධකයක් වේ. මෙම දත්ත ලබාගැනීම සඳහා නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් තොරතුරු අනාවරණය කිරීම අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් කටයුතු කරනු ලැබේ. මෙහිදී කාලගුණ අනාවැකි පදනම් කර ගනිමින් ආපදා ඇතිවීමට පෙර සහ ආපදා ඇතිවීමෙන් පසු චන්ද්‍රිකා ඡයාරූප ලබාගෙන එම ඡායාරූප විශ්ලේෂණය මඟින් පවතින ද්වීතීක දත්ත පදනම් කරගනිමින් උක්ත තොරතුරු ලබාගැනීමට කටයුතු කෙරේ.

ජාත්‍යන්තර චන්ද්‍රිකා තාක්ෂණ ආයතන මඟින් මෙම ඡායාරූප ලබාගන්නා අතර ඒ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත විශේෂිත අවස්ථාවක් "ඉන්ටනැෂනල් චාටර්" (International Charter) සහ "සෙන්ටුඅල් එශියා" (Sentiual Asia) යන ආයතන මඟින් ලබාදී ඇති අතර ආපදාවකට පෙර නිසි ක්‍රමවේද ඔස්සේ මෙම ආයතන වෙත දැනුම් දීමෙන් අනතුරුව එම ආපදා අවදානම් ප්‍රදේශ ආවරණය වන පරිදි චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීම සිදුකෙරෙන අතර ආපදාවට පෙර සහ පසු ඡායාරූප ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබාදීමට කටයුතු කෙරේ. තාක්ෂණික උපාංග භාවිතයෙන් මෙම ඡායාරූප විශ්ලේෂණය කිරීම ඉන් අනතුරුව සිදුකරනු ලැබේ.

2018 වර්ෂය තුළ මැයි මාසයේ සිදුවූ ආපදා තත්වයේදී "ඉන්ටනැෂනල් චාටර්" (International Charter) ආයතනය මඟින් චන්ද්‍රිකා ඡායාරූප ඉල්ලුම්කර ලබාගෙන්නා ලද අතර මැයි සහ දෙසැම්බර් මාසවලදී "සෙන්ටුඅල් එශියා" (Sentiual Asia) ආයතනය මඟින් චන්ද්‍රිකා ඡායාරූප ඉල්ලුම්කර

ලබාගන්නා ලදී. මෙහිදී ආපදා අවදානම බෙහෙවින් තීව්‍ර අවස්ථාවන්හිදී "ඉන්ටනැෂනල් චාටර්" **(International Charter)** ආයතනය මඟින් චන්ද්‍රිකා ඡායාරූප ඉල්ලුම් කරනු ලබන අතර ආපදා අවදානම එතරම්ම තීව්‍ර නොවන නමුත් ආපදාවක් අපේක්ෂිත අවස්ථාවලදී "සෙන්ටුඅල් එශියා" **(Sentiual Asia)** ආයතනය මඟින් චන්ද්‍රිකා ඡායාරූප ඉල්ලුම් කරනු ලැබේ.

4.12 දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

ආපදා අවම කිරීමට අදාළව මහජනතාව විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමුකරනු ලබන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීමද මෙම අංශය මඟින් සිදුකරනු ලබන අතර යොමුකර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම තීරණය වනු ඇත. මෙහිදී මෙම ලිපි සඳහා විසඳුම් ලබාදීමට ඇති හැකියාව පිළිබඳ අවදානය යොමුකරමින්, පවතින නීති රෙගුලාසි සහ ධාරිතාවයන් අනුව තාක්ෂණික නිර්දේශයන්ද සලකා බලමින් ජනතාව අපේක්ෂා ඉටුකිරීමට දායකවීම අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශයේ පරමාර්ථය වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විෂය පරාසය තුළ වන ඉල්ලීම් සඳහා ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය හරහා අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකර එම පරීක්ෂණ වාර්තා පදනම් කරගනිමින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිසි ක්‍රමවේදයන් අනුව තීන්දු තීරණ ලබාගන අවශ්‍ය කටයුතු සිදුකර ඇත. මෙහිදී එක් එක් කාරණය අනුව ඊට අදාළ තාක්ෂණික ආයතනය සහ රේඛීය අමාත්‍යාංශය වෙත උක්ත ඉල්ලීම් යොමුකිරීමද සිදුකෙරෙන අතර සෑම ලිපි ගනුදෙනුවකදීම ඉල්ලුම්කරු වෙත පිටපතක් යොමු කරමින් ඉල්ලුම්කරු දැනුවත් කිරීම සිදුකරනු ලබයි. යොමුකරන ලද සෑම ලිපියකටම ලිඛිතව ප්‍රතිචාර දක්වා ඇති අතර සෘජුවම සිදුකල හැකි මහපෙන්වීම් සහ තාක්ෂණික දැනුවත් කිරීම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ඉල්ලුම්කරු වෙත සිදුකර ඇත.



සටහන **4.3:** දිස්ත්‍රික් අනුව ලිපි යොමු කර ඇති ආකාරය

දිස්ත්‍රික් මට්ටමින් යොමුකර ඇති ලිපි පිළිබඳ සාරාංශය.

අනු අංක	දිස්ත්‍රික්කය	ඉල්ලීම් ලිපි ගණන												
		මාසය												
		1	2	3	4	5	6	7	8	9	10	11	12	එකතුව
1	මාතර	2		4	1	2	2	1	1	2				15
2	කළුතර		1		2	1	1		4			1	1	11
3	ගම්පහ	3					2	5	2	1	1	1	1	16
4	අම්පාර						4	1	1	1	2			9
5	පුත්තලම		1	1	1			1	2	3	1			10
6	හම්බන්තොට		1					1	1	2	1			6
7	කුරුණෑගල						1	1	2	2	1			7
8	නුවරඑළිය	1	2	2		1	2	2	2	1	2	1	1	17
9	මොණරාගල			1									2	3
10	මාතලේ	2	1		2		2		2		6	1		16
11	වව්නියාව					2								2
12	ත්‍රිකුණාමලය				1	1								2
13	පොළොන්නරුව	1	1			1			1					4
14	කෑගල්ල	2	3	3	1	2		3	2	4	5	2	2	29
15	රත්නපුර	1	1			2	3	2	5		2	2	2	20
16	මහනුවර	1	1		1	2	4	6	2	5	4	2	2	30
17	ගාල්ල	1				1	1	2		1		1		7
18	කොළඹ	4	1		1	2	3	3	4	5	4	8	3	38
19	බදුල්ල						1	4	2	1		3		11
20	අනුරාධපුර	2		1				2	3	3	4	1		16
21	යාපනය								1					1
22	කිළිනොච්චිය													0
23	මන්නාරම													0
24	මුලතිව්													0
25	මඩකලපුව	1												1
එකතුව		21	13	12	10	17	26	34	37	31	33	23	14	271

වගුව **4.7:** දිස්ත්‍රික් මට්ටමින් යොමුකර ඇති ලිපි පිළිබඳ සාරාංශය

4.13 අභියෝග

ආපදා කළමනාකරණ විෂයපතය ඉතාමත් පුළුල් ක්ෂේත්‍රයක විහිදයාම සහ ආපදා පුරෝකතනය කිරීමේ හැකියාව ඉක්මවා යමින් ස්වභාවිකව ක්ෂණිකව විවිධ වූ ආපදා සිදුවීමේ සම්භාවිතාවක් පැවතීම තුළ මෙම ක්ෂේත්‍රය තුළ කටයුතු කිරීමේදී විවිධ වූ අභියෝගයන් සඳහා මුහුණපෑමට සිදුවේ.

තාක්ෂණය මඟින් ජයගැනීමට අපහසු ස්වභාවික අභියෝගයන් සමඟ ගැටීමේදී අපේක්ෂිත පරිදි ආපදා ජයගැනීමට අපහසුවන අවස්ථා අතීතය තුළ ඇතිවූ අයුරින්ම අනාගතය තුළද අපේක්ෂා කල යුතුව ඇත. අවමකිරීම් / පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකිරීමේදී ද එවැනි විවිධවූ අභියෝගයන් සඳහා මුහුණ දීමට සිදුව ඇත.

- ආපදා අවම කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීමේදී විවිධ වූ ක්ෂේත්‍රවලට අදාළ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගනු ලබන අතර එම වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට සුදානම් වන අවස්ථාවලදී සහ ක්‍රියාත්මක වෙමින් පවතින අවස්ථාවලදී මතුවන යම් යම් මහජන විරෝධතා හේතුවෙන් අපේක්ෂිත ප්‍රගතිය කරා එළඹීමට අපහසුතා මතුවීම.

- රට තුළ පවතින සාමාන්‍ය වාර්ෂික කාලගුණ සහ දේශගුණ තත්වයන් මත පදනම්ව ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලරාමු සැකසුවද, මෙම ව්‍යාපෘති ආපදා අවදානම් ප්‍රදේශ ආශ්‍රිතව සිදුකෙරෙන බැවින් ඇතිවන අනපේක්ෂිත කාලගුණ තත්වයන් හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේ අපහසුතා ඇතිවීම.

- විවිධ වූ ක්ෂේත්‍ර තුළ අවම කිරීමේ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ඊට අදාළ තාක්ෂණික ආයතන මඟින් ලබාගැනීමේදී සිදුවන ප්‍රමාද දෝශයන්ද ආපදා අවමකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා යම් බලපෑම් සිදුකිරීම.

- ආපදා විෂය විශාල පරාසයක් තුළ විහිදයාම හේතුවෙන් යම් යම් අවම කිරීමේ වැඩසටහන් හඳුනාගෙන ඒ පිළිබඳ කටයුතු සිදුකරගන යාමේදී ඊට අදාළ විවිධ පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීම සඳහා ව්‍යාපෘති සැලසුම් තුළ අපේක්ෂිත කාලරාමු ඉක්මවා යාම.

- හඳුනාගත් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එහි ඵලදායීතාවය තහවුරු කිරීම සඳහා ව්‍යාපෘතිය පිළිබඳ සකාෘතා වාර්තාව සකසන විට හඳුනා නොගත් ආපදා අවදානම් අවමකිරීමේ වැඩසටහන් දාමයක් ක්‍රියාත්මක කිරීමට සිදුවන අවස්ථා ඉස්මතුවීම.

- ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සැලකීමේ දී මෙම වැඩසටහන විවිධ වූ ක්ෂේත්‍ර ගණනාවක විහිදයාම හේතුවෙන් එම එක් එක් ක්ෂේත්‍රයන්හි ඔවුන් විසින් සැලසුම් කර ඇති වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සමඟ මෙම වැඩසටහන ගළපා ගැනීම යම් මට්ටමක අභියෝගාත්මක ඉලක්කයක් වීම.

- දිස්ත්‍රික් ආපදා අවදානම් පැතිකඩ සකස් කිරීමේදී ඒ සඳහා අපේක්ෂා කරන ගුණාත්මක තත්වයෙන් යුතු දත්ත බිම් මට්ටමින් ඒකරාශී කිරීමේ සහ නිවැරදිව, නිවැරදි පෝරම භාවිතා කර පරිගණක ගතකර දිස්ත්‍රික් මට්ටමින් ජාතික මූලස්ථානයට ගෙන්වා ගැනීමට යම් කාලයක් ගතවීම. ප්‍රයෝගික හේතූන් මත අපේක්ෂිත සියලු දත්තයන් සම්පූර්ණ නොවීම හේතුවෙන් එම දත්ත සම්පූර්ණ වනතුරු අවසන් නිමැවුම සම්පූර්ණ කරගැනීමට නොහැකිවීම.

- ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් අවම මානව සහ භෞතික සම්පත් ප්‍රමාණයක් සහිතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කටයුතු කිරීම හේතුවෙන් ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණ / ඇගයුම් කිරීම යන සෑම අවස්ථාවකම විවිධ වූ අභියෝගවලට මුහුණදීමට සිදුවේ.

අභියෝග ජයගනිමින් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහිකිරීම් උදෙසා කටයුතු කිරීම වෙනුවෙන් උපරිම දායකත්වය අවමකිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් සිදුකරනු ලබන අතර පසුගිය වසරවල මෙන්ම ඉදිරි වසර තුළදීත් පවතින සම්පත් උපයෝගී කරගනිමින්, පාර්ශවකරුවන් සමඟ නිසි සම්බන්ධීකරණය තුළින් ආපදා අවදානම් අවමකිරීම සඳහා කටයුතු කිරීම මඟින් දේශයේ මානව, භෞතික සහ මූල්‍ය සම්පත් සුරක්ෂිත කිරීම සඳහා සුදානම්ව සිටින්නෙමු.

5. පෙර සූදානම් හා සැලසුම් අංශය

5.1 හැඳින්වීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත මඟින් නියම කර ඇති පරිදි දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, අවදානමට ලක්ව ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාශ සහ රාජ්‍ය අංශයේ ආයතන ආදිය සඳහා ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙළ කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වේ. ගංවතුර, නායයෑම්, සුනාමි, සුළි සුළං ආදි ශ්‍රී ලංකාව තුළ නිතරම ඇතිවන උවදුරු සඳහා ආපදා පෙර සූදානම් කටයුතු සැලසුම් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සැලසුම් කටයුතුවලින් එකක් වේ.

ආපදාවන් සිදුවන විට එයට ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට සහාය වන කෘත්‍යාත්මක ලේඛණයක් ලෙස ආපදා පෙර සූදානම් සැලැස්ම හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයන් තුළ සිදුවන ආපදා සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරීත්ව ආයතන වන්නේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවයි. කමිටුවේ සාමාජිකත්වය, අනු කමිටු සහ ඔවුන්ගේ කාර්යභාර්යයන් සහ වගකීම් මොනවාද යන්න සැලැස්ම තුළ ලේඛණ ගත කර ඇත. පරිපාලන ප්‍රදේශය පිළිබඳ තොරතුරු, පවතින උවදුරු, අවදානම් තත්ත්වවල ප්‍රතිඵල සහ සිදුකරන ලද අවදානම් තත්ත්ව ඇගයීම්, ප්‍රධාන මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු, ප්‍රදේශය තුළ පවතින මානව හා භෞතික සම්පත් සහ ව්‍යසන ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ගේ වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම්වල අන්තර්ගත වේ.

5.2 දිස්ත්‍රික් මට්ටමේ පෙර සුදානම් සැලසුම්

2018 වර්ෂයට ලැබුණු රු.මි. 25 යොදා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරන ලද අතර එහි මූල්‍ය ප්‍රගතිය 99.73%ක් ලෙසත්, භෞතික ප්‍රගතිය 100%ක් ලෙසත් වාර්තා වී ඇත.

2018 වර්ෂයේදී දිස්ත්‍රික් 25ක ව්‍යසන සඳහා පෙර සූදානම් සැලසුම් කටයුතු නිර්මාණය කිරීම සහ ඒ පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා රු. මිලියන 25ක මුදලක් වෙන් කරන ලදී. රටෙහි ආර්ථික තත්වය සහ ව්‍යසන මඟින් ප්‍රජාවට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන මුදා හරිනු ලැබේ. දිස්ත්‍රික්ක අතර ප්‍රතිපාදන බෙදා හැරීම සිදු කරන ලද ආකාරය සහ එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

වර්ෂය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත වූ ප්‍රතිපාදන	වියදම
2016	**12.50**	**11.11**
2017	**19.8**	**19.5**
2018	**25.0**	**24.93**

වගුව **5.1:** ආපදා පෙර සූදානම් සඳහා පසුගිය වසරවල වෙන් කළ ප්‍රතිපාදන



සටහන **5.1:** ආපදා පෙර සූදානම් සඳහා පසුගිය වසරවල වෙන් කළ ප්‍රතිපාදන

දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ව්‍යසන කළමනාකරණ සක්‍රීයතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලසුම් කටයුතු සඳහා **2018** වර්ෂය තුළදී පෙර සූදානම් සැලසුම් අංශය විසින් ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. ව්‍යසන කළමනාකරණ සැලසුම් මුද්‍රණය කිරීම සහ පිළියෙල කිරීම / සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම්, වැඩමුළු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිපාදන ලබා දී ඇත. සුනාමි, ජලගැලීම් සහ නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම උවදුරු සිතියම්ගත කිරීම, අවදානම් තත්ත්ව විශ්ලේෂණය, ග්‍රාමීය මට්ටමේ ව්‍යසන කළමනාකරණ කමිටු ස්ථාපනය කිරීම වැනි ප්‍රජා මට්ටමේ ව්‍යසන ප්‍රතිචාර වැඩසටහන් පැවැත්වීම, ජලාශ වේලි බිඳී යාමට පූර්වෝපායක් ලෙස, ජලාශ වේලි පහළ බෑවුමේ ජීවත්වන ජනතාව සඳහා හදිසි අවස්ථා තත්ව සඳහා ප්‍රතිචාර දැක්වීමට ප්‍රජා සහභාගීත්වය සහිත පෙර සූදානම් සැලසුම් නිර්මාණය කිරීම හා දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහාද මෙම අංශය විසින් ප්‍රතිපාදන සලසා දෙනු ලැබේ.

5.3 ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා පෙර සූදානම් ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම

ගම්මානවල පවතින විවිධ උවදුරු සැලකිල්ලට ගනිමින් ප්‍රජා ආපදා පෙර සූදානම් ප්‍රතිචාර සැලසුම් ප්‍රාදේශීය මට්ටමින් සකස් කරන ලදී. ප්‍රජා සහභාගිත්වය සහ ප්‍රජා මට්ටමේ ආපදා සිතියම්ගත කිරීම ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන කටයුතු වේ. තවද, ප්‍රජා මට්ටමේ උවදුරු සිතියම් පිළියෙල කිරීම, ආරක්ෂිත මාර්ග හා ආරක්ෂිත ස්ථාන හඳුනා ගැනීම, ප්‍රථමාධාර, අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් සඳහා කඳවුරු ස්ථාපනය කිරීම සහ කඳවුරු කළමනාකරණය කිරීම පිළිබඳවද ඔවුන්හට පුහුණුව ලබා දෙන ලදී. **2018** වර්ෂය තුළ ගම්පහ, කළුතර, නුවරඑළිය, අනුරාධපුර හා

කිළිනොච්චි යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා පෙර සූදානම් ප්‍රතිචාර සැලසුම් **05**ක් සකස් කරන ඇති අතර එහි භෞතික ප්‍රගතිය **100%**කි.

5.4 අන්තර් ජාතික / ජාතික / දිස්ත්‍රික් / ප්‍රාදේශීය මට්ටමේ පෙරහුරු වැඩසටහන්

මෙම වැඩසටහන් යටතේ ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය යන මට්ටම් තුළින් ආපදා කළමනාකරණය හා සෘජුව සම්බන්ධ නිලධාරීන් ප්‍රධාන කොටගෙන ආපදා පෙර අවස්ථාව, ආපදා අවස්ථාව හා ආපදා පසු අවස්ථාවලදී ඔවුන්ගේ කාර්යයභාරය හඳුනා ගනිමින් සිදුකරන පෙරහුරු වැඩසටහනකි.

- අන්තර්ජාතික පෙරහුරු වැඩසටහන්

2018 සැප්තැම්බර් මස **05** වන දිනට යෙදී ඇති අන්තර්ජාතික සුනාමි දැනුවත් කිරීමේ දිනය සැමරුම හා ප්‍රජාව දැනුවත් කිරීම උදෙසා සුනාමි ආපදාවට ලක්වන දිස්ත්‍රික් **14**න් **03**ක් තුළ ගාල්ල, අම්පාර හා මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි අන්තර්ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන් පවත්වන ලද අතර ඉතිරි දිස්ත්‍රික්කයන් තුළ ප්‍රජාව දැනුවත් කිරීම සිදු කරන ලදි. **(රු. 1,888,529.58 (රු.මී. 1.88)** වියදම් වූ අතර ඒ සඳහා දිස්ත්‍රික් **14**හි **8318**ක ජනතාව මෙම පෙරහුරුව සඳහා සහභාගී විය.)

සුනාමි ව්‍යසනය බලපාන දිස්ත්‍රික් **14** කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම, මන්නාරම, යාපනය, කිළිනොච්චි, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර යන දිස්ත්‍රික්වල දිස්ත්‍රික් ලේකම්වරු සුනාමි කුළුණු ස්ථාපනය කරඇති සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරීන් හා ආපදා කළමනාකරණයට සම්බන්ධ සියළුම පාර්ශවකාර ආයතන මේ සඳහා සම්බන්ධ විය. මෙම වැඩසටහන බලපාන ප්‍රදේශවල සිටින සියළුම ජනතාව ජනමාධ්‍ය මඟින්, අත් පත්‍රිකා බෙදා දීම හා බැනර් ප්‍රදර්ශනය කිරීම මඟින් දැනුවත් කිරීම් කරන ලදි. මෙම සුනාමි පෙරහුරු වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා ජාතික හා අන්තර්ජාතික වශයෙන් අධීක්ෂණ නිලධාරීන් සහභාගී විය. අධීක්ෂකයන් ලබාදුන් තොරතුරුවලට අනුව ආපදා සන්නිවේදන කටයුතු නිවැරදිව සකස් ගැනීම සඳහා මෙම පෙරහුරු වැඩසටහන ඉතා වැදගත් බව පැහැදිලි විය.

5.4.1 කලාපීය හා ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන (2018.09.05) (IOWAVE – 2018)

- පෙරහුරු වැඩසටහන පවත්වන ලද දිස්ත්‍රික්කයන්

දිස්ත්‍රික්ක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ග්‍රාම නිලධාරි වසම්
ගාල්ල	හික්කඩුව	**03**
අම්පාර	නින්තවූර්	**06**
මුලතිව්	මාරිටිමේපත්තු	**06**

වගුව **5.2:** පෙරහුරු වැඩසටහන් පවත්වන ලද දිස්ත්‍රික්ක

- **9.3** ක රික්ටර් මාපාංකයන් වාර්තා කරමින් පෙරහුරුව නිර්මාණය කරන ලදී.
- මෙය ප්‍රධාන වශයෙන් ,

1. අමාත්‍යාංශය දැනුවත් කිරීම.
2. දිස්ත්‍රික් ඒකක සාකච්ඡා.
3. පාර්ශවකරුවන් දැනුවත් කිරීම්.
4. Table Top පෙරහුරු.
5. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින්

සුනාමි කුළුණු 77 ක් දිස්ත්‍රික්ක 14 ක පරීක්ෂා කරන ලදී.

- ගාල්ල දිස්ත්‍රික්කයෙන් 332ක් ආරක්ෂිත මධ්‍යස්ථාන වෙත ද, අම්පාර දිස්ත්‍රික්කයෙන් 930ක් ආරක්ෂිත මධ්‍යස්ථාන වෙත ද, මුලතිව් දිස්ත්‍රික්කයෙන් 372ක් ආරක්ෂිත මධ්‍යස්ථාන වෙත ද ඉවත් කරන ලදී. සමස්ත ලෙස මෙම දිස්ත්‍රික් 03හි ග්‍රාම නිලධාරී වසම් 15හි පුද්ගලයින් 4147ක් ඉවත් කරන ලදී.




ගාල්ල දිස්ත්‍රික්කයේ පැවැත් වූ අන්තර්ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන

➢ දිස්ත්‍රික් ආපදා පෙරහුරු වැඩසටහන්

ගංවතුර හා නායයෑම් ආපදාවට ලක්වන දිස්ත්‍රික්කයන්හි පවත්වන ලද ගංවතුර හා නායයෑම් පෙරහුරු වැඩසටහන් සඳහා රු. 5,485,437.40 ලබාදුන් අතර ඒ සඳහා 38266ක පිරිසක් සහභාගී විය.

	දිස්ත්‍රික්කය	වියදම් කළ මුදල (රු.)	සහභාගි වූ පිරිස
1	කළුතර	755,146.40	4600
2	ගාල්ල	471,219.00	3425
3	රත්නපුර	701,545.00	3379
4	බදුල්ල	747,000.00	3643
5	නුවරඑළිය	281,510.00	2420
6	මාතලේ	559,110.00	6200
7	මඩකළපුව	478,046.00	5789
8	වව්නියාව	297,147.00	1033
9	මන්නාරම	110,577.00	1709
10	කෑගල්ල	699,257.00	3318
11	කිළිනොච්චි	384,880.00	2750
		5,485,437.40	38266

වගුව 5.3: දිස්ත්‍රික්කවල පවත්වන ලද පෙරහුරු වැඩසටහන් පිළිබඳ සාරාංශය

ආපදා ප්‍රතිචාර කටයුතුවල යෙදෙන පාර්ශවකරුවන් හඳුනාගැනීම, ආපදා ප්‍රතිචාර කටයුතුවල යෙදෙන පාර්ශවකරුවන්ගේ වගකීම් ඔවුන්ට අවබෝධ කරවීම, ආපදා ප්‍රතිචාර කටයුතුවල යෙදෙන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය තහවුරු කිරීම හා අවබෝධය වැඩිකිරීම, ආපදා ප්‍රතිචාර කටයුතු සඳහා දිස්ත්‍රික් ධාරිතාවයන් හා දුර්වලතා හඳුනාගැනීම, මූලදී සැලසුම් කළ පෙරහුරු සැලැස්ම හා සැලසුම් කළ යාන්ත්‍රණය පරීක්ෂාවට ලක් කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල රාජ්‍ය යාන්ත්‍රණය සහ පළාත් සභා යාන්ත්‍රණය අතර සබඳතාවය හා දේශපාලන මැදිහත්වීම ආපදා ප්‍රතිචාර කටයුතුවල යොමුගත කිරීම, ආවදානම් කලාපවල ජීවත් වන ප්‍රජාවට අවශ්‍ය ආපදා ප්‍රතිචාර කටයුතු කාර්යක්ෂම කිරීම, ආපදා අවදානම් කලාපවල ජීවත් වන ප්‍රජාව හා බාහිර පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය තහවුරු කිරීම, වඩාත් ගුණාත්මක හා කාර්යක්ෂම ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණයක් සියළු පාර්ශවකරුවන් හා ප්‍රජාව අතර තහවුරු කිරීම, සමාජය තුළ ආපදා පෙර සූදානම් සංස්කෘතියක් හා සුරක්ෂිත සංස්කෘතියක් සඳහා ප්‍රජාව හුරු කිරීම.



බදුල්ල දිස්ත්‍රික්කයේ නායයෑම් පෙරහුරු වැඩසටහනේ ඡායාරූප

5.5 ග්‍රාමීය මට්ටමෙන් පවත්වන ලද "ආපදාවට පෙර සුදානම" වැඩසටහන්

2018 වර්ෂය තුළ ගංවතුර හා නායයෑම් ආදී ආපදාවන්ට ලක්වීමේ වැඩි නැඹුරුතාවයක් සහිත දිස්ත්‍රික්කයන් තුළ ග්‍රාම නිලධාරී වසම් ආවරණය කරමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. හම්බන්තොට දිස්ත්‍රික්කයේහි වැඩසටහන් 13ක් ද, කොළඹ දිස්ත්‍රික්කයේහි වැඩසටහන් 20ක් ද සිදු කර ඇත. ඒ සඳහා 2080ක පිරිසක් සහභාගී විය.

5.6 විශාල ජලාශ වේලි ආශ්‍රිත ව්‍යසන සම්බන්ධයෙන් පෙර සුදානම් කටයුතු

සුළි සුළඟක් හෝ භූවලනයක් හෝ සිදුවන අවස්ථාවකදී ජලාශ වේලි ආශ්‍රිතව ආපදා ඇතිවීමට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින්, තෝරාගත් ප්‍රධාන ජලාශ වේලි පාමුල ජීවත්වන ප්‍රජාවන්ගේ පෙර සූදානම් හැකියාව ඉහළ නැංවීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී. 2018 වර්ෂය තුළ වේලි ආශ්‍රිත දැනුවත් කිරීම් හා පෙරහුරු වැඩසටහන් 20ක් හම්බන්තොට, බදුල්ල, අනුරාධපුරය, පොළොන්නරුව, මඩකලපුව, අම්පාර, කිළිනොච්චිය, මහනුවර හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල පවත්වා ඇත. සෝදිසි හා මුදවා ගැනීම්, ප්‍රථමාධාර කඳවුරු කළමනාකරණය සහ ගම්මානවල ආරක්ෂාව යනාදී කටයුතු අනු කමිටු නිර්මාණය කිරීම පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරණ යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම, සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම සහ අවසාන වශයෙන් ආරක්ෂිත ස්ථාන කරා ජනතාව රැගෙන යාම පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මඟින් ජලාශ වේලි පාමුල ජීවත්වන අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම වැඩසටහනට ඇතුළත් විය.

5.7 රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම

ශ්‍රී ලංකාව තුළ දියේ ගිලීම නිසා සිදු වී යයි වාර්තා වන මරණ සංඛ්‍යාව වැඩිවීමේ නැඹුරුතාවයන් පසුගිය වසර කිහිපය තුළ ඇති විය. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ, අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල සංඥා පුවරු පිහිටුවීම සහ එමඟින් අනතුරුදායක පොකුණු ගංඟා සහ වැව් තුළ දිය නෑම සිදු නොකරන ලෙස ජනතාව දැනුවත් කිරීම වේ. මහනුවර, මාතලේ, යාපනය, රත්නපුර, පොළොන්නරුව, ගාල්ල, හම්බන්තොට, කෑගල්ල හා මන්නාරම යන දිස්ත්‍රික්ක තුළ දියේ ගිලීම් සංඥා පුවරු 225ක් ස්ථාපිත කරන ලදි.

දිස්ත්‍රික්කය	සංඥා පුවරු සංඛ්‍යාව
මහනුවර	04
මාතලේ	24
යාපනය	53
රත්නපුර	20
පොළොන්නරුව	25
ගාල්ල	10
හම්බන්තොට	22
කෑගල්ල	34
මන්නාරම	33
මුළු එකතුව	225

වගුව 5.4: එක් එක් දිස්ත්‍රික්ක වල ස්ථාපිත කර ඇති සංඥා පුවරු සංඛ්‍යාවන්

එමෙන්ම අනුරාධපුර හා පොළොන්නරුව ආශ්‍රිත උත්සව කාලයන්හිදී සිදුවන දියේ ගිලීම් අවම කිරීම සඳහා විශේෂ වැඩසටහන් පවත්වන ලදී.

5.8 රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම

රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ රෝහල් සේවක සේවිකාවන්ගේ ආරක්ෂාව, රෝගීන්ගේ ආරක්ෂාව, හදිසි ආපදා අවස්ථාවකදි රෝහල් කරා එන රෝගීන්ට, ඔවුන්ට ප්‍රතිකාර ලබා දීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා සැලසුම් සකස් කිරීම වේ. මෙම වැඩසටහන තුළදි රෝහල තුළ හා අවට ප්‍රදේශවල ස්වභාවික ආපදාවලට ඇතිවන ආපදා හඳුනාගෙන එම තොරතුරු සිතියම් ගතකර ඒ අනුව එම ආපදා අවම කිරීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම , දැනුවත් කිරීම හා පෙරහුරු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු ඇතුළත් සැලැස්මක් වේ. මෙම වැඩසටහන් දිස්ත්‍රික්ක 19ක ක්‍රියාත්මක කර අවසන් කර ඇත.

5.9 පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන්

අධ්‍යාපන අමාත්‍යාංශය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එක්ව ආපදා අවදානම් ඇති පාසල්වල පාසල් ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් 25

තුළ මෙම වැඩසටහන් 93ක් 2018 වසරේදී නිම කරන ලදි. මෙම වැඩසටහන් මඟින් පාසල් ළමුන් හා ගුරුවරුන් සමඟ එම පාසලේ ආපදා අවදානම් සිතියම් සකස් කිරීම, ආපදා පිළිබඳ දැනුවත් කිරීම සහ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මෙහි අරමුණ වේ.

5.10 ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා සමාජ සවිබල ගැන්වීම්, සුභ සාධන හා කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව දිස්ත්‍රික් මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා ආපදා කළමනාකරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ ආරක්ෂිත ස්ථාන හඳුනා ගැනීම හා ආපදා අවදානම් සිතියම් සකස් කර හදිසි ආපදා අවස්ථාවන්හි දී ග්‍රාමීය ජනතාව වෙත දැනුම් දීමේ ක්‍රමවේදයක් සකස් කිරීම කරනු ලැබේ. මේ වන විට දිස්ත්‍රික්ක 19 ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් 168ක් ක්‍රියාත්මක කර අවසන් කර ඇත. මෙම වැඩසටහන සඳහා රු. 6,280,772.49ක මුදල් දිස්ත්‍රික් වෙත ලබාදෙන ලදි.

	දිස්ත්‍රික්කය	වැඩසටහන් ප්‍රමාණය	සහභාගී වූ ප්‍රමාණය
01	ගම්පහ	18	2132
02	කළුතර	12	1337
03	ගාල්ල	10	1803
04	මාතර	12	960
05	හම්බන්තොට	12	790
06	බදුල්ල	11	900
07	කුරුණෑගල	15	2001
08	අනුරාධපුරය	10	1198
09	පොළොන්නරුව	7	453
10	මන්නාරම	5	424
11	පුත්තලම	10	840
12	ත්‍රිකුණාමලය	6	542
13	මඩකලපුව	4	321
14	මොණරාගල	3	120
15	අම්පාර	2	135
16	යාපනය	15	1512
17	කිළිනොච්චිය	4	210
18	වවුනියාව	4	336
19	මුලතිවු	8	507

වගුව 5.5: 2018 වර්ෂය තුළ පවත්වන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රමාණයන් හා සහභාගී වූ ප්‍රමාණයන්

5.11 මෝසම් පෙර සූදානම් වැඩසටහන - ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය

නිරිත දිග මෝසම හා ඊසාන දිග මෝසම බලපාන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරු සමඟ කළ පෙර සූදානම් ක්‍රියාකාරකම් ලෙස පූර්ව අනතුරු ඇඟවීම ක්‍රමවේදය, හදිසි ස්ථානගත කිරීම්, කණ්ඩායම් ස්ථානගත කිරීම හා සහන සේවා කටයුතු හා කඳවුරු කළමනාකරණය පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. ඒ මඟින් සිදුවිය හැකි ජීවිත හා දේපල හානිය අවම කර ගැනීමට බලාපොරොත්තු වේ. ජාතික මට්ටමෙන් කාලගුණික ආයතන ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් අධික වර්ෂාව හා සුළි සුළං පිළිබඳව ද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම් පිළිබඳව ද වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජල ගැලීම් පිළිබඳව ද අනාවැකි හා පුරෝකථනයන් පාදක කර ගනිමින් ජාතික මට්ටමේ පාර්ශවකාර ආයතන සහ ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් ලෙස ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා පවත්වන අතර දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටම දක්වා රාජ්‍ය නිලධාරීන් හා ගොදුරුවන ජනතාව ඊට මුහුණ දී ජීවිත හා දේපලවලට සිදුවන හානිය අවම කර ගැනීමට මේ තුළින් බලාපොරොත්තු වේ.

මෙම වැඩසටහන මඟින් දිවයිනට වාර්ෂිකව බලපාන නිරිත දිග මෝසම් හා ඊසාන දිග මෝසම් කාලවකවානුවලදී දිවයිනට බලපාන අධික වර්ෂාපතනයත්, දැඩි සුළං තත්වයන් පදනම් කරගෙන එයට ගොදුරු වන දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු කැඳවා බලපෑ හැකි තත්වයන් (ගංවතුර, නායයෑම්, සුළි සුළං) සඳහා අදාළ දිස්ත්‍රික්ක සූදානම් කිරීම අරමුණු වේ.

2018 වර්ෂය තුළදී මෝසම් පෙර සූදනම් වැඩසටහන් ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් දිස්ත්‍රික් 25 තුළම වැඩසටහන් 128ක් සිදුකර අවසන් කරන ලදි.



හම්බන්තොට දිස්ත්‍රික්කය



කොළඹ දිස්ත්‍රික්කය

5.12 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2018 – 2030

2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතට අනුකූලව ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම මූලික කොට ගනිමින් අනෙකුත් සියලුම සැලසුම් සකස් කළ යුතු වේ. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ සම්බන්ධ පුළුල් රාමුව නියෝජනය කරන අතර එමඟින් රට තුළ ආපදා අවධානම අවම කිරීම සම්බන්ධ පස් අවුරුදු සැලැස්මකි. ආපදා කළමනාකරණ පනතට අනුකූලව ඉහත සැලසුම පාදක කොට ගනිමින් ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම, ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම හා අනෙකුත් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුවට අනුකූලව සකස් කරන ලද **2018 – 2030** දක්වා වූ ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ පළමු කෙටුම්පත මේ වනවිට නිකුත් කර ඇති අතර එහි පළමු හා දෙවන වෙළුම (ක්‍රියාකාරකම් ලයිස්තුව) සියළුම ආපදා කළමනාකරණය හා සම්බන්ධ හවුල්කාර ආයතන වෙත යෝජනා හා අදහස් සඳහා යොමු කර ඇත.

5.13 උමා ඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතියේ බලපෑමට ලක්වූ ප්‍රදේශ ආශ්‍රිත විශේෂ ආපදා කළමනාකරණ සැලැස්ම (Special Disaster Management Oparation Center (SDMOC – UMA OYA)

- මෙම විශේෂ ඒකකය ස්ථාපනය කරන ලද්දේ අමාත්‍යාංශ ලේකම් විසින් අතිගරු ජනාධිපතිතුමන්ගේ විශේෂ උපදෙස් පරිදි ආපදා කළමනාකරණ කටයුතුවලට පහසුකම් සැපයීම සඳහා ය.

  එහි ප්‍රධාන කාර්යයන් ලෙස,

  1. ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම.
  2. නිරිතදිග මෝසම් සඳහා පෙර සූදානම් වීම හා ඇතිවිය හැකි නායයාම් බලපෑම හඳුනා ගැනීම.
  3. පුහුණු හා දැනුවත් කිරීම් අදාළ පාර්ශව වෙත සිදුකිරීම.
  4. මෝසම් වර්ෂා කාලවලදී ඇතිවන හදිසි ආපදා තත්ත්වයන් සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම.

- මෙම ක්‍රියාන්විතය මාස තුනක් තිස්සේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03ක ක්‍රියාත්මක විය. විශේෂ අරමුණ ලෙස ඇතිවිය හැකි නායයෑම් කළමනාකරණය මින් සිදුවිය. (බණ්ඩාරවෙල ප්‍රා:ලේ: , ඇල්ල ප්‍රා:ලේ: , වැලිමඩ ප්‍රා:ලේ:)
- මෙහි ක්‍රියාත්මකභාවය සිදුවූ අයුරු පහත දැක්වෙන ආකාරයට රූප රාමුවකින් දැක්විය හැක.



D. M. C	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
G. S. M. B	භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය
C. E. B	ජාතික විදුලි බල මණ්ඩලය
N. B. R. O	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

මෙහි දී පීඩාවට පත් ග්‍රා:නි:වසම් 24ක් ලෙස ප්‍රා:ලේ:කොට්ඨාස 03හි හඳුනා ගන්නා ලදී.

- මෙහි දී සිදු වූ ප්‍රධානතම වාසිය ලෙස ක්ෂණිකව ඇතිවන නායයෑම් හා ගංවතුර තත්ත්වයන්ගෙන් මිනිසුන් ඉවත් කිරීමේ හැකියාව ලැබීම හැඳින්විය හැකිය.
- මිලියන 05ක මූල්‍ය ප්‍රතිපාදන මෙම ක්‍රියාන්විතය සඳහා වෙන්කර තිබුණි.
- ප්‍රජාව වෙත පැමිණිලි සටහන් කිරීම සඳහා ආකෘතියක් සහ ආපදා ප්‍රතිචාර සැලැස්මක් ප්‍රජාවට ලබාදීමට හැකියාව ලැබීම මෙහි විශාල වාසියක් වේ.

5.14 පාර්ශවකාර ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කල වැඩසටහන්

5.14.1 දේශගුණික ප්‍රත්‍යාස්ත ඒකාබද්ධ ජල කළමනාකරණ වැඩසටහන (CRIWM)

මෙම ව්‍යාපෘතිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ සිදුකරන ලද අතර එහිදී මල්වතු ඔය, මී ඔය, යාන් ඔය පාදක කරගෙන දේශගුණයට ඔරොත්තු දෙන අයුරින් වියළි කාලගුණික තත්ත්වයක දී වුවද ජලය සැපයිය හැකි අයුරින් ව්‍යාපෘතිය දියත් කරන ලදී. මෙහිදී නියඟය හා ගංවතුර බලපෑම යන ආපදා හඳුනා විසඳුම් සෙවීම අරමුණු කරන ලද අතර ඒ තුළින් අනුරාධපුර, වවුනියා , කුරුණෑගල, පුත්තලම යන දිස්ත්‍රික් ප්‍රතිලාභී දිස්ත්‍රික්ක බවට පත්විය.

ගංඟාව - මල්වතු ඔය				
අංකය	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	එල්ලංගා පද්ධතියේ නම	ග්‍රාම නිලධාරී වසමේ නම
1	අනුරාධපුරය	පළගස්වැව	පළගස්වැව	601 - පළගස්වැව
				603 - හොරිවිල
2	අනුරාධපුරය	ගලෙන්බිඳුණුවැව	සිවලකුළම	182 - සිවලකුළම
				160 - තම්මැන්නාගම
				187 - ඉහළ ගල්කුළම
				181 - මුරියකඩවල
3	වවුනියාව	වෙන්ගලවෙඩ්ඩිකුළම්/ වවුනියාව දකුණ (සිංහල)	මතවුවාල්තකුළම	ඒකකය 9 පවත්කුළම - 211C
				පෙරියපුළියන්කුළම - 211
				Acre 400-209G
				පෙරියඋළුකුළම - 209

4	වවුනියාව	වෙන්ගලවෙඩ්ඩිකුළම්	තුඩ්ඩුවාකයි කුළම	**නෙරියකුළම - 209 B**
		වවුනියාව දකුණ		**සින්න සිප්පිකුළම - 210 A**
	අනුරාධපුරය	මැදවච්චිය		**පෙරියපුළියන්කුළම - 211**
				මුතලියර්කුළම - 210
				මුතලියර්කුළම - 211
				මුතලියර්කුළම - 212
				මරදන්මාඳුව - C 209 c
				පෙරියකුළම - 49
ගංඟාව - මී ඔය				
5	කුරුණෑගල	පොල්පිතිගම	මාමුණුගම	**ඉහළ තිඹිරියාය - 344**
				මාමුණුගම - 345
6	කුරුණෑගල	ඇහැටුවැව	අඟුරුවැල්ල	**හණුගල්ලෑව - 128**
7	පුත්තලම	නවගත්තේගම	මැද්දේ රඹෑව/ රඹෑව	**මහ මැද්දව - 643/1**
				මොරගහවැව - 643
ගංඟාව - යාන් ඔය				
8	අනුරාධපුරය	හොරොව්පොතාන	බණ්ඩාරකුඹුක් වැව	**දියතිත්ත - 151**
				පරන්ගියවාඩිය - 149

වගුව 5.6: තෝරාගත් ග්‍රාම නිලධාරී වසම්වල එල්ලංගා පද්ධති සඳහා ආපදා පෙර සූදානම් හා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම්වලට සූදානම් වීම

5.14.2 පාසල් සුනාමි ආපදා පෙරහුරු වැඩසටහන

2004 දෙසැම්බර් **26** වන දින ඇති වූ සුනාමි ව්‍යවසනයේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් **14**කට බලපෑ අතර ජීවිත **35000**කට හානි විය. එසේම නිවාස, මං මාවත්, හෝටල්, රෝහල්, වරාය, විදුලිය ජල සැපයුමට ආදිය විශාල අලාභ හානි සිදුවිය.

මෙම සුනාමි ව්‍යවසනයේ පාසල් **183**, වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන **18** සහ විශ්වවිද්‍යාල **4**කට බලපෑම් සිදු වී ඇති අතර සහ ශිෂ්‍යයින් **100,000** පමණ බලපෑම් සිදු වී ඇත. පාසල් ආපදා පෙර සූදානම් වැඩසටහන මඟින් බලාපොරොත්තු වන්නේ සුනාමි අනතුරු දැන්වීමක දී පාසල් තුළ විදුහල්පතිතුමා, ගුරුවරු සහ ළමයින්ගේ තීරණ ගැනීමේ දී ඔවුන්ගේ සූදානම් පිළිබඳ පෙරහුරු මඟින් දැනුවත් කිරීම.

මෙමඟින් බලාපොරොත්තු වන්නේ සුනාමි ආපදාවන් සිදුවුවහොත් පාසල් ළමුන්, ගුරුවරුන් ඔවුන් ආරක්ෂිතව ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීමයි.

පාසල් ආපදා පෙර සූදානම් වැඩසටහන් සංවිධානය මඟින් වැඩිපුරම ආපදාවලට බලපාන දිස්ත්‍රික්ක ගාල්ල, යාපනය, අම්පාර සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල පාසල් **05**ක් තෝරාගෙන සිදුකරන ලදී.

- විද්‍යාලෝක විද්‍යාලය - ගාල්ල
- පෙරියකල්ලාර් මධ්‍ය විද්‍යාලය - මඩකලපුව
- මෙතෝදිස්ත කාන්තා මහ විද්‍යාලය - යාපනය
- හාර්සලි විද්‍යාලය - යාපනය
- සහිරා විද්‍යාලය - අම්පාර

6. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

6.1 හැඳින්වීම

2005 අංක **13** දරන ආපදා කළමනාකරණ පනතින් ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායිව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇත. ගෝලීය උණුසුම කාලගුණික හා දේශගුණික විපර්යාසයන්, නාගරීකරණය, ගංහා නිම්න ජනාවාස වීම, අවධිමත් සංවර්ධන කාර්යන් මෙන්ම ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ රටේ මහජනතාවගේ දැනුවත්භාවය අඩු වීමත් එමෙන්ම පවතින නීති රීති හා රෙගුලාසිවලට ජනතාව දක්වන අඩු දායකත්වයත් හේතු කොට ගෙන ආපදාවල තීව්‍රතාව වැඩිවෙමින් පවතින බව ඉතාමත් පැහැදිලි කරුණකි. මෙම තත්වය පසුගිය වර්ෂ කීපය තුළ සිදු වූ ආපදා හා එම ආපදා තත්වයන් සිදු වූ ආකාරය නිරීක්ෂණය කිරීමෙන් තත්වය තව දුරටත් ඉතා පැහැදිලි වනු ඇත.

ඉහත සඳහන් තත්වය ඉදිරියේ අප මුහුණ දී තිබෙන ආපදා හා ආපදා කළමනාකරණ අභියෝග ජය ගැනීමට හෝ ඒ සඳහා ශක්තිමත්ව රටක් ලෙස මුහුණ දීමට ආපදා හා ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ රටේ මහජනතාව හා අදාළ පාර්ශව ඒ සඳහා වූ සිද්ධාන්තමය හා ප්‍රායෝගික දැනුමින් සන්නද්ධ කිරීම වර්තමානයේ වඩාත් ප්‍රමුඛතම කාර්යක් වන්නේය. ආපදා හා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ රටේ මහජනතාව දැනුවත් වීම තුළ ඔවුන්ගේ කුසලතා හා හැකියාවන් වැඩි දියුණු වන අතර එමඟින් ඒ ඒ ප්‍රජාවන්ට මුහුණ දීමට සිදු වන ආපදා අවදානම් අභියෝග සඳහා හොඳින් මුහුණ දීමටත් ඒවා හැකිතාක් දුරට ජයග්‍රහණය කරා මෙහෙය වීමටත් හැකි වනු ඇත. එපමණක් නොව රටේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන්නේ නම් ඒ තුළ ජීවිත හා දේපල විනාශය අවම වනවා පමණක් නොව අප රටේ තිරසාර සංවර්ධන ඉලක්ක පහසුවෙන් ලඟා කර ගැනීමට හැකි වනු ඇත.

ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ අංශය රටේ මහජනතාව ආපදා අවදානම් පිළිබඳ දැනුවත් කිරීම හා පුහුණු කිරීමේ කාර්යභාරය ඉටුකරමින් සිටී. **2018** වර්ෂයේ

ජාතික මට්ටමේ සිට දිස්ත්‍රික් මට්ටම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම හා ග්‍රාමීය මට්ටම දක්වා දිවයිනේ සියළු දිස්ත්‍රික් ආවරණය වන පරිදි ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා පවතින ආපදා අවදානම් තත්වය තේරුම් ගෙන ඒ අනුව පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් ලෙස ක්‍රියාත්මක කරන ලද අතර මෙම වැඩසටහන් සඳහා සහභාගී වූ පිරිස 27171ක් වූ අතර පැවැත්වූ ප්‍රදර්ශනවලට සහභාගී වූ පිරිස දළ වශයෙන් 62450 කි. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයට මහාභාණ්ඩාගාරයෙන් රු. මිලියන 25ක මූල්‍ය ප්‍රතිපාදන ලැබුණි. ජාතික මට්ටමේ වැඩසටහන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැනුවත් කිරීමේ අංශය මඟින් මෙහෙය වූ අතර දිස්ත්‍රික් මට්ටමේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ හා ග්‍රාමීය මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මඟින් ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව 2018 වර්ෂයේ ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය වන රු. මිලියන 25 යොදාගත් අතර එහි මූල්‍ය ප්‍රගතිය 97 %ක් වන අතර භෞතික ප්‍රගතිය 100%ක් ලෙස වාර්තා වී ඇත. 2013-2018 දක්වා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය පහත රූපසටහන මඟින් දැක්වේ.



සටහන 6.1: පුහුණු අංශය සඳහා වෙන්කල මූල්‍ය ප්‍රතිපාදන 2013 - 2018

6.2 ජාතික මට්ටමේ පුහුණු වැඩසටහන්

6.2.1 ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායිව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග සහ ජලසම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කෙරෙන ඒකාබද්ධ දැනුවත් කිරීමේ වැඩසටහන

රටේ ආපදා කළමනාකරණ කාර්යභාරය එක් ආයතනයකට හෝ එක් අමාත්‍යාංශයකට හුදකලාව තනිව සිදු කල නොහැකි කාර්යකි. මෙම කාර්ය සියලුම පාර්ශවකාර ආයතන හා සංවිධාන හා සියලු මහජනතාවගේ දායකත්වයෙන් සංවිධානය වී කල යුතු කාර්යක් වන බැවින් එම සම්බන්ධීකරණ කාර්යභාරයේ ප්‍රධාන නියමුවා වන්නේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයයි. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2017 වර්ෂයේ ආරම්භ කරන ලද එක් වැඩසටහනක් වන ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා සමාජ සවිබල ගැන්වීම් හා සමාජ සුභසාධන අමාත්‍යාංශය එක්ව දිස්ත්‍රික්

මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන 2018 වර්ෂයේද ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව දිස්ත්‍රික් මට්ටමේ තෝරා ගත් ප්‍රධාන නිලධාරීන් පුහුණුකරුවන් ලෙස පුහුණු කර ඔවුන්ගේ මාර්ගයෙන් අනෙකුත් නිලධාරීන් සහ ප්‍රජාව දැනුවත් කිරීම හා පුහුණු කිරීම මෙම වැඩසටහන තුළ ක්‍රියාත්මක කරන ලදි. දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාත්මක කල මෙම වැඩසටහන තුළ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා සමාජ සුභසාධන අමාත්‍යාංශය වැඩසටහනට අදාළ සැළසුම් සකස් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය සිදු කරන ලද අතර දිස්ත්‍රික් මට්ටමේ සිට අමාත්‍යාංශ දෙකෙහි නිලධාරීන්ගේ වගකීමක් ලෙස වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

පුහුණුකරුවන් පුහුණු කිරීමේ මෙම වැඩසටහන යටතේ පුහුණුවට සහභාගී වන සෑම කෙනෙකුටම පුහුණු අත්පොත සහ පුහුණු අත්පොත ඇතුලත් DVD එකක් ලබා දීම ද සිදු කෙරුණි.

විශේෂයෙන් 2018 වර්ෂයේ මෙම වැඩසටහන පහත සඳහන් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලදි. දමිළ භාෂාවෙන් රාජකාරී කටයුතු කරන දිස්ත්‍රික්ක සඳහා පුහුණු මොඩියුල සහ DVD දමිළ භාෂාවට පරිවර්තනය කර ලබා දීම ද සිදු කරන ලදි.

අනු අංකය	දිස්ත්‍රික්කය	සහභාගී වූ සංඛ්‍යාව
01	පොළොන්නරුව දිස්ත්‍රික්කය	55
02	මන්නාරම දිස්ත්‍රික්කය	70
03	කුරුණෑගල දිස්ත්‍රික්කය	96
04	යාපනය දිස්ත්‍රික්කය	97
05	කිළිනොච්චිය දිස්ත්‍රික්කය	74
06	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය	80
07	මුලතිව් දිස්ත්‍රික්කය	47
08	මොණරාගල දිස්ත්‍රික්කය	60
09	අම්පාර දිස්ත්‍රික්කය	88
10	වව්නියා දිස්ත්‍රික්කය	60
11	මඩකළපුව දිස්ත්‍රික්කය	170

වගුව 6.1: 2018 වර්ෂයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන පැවැත්වූ දිස්ත්‍රික්ක





දමිළ මොඩියුලය DVD පටය





යාපනය දිස්ත්‍රික්කයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන





වවුනියාව දිස්ත්‍රික්කයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන





පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන





කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන




මඩකලපුව දිස්ත්‍රික්කයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

6.2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික යොවුන් සේනාංකය එක්ව ක්‍රියාත්මක කෙරෙන ආපදා කළමනාකරණ තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන

ආපදා කළමනාකරණ ක්‍රියාවලියේදී පුහුණු මානව සම්පත අත්‍යාවශ්‍ය අංගයකි. විශේෂයෙන් ආපදා අවස්ථාවලදී හා ආපදාවලින් පසු අවස්ථාවලදී සෙවීම් හා මුදවා ගැනීමේ කාර්යභාරය සඳහා දායක වීම, කඳවුරු වෙත මහජනතාව ඉවත් කිරීම, ආබාධිත පිරිස්, රෝගීන්, වැඩිහිටියන් සහ ගර්භණී මාතාවන් ඇතුළු විශේෂ ආරක්ෂාව සැපිය යුතු පිරිස් ආරක්ෂාකාරීව ඉවත් කිරීම සහ කඳවුරු කළමනාකරණය යනාදී කාර්යන් හීදී ඒ පිළිබඳ පුහුණුව ලැබූ තරුණ පිරිස් වැඩි වශයෙන් අත්‍යාවශ්‍ය වේ.

මේ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා ජාතික යොවුන් සේනාංකය එක්ව ජාතික යොවුන් සේනාංකය යටතේ ක්‍රියාත්මක පුහුණු මධ්‍යස්ථාන 28හි වාර්ෂිකව පුහුණුව ලබන තරුණ තරුණියන් සඳහා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ දින 03ක පුහුණුවක් ලබා දී ඔවුන් රටේ ආපදා කළමනාකරණ කාර්යභාරයට සුවිශේෂී කණ්ඩායමක් ලෙස දිස්ත්‍රික් මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා යොදා ගැනීම අරමුණු කර ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම දින 03හි පුහුණු වැඩසටහනේ අන්තර්ගතය අතර සෙවීම් හා මුදවා ගැනීම, ප්‍රථමාධාර, කඳවුරු කළමනාකරණය, ජනතාව ඉවත් කිරීම ඇතුළු කාර්යන් සම්බන්ධයෙන් ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබා දීම සිදු කෙරේ.

2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පුහුණු වැඩසටහන්

අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන	සහභාගිවූ තරුණ තරුණියන් සංඛ්‍යාව
01	ගම්පහ	තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන (දිවුලපිටිය, අත්තනගල්ල, යක්කල සහ කටුනායක යොවුන් සේනාංක මධ්‍යස්ථාන)	**370**
02	කෑගල්ල	තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන (ගලිගමුව සහ කෑගල්ල යොවුන් සේනාංක මධ්‍යස්ථාන)	**140**
03	මහනුවර	තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන (ගම්පොළ, සෙංකඩගල සහ යටිනුවර යොවුන් සේනාංක මධ්‍යස්ථාන)	**260**
04	නුවරඑළිය	තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන (වලපනේ, හඟුරන්කෙත සහ නුවරඑළිය යොවුන් සේනාංක මධ්‍යස්ථාන)	**195**
05	ගාල්ල	තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන (ගාල්ල, අක්මීමන සහ නෙළුව යොවුන් සේනාංක මධ්‍යස්ථාන)	**150**

06	මාතර	තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන	90
මුළු එකතුව			1205

වගුව 6.2: 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පුහුණු වැඩසටහන්

ගම්පහ දිස්ත්‍රික් තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පුහුණු වැඩසටහන



ගම්පහ දිස්ත්‍රික් තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පුහුණු වැඩසටහන- දිවුලපිටිය

6.2.3 ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ආපදා අවදානම් තත්වය හා වාර්ෂිකව අප මුහුණ දෙන ආපදා තත්වයන් සැළකිල්ලට ගැනීමේදී පාසල් ප්‍රජාවගේ සුරක්ෂිතතාව පිළිබඳ සුවිශේෂි සැළකිල්ලක් දැක්විය යුතුය. විශේෂයෙන් පාසල් සිසුන්, ගුරුවරුන් ඇතුළු කාර්යමණ්ඩල සුරක්ෂිතතාව මෙන්ම එහි භෞතික සම්පත්වල සුරක්ෂිතතාව සඳහා විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව එකාබද්ධ වැඩසටහනක් ලෙස ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් ගුරුවරුන් විධිමත් ලෙස පුහුණු කිරීමේ වැඩසටහනක් 2018 වර්ෂයේ ආරම්භ කරන ලදි.

මෙමඟින් පාසල් මට්ටමින් තෝරා ගත් ගුරුවරුන් හට ආපදා හා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීම සිදු වන අතර එලෙස පුහුණුව ලබන ගුරුවරුන් පාසල් ප්‍රජාව ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කර පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ ක්‍රියාකාරී දායකත්වය සහිතව වැඩසටහන් ඒ ඒ පාසල් තුළ ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහනේ ඉලක්කගත අරමුණ වේ.

අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන	සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව
01	කොළඹ	අධ්‍යාපන කලාප සම්බන්ධීකරණ නිළධාරීන් දැනුවත් කිරීම- මීපේ අධ්‍යාපන නායකත්ව	50

		සංවර්ධන හා කළමනාකරණ පීඨය	
02	ගාල්ල	පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන- කරිටාස් ආයතනය	**105**
03	ගම්පහ	පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන- නිවටඹුව අධ්‍යාපන ආයතනය	**80**
මුළු එකතුව			**235**

වගුව **6.3: 2018** වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන්




අධ්‍යාපන කලාප සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීම - මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය

6.2.4 ආපදා කළමනාකරණය පිළිබඳ මහජනතාව සහ පාසල් සිසුන් ප්‍රදර්ශණ හරහා දැනුවත් කිරීම

ආපදා කළමනාකරණය පිළිබඳ මහජනතාව සහ පාසල් සිසුන් ප්‍රදර්ශණ හරහා ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. ඒ අනුව **2017** වර්ෂයට හා **2018** වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රදර්ශණ කට්ටල **09**ක් සකස් කරන ලද අතර පළාත් **09**ක් ආවරණය වන පරිදි තෝරා ගත් දිස්ත්‍රික් **09**ක් සඳහා අදාළ ප්‍රදර්ශණ භාණ්ඩවල වගකීම කේන්ද්‍රීය දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකකවලට පවරන ලදි. ඒ අනුව මහජනතාව සහ පාසල් සිසුන් ප්‍රදර්ශණ හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් **2018** වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි.

අංකය	වැඩසටහන	දිස්ත්‍රික්කය	සහභාගිවූ සංඛ්‍යාව
01	දිස්ත්‍රික් කළමනාකරණ සහකාරවරුන් සඳහා පැවති වැඩසටහන	දිස්ත්‍රික් **25**	**50**
02	යොවුන් පුරය ප්‍රදර්ශනය	කුරුණෑගල	**1700**
03	අධ්‍යාපනික ප්‍රදර්ශනය	රත්නපුර	**700**
04	සොබා ප්‍රතිරාව ප්‍රදර්ශනය	ගම්පහ	**2000**
05	ලෝක ළමා දින ප්‍රදර්ශනය	කෑගල්ල	**15000**
06	අධ්‍යාපනික ප්‍රදර්ශනය-ඇලෝසියස් විද්‍යාලය	රත්නපුර	**10000**
07	අධ්‍යාපනික ප්‍රදර්ශනය- සුලෙයිමනියා විද්‍යාලය	කෑගල්ල	**8000**
08	**X-Ban** අධ්‍යාපනික ප්‍රදර්ශනය	ගම්පහ	**15000**
09	අධ්‍යාපනික ප්‍රදර්ශනය- කොලොන්නාව බාලිකා විද්‍යාලය	කොළඹ	**2000**
10	අධ්‍යාපනික ප්‍රදර්ශනය- කෑගල්ල බාලිකා විද්‍යාලය	කෑගල්ල	**8000**
මුළු එකතුව			**62450**

වගුව **6.4: 2018** වර්ෂය තුළ මහජනතාව සහ පාසල් සිසුන් ප්‍රදර්ශණ හරහා දැනුවත් කිරීමේ වැඩසටහන්




ප්‍රදර්ශන පැවැත්වීම හා එම ප්‍රදර්ශන භාණ්ඩ පරිහරණය පිළිබඳ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන




කෑගල්ල දිස්ත්‍රික්කයේ පවත්වන ලද අධ්‍යාපන ප්‍රදර්ශන

6.2.5 ආපදා කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ බාලදක්ෂයින් ආපදා කළමනාකරණය පිළිබඳ ස්වේච්ඡා කණ්ඩායමක් ලෙස පුහුණු කිරීමේ ජාතික වැඩසටහන

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ අවුරුදු 18ට වැඩි බාලදක්ෂයින් ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දී ඔවුන් ආපදා කළමනාකරණය පිළිබඳ ස්වෙච්ඡා කණ්ඩායමක් ලෙස පුහුණු කර ඒ ඒ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකවලට අනුයුක්ත කර ඒ අනුව ඒ ඒ දිස්ත්‍රික් තුළ ඇතිවිය හැකි ඕනෑම හදිසි තත්වයකදී රාජ්‍ය තන්ත්‍රයට සහයෝගය ලබා දෙමින් ස්වේච්ඡා කණ්ඩායමක් ලෙස ස්ථාපිත කරමින් ඇතිවිය හැකි ඕනෑම ව්‍යසන තත්වයක් ක්ෂණිකව කළමනාකරණය කල හැකි පරිදි දායකත්වය ලබා ගැනීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. ඒ අනුව මහනුවර ධර්මරාජ විද්‍යාලයේදී සියලුම දිස්ත්‍රික්කයන් නියෝජනය වන පරිදි බාලදක්ෂයින් 400 දෙනෙකු සඳහා පැවති තෙදින ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.




මහනුවර දිස්ත්‍රික්කයේ බාලදක්ෂයින් සඳහා පැවති ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන

6.3 සෙවීම් හා මුදවා ගැනීම් වැඩසටහන

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති වගකීම් අනුව හදිසි අවස්ථාවලදී සෙවීම හා මුදවා ගැනීමේ වගකීම් ඉටු කරනු ලබන්නේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ සිවිල් ආරක්ෂක අංශ මඟිනි.

විශේෂයෙන් ත්‍රිවිධ හමුදාව හා පොලීසිය මෙහිදී ප්‍රධාන කාර්යභාර්ය ඉටු කරනු ලබයි. එබැවින් ආපදා කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් සෙවීම් හා මුදවා ගැනීම් කණ්ඩායම් සතුවිය යුතු බැවින් 2018 වර්ෂයේ ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන සෙවීම් හා මුදවා ගැනීමේ පුහුණු වැඩසටහන් 11ක් සැලසුම් කර පවත්වාගෙන යන ලදි.

ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් බෝට්ටු හා ඔරු අගුල් පරිහරණය පිළිබඳ පුහුණුවක් ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ තෝරා ගත් නිලධාරීන් සඳහා කළුතර නාවික හමුදා අණු බණ්ඩයේ දී පවත්වන ලදී. එම පුහුණුව ත්‍රිවිධ හමුදාව හා පොලීසිය සම්බන්ධ කර ගනිමින් දිස්ත්‍රික්ක 25 නියෝජනය වන පරිදි පුහුණු වැඩසටහන් 8ක් යටතේ පැවැත්වූ අතර එහිදී ප්‍රායෝගික හා සෛද්ධාන්තික දැනුම නිලධාරීන් 184 දෙනෙකු සඳහා ලබා දෙන ලද අතර මාදුරු ඔය විශේෂ බලකා පුහුණු පාසලේ පවත්වන ලද සෙවීමේ හා මුදවා ගැනීම් පුහුණු වැඩසටහන් 03ක් මඟින් නිලධාරීන් 186 දෙනෙකුට ප්‍රායෝගික හා සෛද්ධාන්තික දැනුම ලබා දෙන ලදි.




කළුතර නාවික පුහුණු පාසලේ පවත්වන ලද බෝට්ටු ක්‍රියාකාරී වැඩසටහන




මාදුරු ඔය විශේෂ බලකා පුහුණු පාසලේ පවත්වන ලද සෙවීමේ හා මුදවා ගැනීම් පුහුණු වැඩසටහන

6.4 ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන.

ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ මාධ්‍ය වැඩමුළු දිවයින පුරා ක්‍රියාත්මක කරමින් පවතී. හදිසි ආපදා අවස්ථාවලදී මාධ්‍යවේදීන් මඟින් ජනතාව දැනුවත් කිරීම හා එවැනි අවස්ථාවලදී ඔවුන්ගේ වගකීම්, කාර්යභාර්ය පිළිබඳව මෙම මාධ්‍ය වැඩමුළු මඟින් දැනුවත් කිරීම සිදුකරනු ලබයි. විශේෂයෙන් ආපදා තත්වයක දී මහජනතාවට නිවැරදි හා කඩිනම් තොරතුරු ලබාදීම තුළින් ඔවුන්ගේ ජීවිත හා දේපල ආරක්ෂාකර ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනයේ ඇති වැදගත්කමත් එවැනි

අවස්ථාවලදී මාධ්‍යවේදීන්ගේ දායකත්වය ලබා දිය යුතු ආකරය පිළිබඳවත් මෙම වැඩමුළුවලදී දැනුවත් කිරීම් සිදුකරන ලදී.

2018 වර්ෂයේ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පූර්ණ මෙහෙයවීම යටතේ සිදු කළ අතර, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යන ආයතනවල නිලධාරීන් අදාළ ක්ෂේත්‍ර පිළිබඳව දැනුවත් කිරීම් සිදුකරනු ලබයි. **2018** වර්ෂයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහනේ සංක්ෂිප්ත වැඩසටහන් විස්තරය සහ ඡායාරූප සහ එකතුව පහත දක්වා ඇත.

2018 වර්ෂය තුළ පැවැත්වූ දිස්ත්‍රික් මාධ්‍යවේදී දැනුවත් කිරීමේ වැඩමුළු

දිස්ත්‍රික්කය	සහභාගී ප්‍රාදේශිය මාධ්‍යවේදීන්
ගාල්ල	**70**
මොණරාගල	**34**
මාතලේ	**37**
මහනුවර	**45**
හම්බන්තොට	**27**
වව්නියා	**41**
මුලතිව්	
මන්නාරම	
මඩකලපුව	**23**
කෑගල්ල	**40**
රත්නපුර	**43**
එකතුව	**360**

වගුව **6.5: 2018** වර්ෂය තුළ පැවැත්වූ දිස්ත්‍රික් මාධ්‍යවේදී දැනුවත් කිරීමේ වැඩමුළු




දිස්ත්‍රික් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන- රත්නපුර




දිස්ත්‍රික් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන - මහනුවර

6.5 මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම

පවතින හදිසි ආපදා තත්වයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අදාළ තාක්ෂණික ආයතන සම්බන්ධ කරමින් මධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව 2018 වර්ෂයේ නිරීත දිග මෝසම් වර්ෂාව හේතුවෙන් ඇතිවූ ආපදා තත්වය පිළිබඳව රටේ මහජනතාව දැනුවත් කිරීම, පවතින නියං තත්වය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ආපදා පෙර සුදානම් ක්‍රියාකාරකම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය සාකච්ඡා 2018 වර්ෂය තුළ 10ක් සංවිධානය කරන ලදී.




පවතින ආපදා තත්ව පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම

6.6 අත්පත්‍රිකා සහ දැනුවත් කිරීමේ මුද්‍රණ කටයුතු

අධ්‍යාපනික වශයෙන් වැදගත්, එසේම තාක්ෂණික කරුණු සරළව ඉදිරිපත් කර වඩාත් ආකර්ශණීයව නිර්මාණය කළ අත්පත්‍රිකා තුළින් ජනතාව දැනුවත් කිරීම වඩාත් කාර්යක්ෂම ක්‍රමෝපායකි. ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී විවිධ විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මුද්‍රණය කරනු ලබන අත්පත්‍රිකා බෙදා දීම සිදු කෙරේ. 2018 වර්ෂයේ දැනුවත් කිරීමේ අංශය විසින් පහත දැක්වෙන අත් පත්‍රිකා සිංහල දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කරන ලදී.

අත්පත්‍රිකා	මාධ්‍ය		
	සිංහල	දෙමළ	ඉංග්‍රීසි
නිරීත දිග මෝසම ආපදා පිළිබඳ දැනුවත් කිරීම්	√	√	-
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	√	√	√
භූමිකම්පා සහ සුනාමි	√	√	√
භූමිකම්පා	√	√	-
දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා	√	-	-

වගුව 6.6: ඒ ඒ ආපදා සඳහා සකස් කරන ලද අත්පත්‍රිකා



6.7 දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන

2018 වර්ෂය සඳහා දිස්ත්‍රික්ක 25 තුළ ක්‍රියාත්මක කරන ලද ආපදා අවදානම් කළමනාකරණ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 392ක්, දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් හා ග්‍රාමීය මට්ටමින් දිස්ත්‍රික් ආපදා සම්බන්ධීකරණ ඒකක හරහා සිදු කරන ලදි. ඒ සඳහා රු.මි.6.3ක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කර තිබුණි.

දිස්ත්‍රික්කවල හඳුනාගත් උපද්‍රව සඳහා ආපදා අවදානම් තත්වය තේරුම් ගෙන පහත සඳහන් පරිදි වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදි.

අනු අංක	වැඩසටහනේ නම	වැඩසටහන් ප්‍රමාණය
01	ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක නිලධාරීන් දැනුවත් කිරීම	34
02	රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම	57
03	ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීම	67
04	ධීවර ප්‍රජාව දැනුවත් කිරීම	33
05	කාන්තා සංවිධාන දැනුවත් කිරීම	03
06	අධ්‍යාපන ක්ෂේත්‍රයේ දැනුවත් කිරීම	03
07	ජීවිතාරක්ෂක වැඩසටහන්	22
08	පළාත් පාලන ආයතන නිලධාරීන් දැනුවත් කිරීම	04
09	සෙවීම් හා මුදවා ගැනීමේ කණ්ඩායම් දැනුවත් කිරීම	03
10	ගිනි ආරක්ෂණ වැඩසටහන්	21
11	නියඟය හා ගං වතුර කළමනාකරණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්	02
12	යොවුන් කණ්ඩායම් දැනුවත් කිරීම	01
13	දිස්ත්‍රික් මට්ටමේ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	02

14	ඩෙංගු මර්දන වැඩසටහන්	03
15	වතු ප්‍රජාව නායයෑම් අවධානම් පිළිබඳ දැනුවත් කිරීම	07
16	ප්‍රථමාධාර හා කඳවුරු කළමනාකරණ වැඩසටහන්	70
එකතුව		392

වගුව 6.7: දිස්ත්‍රික්වල හඳුනාගත් ආපදා සඳහා වැඩසටහන් පැවැත්වීම



සටහන 6.2: දිස්ත්‍රික් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වැයකළ මූල්‍ය ප්‍රතිපාදන - 2018



සටහන 6.3: දිස්ත්‍රික් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වැයකළ මූල්‍ය ප්‍රතිපාදන - 2018

2018 වර්ෂය තුළ දිස්ත්‍රික්කවල සිදු කරන ලද ඉහත සඳහන් වැඩසටහන්වලට අදාළ ඡායාරූප කීපයක් දිස්ත්‍රික් මට්ටමින් වෙන වෙනම පහතින් ඉදිරි පත් කර ඇත.



රාජ්‍ය ආයතන නිලධාරීන් සඳහා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන පොළොන්නරුව



යෞවන සමාජ තරුණ/තරුණියන් සඳහා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ තෙදින වැඩමුළුව පොළොන්නරුව



ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ග්‍රාමීය ආපදා කමිටු දැනුවත් කිරීමේ වැඩසටහන - තලාව



ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන - ගාල්ල



කඳවුරු කළමනාකරණ පුහුණු වැඩසටහන



ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ විල්ගමුව ග්‍රාමීය ආපදා කමිටු සාමාජිකයන් සඳහා ප්‍රථමාධාර වැඩසටහන



ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ධීවර ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන නවගත්තේගම



පුත්තලම දිස්ත්‍රික්කයේ තාක්ෂණ නිලධාරීන් ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන



ආපදා අවදානම් කළමනාකරණය පිළබඳ ආරක්ෂක අංශ නිළධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන - 122 බලසේනා මූලස්ථාන වීරවිල



ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන - යාපනය

6.8 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන්

ආපදා අවදානම් කළමනාකරණය රටපුරා කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේලා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා නවීන තාක්ෂණික දැනුම හා ක්ෂේත්‍ර අත්දැකීම් ලබාගැනීම සඳහා රු.මි. 03ක් පුහුණු හා දැනුවත් කිරීමේ අංශය වෙත ලැබී තිබුණි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා සිය රාජකාරී විෂය පථයට සෘජුවම සම්බන්ධ වන පාඨමාලා 20ක් සඳහා ද, 2018 වර්ෂයේ බඳවාගන්නා ලද නවක කළමනාකරණ සහකාර නිලධාරීන් 38 දෙනෙකු සඳහා දෙසති පුහුණු වැඩමුළුවක් සඳහා ද, මූල්‍ය ප්‍රතිපාදන ලබාදුන්නෙමු. එමෙන්ම නිලධාරීන්ගේ පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් නිලධාරීන් දෙදෙනෙකු සඳහා ආපදා තක්සේරුව පිළිබඳ පශ්චාත් උපාධිය හා සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හැදෑරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත.

කාර්යය මණ්ඩලයේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල රාජකාරී කරන කළමනාකරණ සහකාර නිලධාරීන් ඇතුළුව ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා අභිප්‍රේරණ නායකත්ව පුහුණු වැඩසටහන් 02ක් ද, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියලුම රියදුරු හා කාර්යාල කාර්යය සහයක මහතුන් සඳහා දෙදින අභිප්‍රේරණ පුහුණු වැඩසටහනක් ද මාදුරු ඔය යුධ හමුදා විශේෂ බලකා පුහුණු පාසලේදී පවත්වන ලදී.



ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියලුම රියදුරන් සහ කාර්යාල කාර්යය සහයක මහතුන් සඳහා මාදුරු ඔය විශේෂ කාර්යය බලකා පුහුණු පාසලේ පවත්වන ලද දෙදින අභිප්‍රේරණ වැඩසටහන

	පාඨමාලා වර්ගීකරණය	පාඨමාලා ප්‍රමාණය	පාඨමාලා ලබා දුන් නිලධාරීන් ගණන	වියදම (රු.මි.)
01	විෂයානුබද්ධ කෙටිකාලීන පාඨමාලා හා පුහුණු වැඩසටහන් (ගිණුම්/මානව සම්පත්/පරිපාලන)	22	108	1.12
02	පශ්චාත් උපාධි සඳහා මූල්‍ය ප්‍රතිපාදන	02	02	0.31
03	නවක කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා ලබා දුන් අභ්‍යන්තර පුහුණුව	01	28	0.27
04	අභිප්‍රේරණ පුහුණු වැඩසටහන්	03	112	1.30
	මුළු එකතුව	28	250	3.00

වගුව **6.8:** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් වෙත ලබා දුන් ධාරිතා වර්ධන වැඩසටහන්




නවක පත්වීම්ලාභී කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා වූ දෙසති පුහුණු වැඩසටහන




ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ඒකකවල කළමනාකරණ සහකාරවරුන් සඳහා භාණ්ඩ සමීක්ෂණය හා භාණ්ඩ වට්ටෝරු ලේඛන කළමනාකරණය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන




උතුරු නැගෙනහිර පළාත් කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා දමිළ මාධ්‍යයෙන් පවත්වන ලද තොග කළමනාකරණය හා අභිප්‍රේරණ හා නායකත්ව වර්ධනය පිළිබඳ තෙදින පුහුණු වැඩසටහන




ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හා දිස්ත්‍රික් කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා අභිප්‍රේරණ හා නායකත්ව වර්ධනය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන් අදියර දෙකක් යටතේ පවත්වන ලදී.

6.9 ජාතික සුරක්ෂිත දිනය

2004 දෙසැම්බර් මස **26** දින ශ්‍රී ලංකාවට බලපෑ සුනාමි තත්ත්වයෙන් මියගිය ජනතාව සිහිපත් කරවීම පිණිස දීප ව්‍යාප්ත සර්ව ආගමික වැඩසටහන්, ශ්‍රමදාන හා දැනුවත් කිරීම් වැඩසටහන් දෙසැම්බර් **26** වන දින ජාතික සුරක්ෂිත දිනයට හා ඊට සමගාමීව පැවැත්වීමට කටයුතු කරන ලදී. මේ සඳහා රු. මිලියන **01**ක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් **2018** වර්ෂය සඳහා වෙන්කර තිබුණි.

සුනාමි, ගංවතුර, නායයෑම්, දැඩි සුළං වැනි විවිධ වූ ව්‍යසන තත්ත්වයේ හේතුකොටගෙන විපතට පත් හා මියගිය ජනතාව සිහිකරවීම සඳහා දෙසැම්බර් මස **26** වන දිනට යෙදී ඇති ජාතික සුරක්ෂිත දිනයට ජනතාව සම්බන්ධ කරගෙන සර්ව ආගමික වැඩසටහන් සිදු කෙරුණි. එම දිනයට සමගාමීව ආපදා පෙරසූදානම් ශ්‍රමදාන ජනතා සහභාගීත්වයෙන් වැඩසටහන් ද සිදු කෙරිණි.

ජාතික සුරක්ෂිත දින ජාතික වැඩසටහන, සුනාමි ව්‍යසනයෙන් හික්කඩුව පැරැලිය ප්‍රදේශයේ සිදුවූ දුම්රිය අනතුරින් මියගිය පුද්ගලයන් **1700**කට අධික ජනතාවක් සිහිකරමින්, පැරැලිය සුනාමි ස්මාරකය අසලදී ජනතාව, ත්‍රිවිධ හමුදාව ,පොලිසිය හා රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ කරගෙන සිදු කෙරුණි.




ජාතික සුරක්ෂිත දින ජාතික වැඩසටහන - හික්කඩුව පැරැලිය සුනාමි ස්මාරකය අසලදී




ආපදා පෙර සූදානම් ශ්‍රමදාන වැඩසටහන ඔක්වෙල සහ තිස්සමහාරාමය - හම්බන්තොට දිස්ත්‍රික්කය

7. හදිසි මෙහෙයුම් අංශය

7.1 හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (Emergency Operations Centre)

2011 අංක **13** දරන ආපදා කළමනාකරණ පනතට අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති හදිසි මෙහෙයුම් අංශය, පැය **24** පුරා ක්‍රියාත්මක වන අතර ආපදා තත්ත්වයන් වර්ධනය වන ආකාරයත්, ප්‍රතිචාර සිදුකල යුතු මට්ටමත් අඛණ්ඩව තක්සේරු කරයි. ආපදාවේ ප්‍රමාණය උප ජාතික මට්ටමේ නියෝජිත ආයතනවලට පාලනය කිරීමට හැකි සීමාවෙන් ඔබ්බට ගිය විට, ජාතික මට්ටමේ හදිසි මෙහෙයුම් අංශය, හදිසි ප්‍රතිචාර කමිටුව සමඟ සම්බන්ධීකරණය වී සෙවීම්, බේරාගැනීම් සහ අවදානමේ සිටින ප්‍රජාවන් ඉවත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරනු ලබයි.

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ “සූදානම්ව සිටීමේ තත්ත්වය” අඛණ්ඩව පවත්වාගැනීම සහ හදිසි ඇමතුම් මධ්‍යස්ථානය **117** සමඟ පැය **24** පුරා කටයුතු කිරීම සඳහා අවශ්‍ය සම්පත් වැඩි කිරීම මඟින් හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ කාර්යය තත්ත්වය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ලබා දී තිබේ.

එමෙන්ම ආපදාවෙන් වන බලපෑම තක්සේරු කර ඒ අනුව සිදුවිය හැකි ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය පිළිබඳ තීරණ ගැනීමත්, එමඟින් ඉදිරියේදී මුහුණදීමට සිදුවන ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමට කටයුතු සැලසුම් කර විවිධ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේද භාවිතා කරමින් ඒ ඔස්සේ කටයුතු කිරීමත් හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි.




පැය **24 x 7** හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය

7.2 ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීම

ශ්‍රී ලංකාව තුළ සිදුවන බහුවිධ ආපදාවන්ට නිරන්තර ප්‍රතිචාර දැක්වීමේ සම්බන්ධීකරණය හදිසි මෙහෙයුම් අංශය මඟින් සිදු කරයි. ආපදාවෙන් වන බලපෑම තක්සේරු කර ඒ අනුව සිදුවිය හැකි ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය පිළිබඳ තීරණ ගනිමින් නිරන්තර ප්‍රජාව දැනුවත් කිරීම සිදු කර ඇත.

2018 වසරේ ජනවාරි මස **01** වන දින සිට දෙසැම්බර් **31** වන දින දක්වා දිවයින තුළ සිදුවූ පහත සඳහන් ප්‍රබල ආපදාවන්ට මෙන්ම සුළු ආපදා සිද්ධීන් සඳහාද ප්‍රතිචාර දැක්වීම හදිසි මෙහෙයුම් අංශය විසින් සිදු කරන ලදී.

තාක්ෂණික ආයතනයන් විසින් ලබා දෙනු ලැබූ නිවේදන පදනම් කරමින් විවිධ වූ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේදයන් හරහා ප්‍රජාව දැනුවත් කර ආපදාවන්ගෙන් සිදුවන හානි අවම කර ගැනීමට පැය **24 x 7** පුරා හදිසි මෙහෙයුම් අංශය කටයුතු කරන ලදී.

පසුගිය කාල පරිච්ඡේදය තුළදී සිදුවූ නිරිත දිග මෝසම් හා ඊසාන දිග මෝසම් සුළං සක්‍රීයවීම නිසා ඇතිවූ ආපදා තත්ත්වයන්ට මෙන්ම පහත සඳහන් ප්‍රබල සුළං අවස්ථාවලදී ද ඒ ඔස්සේ කටයුතු කරමින් ආපදා අවදානම අවම කිරීමට කටයුතු සිදු කරන ලදී.

එමෙන්ම **2019** වර්ෂයේදී සක්‍රීය විය හැකි නිරිත දිග හා ඊසාන දිග මෝසම් සුළං තත්ත්වයට ප්‍රතිචාර දැක්වීමටත් හදිසි මෙහෙයුම් අංශය පෙර සූදානම් සකස් කරමින් සිටියි.

2018 වර්ෂයේදී ජනවාරි සිට දෙසැම්බර් කාල පරාසය තුළදී දිවයිනට බලපෑ ප්‍රධාන හා සුළු ආපදා තත්ත්වයන් පහත පරිදි දක්වා ඇත.

ආපදාව	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වාර්තා වූ ආපදා සංඛ්‍යාව	තුවාල වීම්	මරණ	අතුරුදන් වීම්	නිවාස හානි (පූර්ණ)	නිවාස හානි (අර්ධ)	බලපෑමට ලක් වූ පුද්ගල සංඛ්‍යාව
රිය අනතුරු	**78**	**97**	**75**	**0**	**0**	**0**	**176**
සත්ත්ව ප්‍රහාර	**25**	**23**	**15**	**0**	**0**	**9**	**89**
බෝට්ටු පෙරලීම්	**5**	**4**	**7**	**7**	**0**	**0**	**20**
රසායනික ද්‍රව්‍ය මඟින් වූ අනතුරු	**1**	**19**	**5**	**0**	**0**	**0**	**0**
ගොඩනැගිලි කඩා වැටීම්	**2**	**4**	**14**	**0**	**0**	**0**	**0**
කණ්ඩි කඩා වැටීම්	**128**	**12**	**1**	**0**	**28**	**709**	**4618**
සුළි සුළං	**16**	**0**	**0**	**0**	**89**	**978**	**5626**
නියඟය	**127**	**0**	**0**	**0**	**0**	**0**	**925947**
දියේ ගිලීම්	**44**	**1**	**58**	**1**	**0**	**0**	**69**
විදුලිසැර වැදීම්	**3**	**1**	**3**	**0**	**0**	**0**	**1**
ගිනි ගැනීම්	**79**	**5**	**2**	**0**	**56**	**31**	**444**
ගංවතුර	**374**	**26**	**36**	**1**	**1008**	**12738**	**475240**
නායයෑම්	**148**	**18**	**2**	**0**	**38**	**806**	**6864**
අකුණු අනතුරු	**125**	**18**	**18**	**0**	**6**	**199**	**1109**
ගල් පෙරලීම්	**29**	**3**	**0**	**0**	**0**	**40**	**572**

තද සුළං	703	65	14	15	200	7340	30654
ගිලාබැසීම	1	0	0	0	0	1	3
ගස් කඩා වැටීම්	18	0	1	0	1	34	123
බිත්ති කඩා වැටීම	10	1	0	0	0	12	63
මුළු සංඛ්‍යාව	1788	250	285	24	1398	22188	1447000

වගුව **7.1: 2018** වර්ෂයේදී ජනවාරි සිට දෙසැම්බර් කාල පරාසය තුළදී දිවයිනට බලපෑ ප්‍රධාන හා සුළු ආපදා තත්වයන්
මූලාශ්‍රය : www.desinventar.lk

විශේෂ සිදුවීම් පහත පරිදි දක්වා ඇත.

ආපදාව	දිනය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශය	පීඩාවට පත්		මරණ සංඛ්‍යාව	තුවාල සිදු වූ පුද්ගලයන් සංඛ්‍යාව	හානි වූ නිවාස සංඛ්‍යාව		වෙනත්
				පවුල් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව			පූර්ණ හානි	අර්ධ හානි	
තද සුළං	**2018.01.13**	ගම්පහ	දිවුලපිටිය හා අත්තනගල්ල	**671**	**3025**			**208**	**463**	
	2018.06.09	කුරුණෑගල	*මාස්පොත, උඩුබද්දාව, වාරියපොළ, ගනේවත්ත, අලව්ව, කොබෙයිගනේ*	**263**	**842**			**05**	**258**	
	2018.06.19	කුරුණෑගල	*පඩුවස්නුවර බටහිර සහ කුලියාපිටිය බටහි*	**81**	**275**				**81**	
	2018.07.11	කොළඹ	හෝමාගම, කැස්බෑව, මොරටුව, පාදුක්ක, රත්මලාන සහ දෙහිවල	**263**	**849**				**262**	
	2018.08.02	අම්පාර	අම්පාර සහ සමන්තුරේ	**263**	**1085**			**13**	**248**	
	2018.08.15	කුරුණෑගල	පොල්ගහවෙල, අලව්ව, වීරඹුගෙදර, මාසේපාක, නාරම්මල, කුරුණෑගල, පඩුවස්නුවර නැගෙනහිර, කුලියාපිටිය නැගෙනහිර, පඩුවස්නුවර බටහිර සහ කුලියාපිටිය බටහිර	**279**	**1054**			**10**	**269**	
	2018.10.01	පුත්තලම	මහකුඹුක්කඩවල, පල්ලම, නවගත්තේන, කරුවලගස්වැව,	**623**	**2258**			**01**	**6154**	

			ආරච්චිකට්ටුව, හලාවත							
ගොඩනැගිලි කඩා වැටීම්	**2018.02.14**	කොළඹ	ගෑන්ඩ්පාස්			**07**	**02**			
නිරිත දිග මෝසම සක්‍රිය වීම නිසා ඇතිවූ ගංවතුර හා නායයෑම්	**2018.05.20**	කළුතර, මාතර, රත්නපුර, ගාල්ල, කෑගල්ල, ගම්පහ, හම්බන්තොට කොළඹ, මාතලේ, මහනුවර, වවුනියාව, මුලතිව්, ත්‍රිකුණාමලය නුවරඑළිය, පුත්තලම , මඩකලපුව, බදුල්ල, කුරුණෑගල, මොණරාගල, පොළොන්නරුව සහ යාපනය		**44974**	**171687**	**24**	**13**	**121**	**5205**	පවුල් **19519** ක පුද්ගලයින් **75013** දෙනෙකු ආරක්ෂිත ස්ථාන **339** සඳහා යොමු කිරීමට කටයුතු කරන ලදී.
වර්ෂාව නිසා හටගත් ගංවතුර, තද සුළං, අකුණු හා නායයෑම්	**2018.10.03**	කළුතර, ගාල්ල, කොළඹ, කෑගල්ල, නුවර, පුත්තලම, නුවරඑළිය, ගම්පහ, කුරුණෑගල, අනුරාධපුර, රත්නපුර, මන්නාරම, මාතර, බදුල්ල, මාතලේ, මොණරාගල		**18840**	**75689**	**12**	**18**	**50**	**2653**	
	2018.12.21 & 22	කිලිනොච්චි, මුලතිව්		**111079**	**35599**			**474**	**4522**	

වගුව **7.2: 2018** වර්ෂයේදී සිදු වූ විශේෂ සිදුවීම්

මෙම සියළු ආපදා අවස්ථාවන්හිදී හදිසි ප්‍රතිචාර දැක්වීමේ කටයුතු සඳහා නිරන්තර හදිසි මෙහෙයුම් මැදිරිය ක්‍රියාත්මක වූ අතර විශේෂයෙන් නිරිතදිග මෝසම් තත්ත්වය හා ඊසාන දිග මෝසම් තත්ත්වය සක්‍රීයවීම නිසා ඇතිවූ ආපදා අවස්ථාවේදී අදාළ තාක්ෂණික ආයතන කැඳවා මෝසම් තත්ත්වයට ඇති සූදානම සහ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර, කාලගුණ නිල නිවේදනයට අනුව බලපෑමට ලක් විය හැකි දිස්ත්‍රික්ක බහුවිධ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේද හරහා දැනුවත් කිරීම සිදු කරන ලදී. තවද, ඒ සඳහා ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ සිවිල් ආරක්ෂක බලකාය සම්බන්ධීකරණය කොට අදාළ දිස්ත්‍රික් වෙත ඔවුන් කල්වේලා ඇතිව ස්ථානගත කොට ආපදාවන්ගෙන් සිදුවිය හැකි හානි අවම කිරීමට කටයුතු

කරන ලදී. ඒ අනුව පෙර වසරවලට වඩා ආපදා හානි ඉතා විශාල ප්‍රමාණයකින් අවම කර ගැනීමට මෙහිදී හැකි විය.



2018.01.13 වන දින ගම්පහ දිස්ත්‍රික්කයේ ඇතිවූ තද සුළං තත්ත්වය



2018.02.14 වන දින කොළඹ දිස්ත්‍රික්කයේ ගොඩගැනිල්ලක් කඩා වැටීමේ අවස්ථාව



2018.05.20 වන දින නිරිත දිග මෝසම සක්‍රීයවීම නිසා ඇතිවූ ගංවතුර හා නායයෑම්



2018.06.09 හා **19** වන දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇතිවූ තද සුළං



2018.10.03 වන දින වර්ෂාව නිසා හටගත් ගංවතුර, තද සුළං, අකුණු හා නායයෑම් තත්ත්වය



2018.12.21 හා 22 වන දින කිලිනොච්චි, මුලතිව් වර්ෂාව නිසා හටගත් ගංවතුර, තද සුළං, අකුණු හා නායයෑම් තත්ත්වය

❖ **කැලෑ / අනෙකුත් ගිනි**

2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව තුළ පහත සඳහන් පරිදි සියළුම ගිනි ගැනීමේ සිද්ධි වාර්තා වූ අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතු කාර්යක්ෂම සන්නිවේදන ජාලය උපයෝගී කොට ගෙන කඩිනමින් පොලිසියේ, ගුවන් හමුදාවේ සහ යුධ හමුදාවේ සහාය ලබා ගනිමින් බොහෝ ගිනි නිවාරණ කටයුතු සිදු කරන ලදී.

දිස්ත්‍රික්කය		ආපදා සිද්ධීන් සංඛ්‍යාව	බලපෑමට ලක්වූ ප්‍රා.ලේ. කො. සංඛ්‍යාව
01	කොළඹ	17	13
02	කෑගල්ල	05	05
03	රත්නපුර	06	05
04	නුවරඑළිය	07	03
05	කුරුණෑගල	10	06
06	මොණරාගල	25	08
07	මහනුවර	11	04
08	පුත්තලම	03	02
09	බදුල්ල	15	07
10	කළුතර	02	02
11	මාතලේ	13	07
12	ගම්පහ	03	03
13	මන්නාරම	01	01
14	ගාල්ල	10	08
15	යාපනය	01	01
16	මාතර	04	03
17	මඩකලපුව	06	05
18	අනුරාධපුර	06	03

19	මුලතිව්	02	02
20	පොළොන්නරුව	02	02
21	අම්පාර	01	01
22	හම්බන්තොට	10	04

වගුව 7.3: 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව තුළ සිදුවූ සියළුම ගිනි ගැනීමේ සිද්ධි
මූලාශ්‍රය : ආ.ක.ම හදිසි මෙහෙයුම් ඒකකය

7.3 ගංවතුර සහ අනෙකුත් ව්‍යසන පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම

ශ්‍රී ලංකාව තුළ නිරන්තර සිදුවන ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය වන ප්‍රතිචාර දැක්වීමේ උපකරණ මිලදී ගෙන පීඩාවට පත්වන දිස්ත්‍රික් සඳහා බෙදාදීමේ කාර්යයද හදිසි මෙහෙයුම් අංශය විසින් සිදු කරයි. දිස්ත්‍රික් මට්ටමින් ඉල්ලුම් කරන ලද අවශ්‍යතාවයන් සහ පසුගිය ආපදා අවස්ථාවන්වලදී මුහුණුදුන් ගැටළු මෙන්ම අත්දැකීම් පාදක කරගෙන මෙම මිලදී ගැනීමේ කටයුතු සිදු කරයි. ඒ අනුව වසරින් වසර විවිධ භාණ්ඩ මිලදී ගනිමින් ප්‍රතිචාර දැක්වීමේ කටයුතු සඳහා දිස්ත්‍රික් වෙත බෙදා දීම සිදු කරන ලදී.



2018 ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ප්‍රතිචාර දැක්වීමේ කටයුතු සඳහා 2017 වසරේදී මිලදී ගැනීමට කටයුතු කරන ලද බෝට්ටු 124ක් සහ අඟුල් 100ක් ත්‍රිවිධ හමුදාව සඳහා බෙදා දෙන ලදී.

එමෙන්ම, 2018 වසරේදී මිලදී ගනු ලැබූ අඟුල් 80කින් 77ක් කොළඹ, ගම්පහ,රත්නපුර, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට,මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්ක වෙත හා පොලිස් නාවික කොට්ඨාශය වෙත බෙදා දීමට කටයුතු කරන ලද අතර බෝට්ටු එන්ජින් 33ක් ත්‍රිවිධ හමුදාව හා පොලිසිය වෙත බෙදා දීමට කටයුතු කරන ලදී. තවද, මිලදී ගනු ලැබූ දම්වැල් කියත් 49ක් කුරුණෑගල දිස්ත්‍රික්කය හැර අනෙකුත් දිස්ත්‍රික්කයන් 24 වෙත බෙදා දීමට කටයුතු කරන ලදී.

තවද, 2018 වසරේදී බෙදා හැරීම සඳහා බෝට්ටු 90ක්, අඟුල් 200ක්, බෝට්ටු එන්ජින් 75ක්, දම්වැල් කියත් 85ක්, ජීවිත ආරක්ෂක කඹ (මීටර් 200) 75ක්, අත් පොරෝ 100ක්, ගැල්වනයිස් හැඩලය සමඟ මානා කැති 1000ක්, රබර් බෝට්ටු 10ක් මිලදී ගැනීම සඳහා කටයුතු සිදු කරන ලදී.

7.4 සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ ආපදා කළමනාකරණ නේවාසික පුහුණු පාඨමාලාව

- 2017 වසරේදී සෙවීම් සහ මුදවාගැනීම පිළිබඳ පාඨමාලාව හදාරන ලද ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 194 සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් 21 සඳහා සහතික පත්‍ර ප්‍රධානය ගරු අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී. ආපදා ප්‍රතිචාර

දැක්වීමේ කටයුතු සඳහා ලක්ෂයක ස්වේච්ඡා සාමාජික සංඛ්‍යාවක් දිවයින පුරා ආපදාවන් අනුව ඉදිරියේදී පුහුණු කොට සූදානම් කර තබන බැව් එහිදී අමාත්‍යතුමා ප්‍රකාශ කරන ලදී.




ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සහතික ප්‍රදානය කිරීමේ උත්සවය

- ලෝක සෞඛ්‍ය සංවිධානයේ තාක්ෂණික සහාය ඇතිව යුද්ධ හමුදා, ගුවන් හමුදා, නාවික හමුදා, පොලීසිය, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සාමාජිකයින් **138**ක් සඳහා මාදුරුඔය යුද්ධ හමුදා විශේෂ බලකා, කුඩාඔය කොමාන්ඩෝ හා කටුකුරුන්ද පොලිස් විශේෂ කාර්යය බලකා පුහුණු පාසල්වලදී සෙවීම් සහ මුදවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ දින **10** ක පුහුණු පාඨමාලා අවසන් කර ඇත.





කුඩාඔය සහ කටුකුරුන්ද පුහුණු කටයුතු සිදු කරමින්

- බාලදක්ෂයින් **600**ක් ස්වේච්ඡා හදිසි ප්‍රතිචාර දක්වන්නන් ලෙස පුහුණු කිරීම සිදු කරන ලදී. මෙහිදී හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සම්පත් දායකත්වය, සංවිධානය කිරීම සහ අනෙකුත් ප්‍රායෝගික වැඩ සටහන් සුදානම් කිරීම සිදු කරන ලදී.







බාලදක්ෂයින් ස්වේච්ඡා හදිසි ප්‍රතිචාර දක්වන්නන් ලෙස පුහුණු කිරීම සිදු කරමින්

- ලෝක සෞඛ්‍ය සංවිධානයේ තාක්ෂණික සහාය ඇතිව යුද්ධ හමුදා, ගුවන් හමුදා, නාවික හමුදා, පොලීසිය, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සාමාජිකයින් **177**ක් සඳහා මාදුරුඔය යුද්ධ හමුදා විශේෂ බලකා පාසලේදී සෙවීම් සහ මුදවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ දින **12**ක පුහුණු පාඨමාලා **03**ක් පැවැත්වීම.





මාදුරුඔය යුද්ධ හමුදා විශේෂ බලකා පාසලේදී පුහුණු කටයුතු සිදු කරමින්

7.5 හදිසි අවස්ථාවන්හිදී මාධ්‍ය සම්බන්ධීකරණ

ආපදා අවස්ථාවන්හිදී පැය **24** පුරාම සියළුම මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය භාවිතා කරමින් පූර්ව දැනුම්දීම් සිදුකිරීමින් ජනතාව දැනුවත් කිරීමේ කටයුතු නිරන්තර සිදු කරනු ලබයි. තවද, **2018** වසරේදී ඇතිවූ හදිසි ආපදා අවස්ථාවන්වලදී නියමිත වේලාවට පූර්ව දැනුම්දීම් මාධ්‍ය මඟින් නිකුත් කරන ලදී.

තවද, මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමේ කටයුතු සහ තොරතුරු ලබාදීමේ කටයුතු සිදු කරන ලද අතර එය ජාතික සහ ජාත්‍යන්තර මාධ්‍යයන් සඳහාද ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ නිරන්තරයෙන්ම ජනතාව දැනුවත් කරන ලදී.

7.6 හදිසි අවස්ථාවන්හිදී ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ "සූදානම්ව සිටීමේ තත්ත්වය" අඛණ්ඩව පවත්වාගැනීමට සහ පැය **24** හදිසි මෙහෙයුම් කාර්යය තත්ත්වය වර්ධනය කිරීම සඳහා **2018** වර්ෂය තුළදී හදිසි ආපදා කළමනාකරණ කටයුතු සඳහා ත්‍රිවිධ හමුදාව විසින් නිරන්තර දායකත්වයක් දක්වන ලදී.

2018 වසර තුළදී ශ්‍රී ලංකාව තුළ සිදුවූ විවිධ ආපදා තත්ත්වයන් සඳහා සෙවීම් සහ මුදවා ගැනීම, සහන සේවා කටයුතු සහ හදිසි ප්‍රතිචාර දැක්වීමේ කාර්යය සඳහා ත්‍රිවිධ හමුදාව අඛණ්ඩ දායකත්වයක් ලබාදී ඇත. ඒ අනුව යුද්ධ හමුදාව විසින් අවස්ථා **82**ක නාවික හමුදාව විසින් අවස්ථා **52**ක ගුවන් හමුදාව විසින් අවස්ථා **28**ක රටතුළ සිදුවූ ආපදා තත්ත්වයන් සඳහා ප්‍රතිචාර දැක්වීමට සහ මෙහෙයුම් සඳහා පැය **24** පුරා සක්‍රීය දායකත්වයක් ලබාදී ඇත.

2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලය තුළදී සිදුවූ ආපදාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමට යොදවන ලද ත්‍රිවිධ හමුදා සාමාජිකයන් පිළිබඳව හදිසි මෙහෙයුම් මැදිරියට වාර්තා වූ විස්තර පහත පරිදි වේ. තවද, මීට අමතරව දිස්ත්‍රික් මට්ටමින් විවිධ ආපදා අවස්ථාවන්වලදී ප්‍රතිචාර දැක්වීමේ කටයුතු සඳහා ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සහ උපකරණ සහාය දක්වා ඇත.

මාසය	යුධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	සිවිල් ආරක්ෂක බලකාය	පොලිසිය
ජනවාරි	**60**				
පෙබරවාරි	**120**		**15**		

මාර්තු	120				
අප්‍රේල්	90	12	12		
මැයි	2560	288	12	389	210
ජූනි	1588	180	10		
ජූලි	1450	90			
අගෝස්තු	270	30	13		
සැප්තැම්බර්	360	18			
ඔක්තෝබර්	1080	62			
නොවැම්බර්	760	200	15		
දෙසැම්බර්	1190	250			
එකතුව	9648	1130	77	389	210

වගුව **7.4: 2018** ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලය තුළදී සිදුවූ ආපදාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමට යොදවන ලද ත්‍රිවිධ හමුදා සාමාජිකයන් පිළිබඳව හදිසි මෙහෙයුම් මැදිරියට වාර්තා වූ විස්තර

7.7 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (ජා.හ.මෙ.සැ.)

ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම මඟින් රට තුළ ව්‍යසන ඇති විය හැකි අවස්ථා පැහැදිලි කරනු ලබන අතර ශ්‍රී ලංකාව තුළ සිදුවන කාළගුණ, ජල, ජීව විද්‍යාත්මක, තාක්ෂණික හා මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යසන සඳහා ප්‍රතිචාර යාන්ත්‍රණයන් එමඟින් ආවරණය කරනු ලැබේ. කිසියම් ආයතනයක ශක්‍යතාවය සහ නිත්‍ය වගකීම ඉක්මවා යන ආකාරයේ හදිසි අවස්ථාවකදී ආයතන හා පුද්ගලයින් වෙත වගකීම් පවරාදීම සඳහා පහසුකම් සැලසීම, පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය සක්‍රිය කිරීම සහ හදිසි අවශ්‍යතා මෙහෙයුම් සම්බන්ධීකරණය සහ ආයතනික වගකීම් හා කාර්ය භාරය, විස්තර කර ඇත. භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලද ජා.හ.මෙ.සැ. සඳහා, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය **2017** අගෝස්තු **22** වන දින අංක අමප**/17/2130/715/032** දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ලබාදී ඇතත් එහි සංශෝධනයන් සිදු කිරීම නැවතත් සිදු කරමින් පවතී.

7.8 තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන/ අනෙකුත් සන්නිවේදන

දිවයින වටා පිහිටි පූර්ව දැනුවත් කිරීමේ සුනාමි කුළුණු පද්ධතිය ගිවිසුම් ප්‍රකාරව යාවත්කාලීන කර නඩත්තු කරමින් පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදී. එසේම **HF / VHF** ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට කටයුතු කරමින් ඇත. තවද, හදිසි ආපදා තත්වයකදී විකල්ප සන්නිවේදන මාර්ගයක් ලෙස දිස්ත්‍රික් ඒකක වෙත නවීන පහසුකම්වලින් යුත් **CDMA 4G LTE** දුරකථන ලබාදීමට කටයුතු කරන ලද අතර **CDMA** දුරකථන **350**ක් ආපදා බහුල දිස්ත්‍රික් ඒකක වෙත ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මඟින් ලබාදීමට කටයුතු කරන ලදී. තවද, හදිසි මෙහෙයුම් මැදිරියේ කාර්යයක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා විද්‍යුත් ෆැක්ස් ක්‍රමවේදය හදිසි මෙහෙයුම්

මැදිරිය තුළ ස්ථානගත කරන ලදී. තවද, 117 ඇමතුම් මැදිරිය මහජනතාවට වඩාත් සමීප කරවීම සමගාමීව "2117117" ලෙස සැමට සමීප දුරකථනයක් ලෙස දිස්ත්‍රික් ඒකක සඳහා දිස්ත්‍රික් ප්‍රාදේශීය අංකයන් පමණක් වෙනස් වන එක් දුරකථන අංකයක් සෑම දිස්ත්‍රික් ඒකකයක් සඳහාම නව සන්නිවේදන ක්‍රමවේදයක් ලෙස ස්ථාපිත කරවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

එමෙන්ම හදිසි ආපදා තත්ත්වයකදී මෙන්ම ඕනෑම අවස්ථාවකදී කෙටි පණිවිඩ මාර්ගයෙන් මහජනතාව සහ අනෙකුත් තාක්ෂණික ආයතන දැනුවත් කිරීමට යොදා ගන්නා DEWN පද්ධතිය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව සියළුම ජාල සේවා සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. එමෙන්ම ආපදා සිතියම්ගතකරණය වෙනුවෙන් සහ තත්ත්ව වාර්තා වෙනුවෙන් දත්ත ගොනු කිරීම සහ සහය ලබාදීමද සිදු කරන ලදී.

7.9 ඇමතුම් මැදිරිය

117 ඇමතුම් මැදිරිය සඳහා නව මෘදුකාංග ස්ථාපිත කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හරහා සන්නිවේදන පහසුකම් ලබා ගනිමින් පැය 24 x 7 පුරා අඛණ්ඩව මහජනතාවට සේවය සැපයීමට හැකි පරිදි කටයුතු සිදු කරමින් පවතී.

එමෙන්ම, ඇමතුම් මැදිරිය සඳහා එම සේවකයන් බඳවා ගැනීම සිදු කළ අතර ඔවුන් සඳහා මූලික පුහුණුවක් ලබාදීමට කටයුතු කරන ලදී.

තවද, හදිසි ආපදාවකදී සන්නිවේදනයට අවශ්‍ය දුරකථන අංක ඇතුළත් දත්ත ගබඩාවක් යාවත්කාලීන කිරීම සහ 24 x 7 පුරා රාජකාරි කටයුතු කිරීමේදී 117 ඇමතුම් මැදිරියේ අරමුණු ලඟාකර ගැනීමට සහ කාර්යයක්ෂමතාවය වර්ධනය කර ගැනීමට අවශ්‍ය නව පරිපාලන ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.




ඇමතුම් මැදිරිය

7.10 වර්ෂය තුළදී කරන ලද හදිසි මෙහෙයුම් අංශයට අදාළ අනිකුත් කාර්යයන්

- දේශීය / විදේශීය ශිෂ්‍ය කණ්ඩායම්, ආරක්ෂක අංශයන්හි නිලධාරීන්, පාර්ශවකරුවන්, රාජ්‍ය නිලධාරීන් ආදී කණ්ඩායම් සඳහා හදිසි මෙහෙයුම්, පූර්ව දැනුම්දීම්, ආපදා කළමනාකරණය ආදී විෂයයන් පිළිබඳව වීඩියෝ සම්මන්ත්‍රණ මැදිරිය සහ හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය යොදා ගනිමින් කරන ලද දැනුවත් කිරීම් 30ක් පමණ සිදු කරන ලදී.
- උමා ඔය විශේෂ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යයන් සාර්ථක කිරීම සඳහා පූර්ණ දායකත්වය ලබාදීම හා හදිසි මෙහෙයුම් මැදිරියේ නිලධාරීන් ස්ථානභාර නිලධාරීන් ලෙස අනුයුක්ත කිරීම සිදු කරන ලදී.

- තවද පැය **24 x 7** රාජකාරීන්හි කාර්යයක්ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණින් හදිසි මෙහෙයුම් අංශයේ රාජකාරි කටයුතු සඳහා හදිසි මෙහෙයුම් අංශයට අයත් ඒකකයන් සඳහා නව බඳවා ගැනීම් සිදුකර මානව සම්පත් වර්ධනයට කටයුතු කරන ලදී.

- **2018** ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය තුළ දිස්ත්‍රික් **18**ක් නියඟය නිසා පීඩාවට පත්ව ඇති අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණයෙන් සහන කටයුතු සිදු කරන ලදී.

- ලෝක ආහාර වැඩසටහනේ අනුග්‍රහය දැක්වීමෙන් **2018** දෙසැම්බර් මස **20** සහ **21** දිනවල නිලධාරීන් **20** දෙනකුගේ සහභාගීත්වයෙන් "පැය **72** "හදිසි ආපදා තක්සේරු කිරීමේ මෘදුකාංගය පිළිබඳ පුහුණු වැඩසටහන කොළඹ විශ්ව විද්‍යාලයේ **(GIS LAB)** හිදී පැවැත්වීම.

- එල්-නිනෝ තත්ත්වය සම්බන්ධව සිදු වන කාලගුණික සිදුවීම් පිළිබඳව දැනුවත් කිරීමේ හා ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන **2018** දෙසැම්බර් **27** වන දින ලෝක ආහාර වැඩසටහනට වැඩසටහනේ අනුග්‍රහය සහිතව සාමාජිකයින් **75** දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්වීම.

8. මූල්‍ය හා ගිණුම් අංශය

8.1 2018 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය ප්‍රගතිය

2018 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා රු.මි.**1, 006** ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරය විසින් ලබාදී තිබෙන අතර, එම ප්‍රතිපාදනවලින් රු.මි.**290**ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුනරාවර්ථන වියදම් සඳහාත්, රු.මි.**716**ක් ප්‍රාග්ධන වියදම් සඳහාත් වශයෙන් වෙන්කර තිබේ. මෙම සමස්ත ප්‍රතිපාදනවලින් **2018** අගෝස්තු **31** දින වනවිට රු.මි.**272.75**ක මුදලක් පහත දැක්වෙන පරිදි වැයකර තිබේ.

වැය විෂය අංකය	ව්‍යාපෘතිය / වැඩසටහන / ක්‍රියාකාරකම්	මුළු ප්‍රතිපාදන සංශෝධිත 2018 (රු. මිලියන)	මුළු වියදම (රු. මිලියන)	ප්‍රගතිය	
				මූල්‍ය	භෞතික
106-2-3-2-1503	පුනරාවර්ථන වියදම්	**290**	**282.5**	**97**	**97**
106-2-3-2-2201 (I)	පුහුණු හා හැකියා වර්ධනය	**3**	**3.00**	**100**	**100**
106-2-3-2-2201 (II)	කාර්යාල උපකරණ මිලට ගැනීම හා හයිබ්‍රිඩ් හෝම් එකක් මිලට ගැනීම	**5**	**5.00**	**100**	**100**
106-2-3-3-2509	දිස්ත්‍රික්වල ආපදා අවදානම් අවම කිරීමට කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති	**480**	**360.8**	**75**	**90**

	ක්‍රියාත්මක කිරීම හා හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම				
106-2-3-5-2509 (I)	**ආපදා පෙර සූදානම් හා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම (ආපදා දැනුවත් කිරීමේ වැඩසටහන්)**	**25**	**23.9**	**96**	**98**
106-2-3-5-2509 (II)	**ආපදා පෙර සූදානම් හා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම (ආපදා පෙර සූදානම් වැඩසටහන්)**	**25**	**24.97**	**100**	**100**
106-2-3-7-2509	**ශ්‍රී ලංකාව සඳහා බහුවිධ ආපදා අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම**	**50**	**20.37**	**39.4**	**40**
106-2-3-8-2103	**නායයෑම්, හදිසි ගංවතුර හා නියඟ අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ධාරිතා වර්ධනය**	**78**	**75.37**	**97**	**97**
106-2-3-9-2101	**ගංවතුර ප්‍රතිචාර සඳහා බෝට්ටු සහ අඟුල් මිලදී ගැනීම**	**20**	**20.00**	**100**	**100**
106-2-3-10-2509	**ආපදා හානි අවම කිරීම හා සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහයට අන්තර්ග්‍රහණය කිරීම**	**15**	**13.05**	**87**	**87**
මුළු වියදම් - පුනරාවර්ථන හා ප්‍රාග්ධන		**991**	**829.1**	**78**	**90**

වගුව **8.1: 2018** දෙසැම්බර් මස **31** දිනට මූල්‍ය ප්‍රගතිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

වත්කම්	සටහන්	2018 රු. '000	2017 රු. '000
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	03	**1,069,617**	**1,285,380**
අස්පෘශ්‍ය වත්කම්		**8,556**	**-**
ජංගම වත්කම්			
ගංචතුර, නායයාම් විශේෂ ණය අත්තිකාරම්		209	329
ආපදා ප්‍රතිචාර උපකරණ තොග	04	49,987	42,570
භාණ්ඩ ලේඛණ	05	11,167	7,939
පෙර ගෙවීම් සහ අත්තිකාරම්	06	5,717	2,650
තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ	07	1,629	1,613
මුදල් සහ මුදල්වලට සමාන දෑ	08	38,471	10,225
මුළු ජංගම වත්කම්		**107,180**	**65,326**
මුළු වත්කම්		**1,185,353**	**1,350,706**
අරමුදල් සංචිත සහ වගකීම් ශුද්ධ වත්කම් / සම කොටස්			
		-	-
සමුච්චිත අරමුදල්		**(142,062)**	**(108,742)**
සංචිත			
මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන		206,436	206,436
සංචිත ප්‍රත්‍යාගණනය- මෝටර් වාහන		869,847	812,597
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - මහා භාණ්ඩාගාරය		2,552	5,264
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - ICET		655,599	865,413
ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	09	(533,979)	(504,037)
මුළු ශුද්ධ වත්කම් / සම කොටස්		**1,058,393**	**1,276,930**
ජංගම නොවන වගකීම්			
වෙනත් සංවිධානවලින් ප්‍රදාන	10	16,020	10,108
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	11	33,686	28,429
ජංගම වගකීම්			
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	12	77,048	35,033
වෙනත් ප්‍රතිපාදන	13	206	206
මුළු ජංගම වගකීම්		**77,254**	**35,239**
මුළු වගකීම්		**126,960**	**73,776**
මුළු අරමුදල් සහ වගකීම්		**1,185,353**	**1,350,706**

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 17 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුව සකස් කර තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු වගකීම දරති.

කේ. ඒ. නිශාන්ත	ජී. එස්. කේ සමරතුංග	ආචාර්ය එස්. අමලනාදන්
නි. අධ්‍යක්ෂ (මූල්‍ය)	අධ්‍යක්ෂ මූල්‍ය (වැඩබලන)	අධ්‍යක්ෂ ජනරාල්

අන්තර් කළමනාකරණ කමිටුව වෙනුවෙන් අත්සන් කළේ.

එච්.යූ.ආර්. ෆොන්සේකා	ජේ.අයි.රත්නසිරි
IMC සාමාජික	IMC සභාපති

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2018 රු. '000	2017 රු. '000
ආදායම්	14	287,125	237,700
වෙනත් ආදායම්	15	227,662	222,452
		514,787	**460,152**
පරිපාලන වියදම්	16	(534,668)	(515,800)
වෙනත් වියදම්	17	(13,439)	(7,316)
වෙනත් මෙහෙයුම්වල (අතිරික්තය/ හිඟය)		**(33,320)**	**(62,963)**
මූල්‍ය වියදම්		-	-
බදු පෙර (අතිරික්තය/ හිඟය)		**(33,320)**	**(62,963)**
බදු		-	-
වසර සඳහා මුළු අතිරික්තය (හිඟය)		**(33,320)**	**(62,963)**

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 17 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

	මහා භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන ප්‍රධාන	ප්‍රාග්ධන ප්‍රධාන වත්කම් මහා භාණ්ඩාගාරය	ප්‍රාග්ධන ප්‍රධාන වත්කම් - ICET	ප්‍රාග්ධන සංචිත නැවත M/V ඇගයීම	සමුච්චිත අරමුදල	මුළු ශුද්ධ වත්කම් ප්‍රමාණය
	රු. '000	**රු. '000**	**රු. '000**	**රු. '000**	**රු. '000**	**රු. '000**
2017 ජනවාරි 01 වන විට ශේෂය	194,617	10,740	1,075,227	-	(51,438)	1,229,145
පසුගිය වසරේ ගැලපීම්	-	-	-	-	5,659	5,659
2017 වසර සඳහා ක්‍රමක්ෂය	-	(5,477)	(209,814)	-	-	(215,291)
2017 වසර තුළ ලද ප්‍රාග්ධනය	617,980	-	-	-	-	617,980
වසර සඳහා වන ප්‍රාග්ධන මත ආයෝජනය	(504,037)	-	-	-	-	(504,037)
2017 වසර සඳහා අතිරික්තය (හිඟය)	-	-	-	-	(62,963)	(62,963)
ප්‍රත්‍යාගණන සංචිත M/V2017 වසර	-	-	-	206,436		206,436
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	308,560	5,263	865,413	206,436	(108,742)	1,276,930
2018 ජනවාරි 01 දිනට ශේෂය	308,560	5,263	865,413	206,436	(108,742)	1,276,930
පෙර වසරේ ගැලපීම්	-	-	-	-		
2018 වර්ෂයේ ක්‍රමක්ෂය	-	(2,711)	(209,814)	-	-	(212,525)
2018 වසර තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන	561,287	-	-	-	-	561,287
2018 වසර සඳහා ප්‍රාග්ධන ප්‍රධාන මත ආයෝජන	(533,979)	-	-	-	-	(533,979)
2018 වසර සඳහා අතිරික්තය (හිඟය)	-	-	-	-	(33,320)	(33,320)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	335,868	2,552	655,599	206,436	(142,062)	1,058,393

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 17 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

	2018 රු. **'000**	2017 රු. **'000**
පෙර බදු අතිරික්තය (හිඟය)	**(33,320)**	**(62,963)**
ගැලපීම්		
ක්ෂය වීම්	252,826	231,572
වත්කම් ප්‍රාග්ධන ප්‍රදානයන්හි ක්‍රමක්ෂය	(212,525)	(215,290)
පාරිතෝෂික ගෙවීම්	(203)	(155)
වෙනත් ආදායම් ලෙස සැලකූ මුදල් නොවන ලැබීම්	(96)	-
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	5,556	5,175
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය (හිඟය)	**12,237**	**(41,662)**
කාරක ප්‍රාග්ධන වෙනස් වීම්		
කාර්ය මණ්ඩල ගංවතුර / නායයෑම් විශේෂ ණය වැඩිවීම් / (අඩු වීම්)	120	(329)
වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්)	(15)	40
භාණ්ඩ ලේඛණයේ වැඩිවීම් / (අඩු වීම්)	(3,228)	(3,558)
ආපදා ප්‍රතිචාර උපකරණ තොග වැඩිවීම් / (අඩුවීම්)	(7,417)	8,879
පෙර ගෙවුම් සහ අත්තිකාරම් වැඩිවීම් / (අඩුවීම්)	(3,067)	6,656
වෙනත් ගෙවිය යුතු දෑ වැඩි වීම්	42,015	29,583
වෙනත් විධි විධානවල වැඩි වීම් / (අඩුවීම්)	-	-
ප්‍රාග්ධන WIP ව්‍යාපෘතිවල ප්‍රාග්ධන වැඩිවීම් / (අඩුවීම්)	-	22,708
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**40,654**	**22,318**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහයන්		
දේපළ, පිරියෙත සහ උපකරණ අත්පත් කර ගැනීම	(37,063)	(158,044)
අස්පෘෂ වත්කම් අත්පත් කර ගැනීම	(8,556)	-
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**(45,619)**	**(158,044)**
මූල්‍ය කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහ		
ප්‍රාග්ධන ප්‍රධාන ශුද්ධ වැඩිවීම් (ලැබීම්)	561,287	617,980
ප්‍රාග්ධන ශුද්ධ වැඩිවීම් (ගෙවීම්)	(533,979)	(504,037)
රා.නො.ස / අ.රා.නො.ස. වලින් ශුද්ධ ප්‍රදාන	5,912	1,653
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**33,220**	**115,596**
මූල්‍ය සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ වෙනස්කම්	**28,246**	**(20,129)**
වසර ආරම්භයේ මුදල් සහ මුදල්වලට සමාන දෑ	10,225	30,354
වසර අවසානයේ මුදල් සහ මුදල්වලට සමාන දෑ (සටහන අ)	**38,471**	**10,225**

සටහන අ - මුදල් සහ මුදල්වලට සමාන දෑ	**රු. '000**	**රු. '000**
බැංකුවේ ඇති මුදල්	38,471	10,225
අතැති මුදල්	-	-
	38,471	**10,225**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් 1 සිට 17 දක්වා මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

1. පොදු තොරතුරු

1.1 වසතිය සහ නෛතික ස්වභාවය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යනු, ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ ජාතික සභාවට සහාය ලබා දීම පිණිස 2005 අංක 13 දරන පනත යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය විද්‍යා මාවත, කොළඹ 7 හි පිහිටා තිබේ.

ආපදා කළමනාකරණ ජාතික සභාව පිහිටුවීම සඳහා පනතින් ප්‍රතිපාදන සැළසෙන අතර ශ්‍රී ලංකාව තුළ ආපදා අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ ජාතික සභාවට සහාය දීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවයි. රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ගේ සභාපතිත්වයෙන් යුතුව ආයතනයේ මනා ක්‍රියාකාරිත්වය අරමුණු කරගෙන අන්තර්වාර කළමනාකරණ කමිටු පිහිටුවා තිබේ. තව දුරටත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

මධ්‍යස්ථානයේ කාර්යයන් පනතේ (1) උප කොටස යටතේ දක්වා තිබෙන අතර ඒවා පහත පරිදි වේ.

- ජාතික ආපදා කළමනාකරණ සැළසුම සහ ජාතික හදිසි මෙහෙයුම් සැළැස්ම සකස් කිරීමේ දී සභාවට සහාය ලබා දීම සහ එය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල යෝජනා ලබා දීම.
- ජාතික ආපදා කළමනාකරණ සැළසුම සහ ජාතික හදිසි මෙහෙයුම් සැළැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දැරීම සහ ආපදා තත්ත්වයක් ප්‍රකාශ කළ අවස්ථාවක ජාතික හදිසි මෙහෙයුම් සැළැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන විවිධ ආපදා කළමනාකරණ සැළසුම් ජාතික ආපදා කළමනාකරණ සැළසුමට අනුගත කිරීම.
- විවිධ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන ආපදා කළමනාකරණ සැළසුම් පදනම් කරගෙන පනතේ 10 වගන්තිය යටතේ ආපදා සූදානම, අවම කිරීම, වැළැක්වීම, සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතුවලට සැළසුම් සහ වැඩසටහන් සකස් කිරීම සහ එවන් වැඩසටහන් සහ සැළසුම් ක්‍රියාත්මක කරන සංවිධාන සම්බන්ධීකරණය කිරීම එවන් ක්‍රියාකාරකම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය ආධාර ලබා ගැනීම සහ එම මූල්‍ය ආධාර අදාළ ප්‍රදේශවලට නිදහස් කිරීම සහ එම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම.
- යෝග්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ආපදා කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් සඳහා උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ එම සංවිධාන සහ ලේකම්වරුන් සමඟ සහයෝගයෙන් වැඩසටහන් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ආපදා කළමනාකරණයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ආපදා කළමනාකරණය පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම සහ නඩත්තු කිරීම සහ
- සභාවට/ අන්තර් කළමනාකරණ කමිටුවට වරින් වර සහ අවශ්‍ය අවස්ථාවල මේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කිරීම.

1.3 ප්‍රධාන මෙහෙයුම ස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය විද්‍යා මාවත, කොළඹ 7 හි පිහිටා ඇති අතර සෑම කච්චේරියකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක 25 ක් පිහිටුවා තිබේ.

1.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබෙන්නේ ආයතනය අඛණ්ඩ පැවැත්මක් සහිත එකක් බව උපකල්පනය කරමින් ය. නුදුරු අනාගතය තුළ ආයතනයට අඛණ්ඩ පැවැත්මක් සහිතව කටයුතු කිරීමට ඇති හැකියාව පිළිබඳ කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් කර තිබේ. තවදුරටත් අඛණ්ඩ පැවැත්මක් සහිතව ඉදිරියට යාමට ආයතනය තුළ ඇති හැකියාවට සැලකිය යුතු අවිනිශ්චිත තත්ත්වයක් ඇතිකරන ද්‍රව්‍යාත්මක අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරීත්වය දැනුවත් වී නැති අතර ආයතනයේ මෙහෙයුම් නතර කිරීමට හෝ ආයතනය ඈවර කිරීමට හෝ ඔවුන්ගේ අදහසක් නොමැත. එමනිසා මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්මක් තිබේ යන පදනම මත ක්‍රියාත්මක වේ.

1.5 මූල්‍ය කාලසීමාව

නියෝජනය කරන ආයතනයේ මූල්‍ය කාල සීමාව 2018 ජනවාරි 1 සිට 2018 දෙසැම්බර් 31 දක්වා වේ.

1.6 මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ පදනම

1.6.1 අනුකූල වීමේ ප්‍රකාශය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් ඉදිරිපත් කර තිබෙන වෙනත් ගිණුම්කරන ප්‍රමිතීන්ට ද අනුකූල වන ලෙස සකස් කර තිබේ.

1.6.2 මිනුම්වල පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධ යෝග්‍ය හෙළි කිරීම් කර ඇති අවස්ථාවල හැර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම උපචිත පදනම අනුව සකස් කර තිබෙන අතර ඓතිහාසික වියදම් පදනම මත සිදු කර තිබේ.

1.6.3 සන්සන්දනාත්මක තොරතුරු

සමාන අයිතමයන් සහිත සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම දක්වා තිබේ. වෙනස් ස්වාභාවයේ අයිතමයන් හෝ කටයුතු ඒවා ප්‍රමාණාත්මක නොවන අවස්ථාවල හැර වෙනම ඉදිරිපත් කර තිබේ.

1.6.4 ප්‍රමාණාත්මක බව සහ සමාහරණය

සමාන අයිතමයන් සහිත සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම දක්වා තිබේ. වෙනස් ස්වාභාවයේ අයිතමයන් හෝ කටයුතු ඒවා ප්‍රමාණාත්මක නොවන අවස්ථාවල හැර වෙනම ඉදිරිපත් කර තිබේ.

1.6.5 ශ්‍රිතයාත්මක සහ පිළිගැන්වීමේ ව්‍යවහාර මුදල්.

මූල්‍ය ප්‍රකාශ ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ ආයතනයේ ශ්‍රිතයාත්මක සහ පිළිගැන්වීමේ ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබෙන සියළු මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති අවස්ථාවල ආසන්න රු. 1000 ට සකස් කර තිබේ.

1.5 සැලකිය යුතු ගිණුම්කරණ තක්සේරු සහ විනිශ්චයන්.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සූදානම් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල ගිණුම්කරණ ප්‍රතිපත්තියට බලපාන විනිශ්චයන්, තක්සේරු සහ උපකල්පනයන් සිදු කිරීමට අවශ්‍ය වේ. ඇස්ත ප්‍රතිඵල මෙම භාවිතා කරන ලද තක්සේරු සහ විනිශ්චයන්ගෙන් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හෝ පදනම් කරගත් උපකල්පන දැනට ක්‍රියාත්මක වන පදනම මත සමාලෝචනය කරයි. සංශෝධනය එම අදාළ කාලයට පමණක් බලපාන්නේ නම් හෝ අනාගත කාලයට බලපාන්නේ නම් ගිණුම්කරණ ඇස්තමේන්තුවලට කරන සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කරන කාලයට අනුව හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවල හඳුනාගන්නා ප්‍රමාණයන් මත වඩාත්ම සැළකිය යුතු බලපෑම තිබෙන ගිණුම්කරන ප්‍රතිපත්ති යොදාගැනීමේදී ඇස්තමේන්තු, අවිනිශ්චිතතාවන් සහ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ සැළකිය යුතු ක්ෂේත්‍ර සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

➢ **නිශ්චිත ප්‍රතිලාභ සැළසුම්**

සේවකයන්ගේ පශ්චාත් රැකියා නියුක්ති ප්‍රතිලාභ සැළසුම තීරණය කිරීම ආරක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ ක්‍රමය උපයෝගී කරගෙන වේ. මෙම ක්‍රමය තුළ සාමාන්‍ය මාසික වැටුප සහ වසර අවසාන වන විට සම්පූර්ණකර තිබෙන වසර ගණන උපකල්පනය මත සිදු කරයි. සැළසුමේ දිගු කාළීන ස්වාභාවය අනුව මෙම ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතතාවක පවතියි.

➢ **ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්ගේ වෙනස්කම්**

ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ ඕනෑම වෙනස්කමක් මූල්‍ය ප්‍රකාශවල අදාළ සටහන්වල හෙළි කර තිබේ.

2. සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 වත්කම් සහ එහි තක්සේරුවේ පදනම

2.1.1 දේපළ, පිරියත සහ උපකරණ

- **හඳුනාගැනීමේ සහ මැනුම් කිරීමේ පදනම**

  දේපල පිරියත සහ උපකරණ හඳුනාගන්නේ එම වත්කම්වලට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ලැබෙන බවත් වත්කම්වල වියදම විශ්වසනීය ලෙස ගණනය කළ හැකි බවත් යන සම්භාවිතාව මතය.

  සියළුම දේපල, පිරියත සහ උපකරණ මූලිකව වියදම අනුව සඳහන් කරන අතර ක්‍රමයෙන් වියදම අඩු කළ සමුච්චිත ක්ෂය වීම අනුව සහ හානි අලාභ අනුව ගණනය කරයි. අලුත්වැඩියා සහ නඩත්තු වියදම විස්තීරණ අදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා අතර යම් අවස්ථාවන් සහ වෙනස්කම් සිදුවීම තුළ ධාරණ අගය නැවත ලබාගත නොහැකි විය හැකි බවට දැක්වෙන අවස්ථාවල දේපළ පිරියත සහ උපකරණවල ධාරණ අගය හානි සඳහා සමාලෝචනය කරනු ලබයි

- **ක්ෂය වීම්**

  වත්කම්වල ඵලදායී ජීවන කාලය මත එම ප්‍රමාණයන් කපා හැරීම සඳහා සියළු දේපළ පිරියත සහ උපකරණවල වියදම මත සරළ රේඛීය ක්‍රමය භාවිතා කරමින් ක්ෂය වීම් ගණනය කරනු ලබයි. වත්කම්වල ඇස්තමේන්තු ගත ඵලදායී ජීවන කාලය පහත පරිදි වේ.

වත්කම් කාණ්ඩය	ඵලදායී ජීවන කාලය
ගෘහ භාණ්ඩ	10
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	20
විදුලි සන්දේශ උපකරණ	5 -20
මෝටර් වාහන	5-10
පරිගණක	10
කාර්යාල උපකරණ	10

ඕනෑම වත්කමක ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත් වහාම වන අතර අලෙවිය සඳහා වත්කම වර්ගීකරණය කරන ලද මුල් දින සිට වත්කම හඳුනාගන්නා කාලය දක්වා වේ.

දේපල පිරියත සහ උපකරණවල සැළකිය යුතු අයිතමයන් විවිධ ඵලදායී ජීවන කාලයන් සහිතව වෙන් වෙන්ව හඳුනාගෙන ක්ෂය වීම් සිදු කර තිබේ.

- **ඉවත් කිරීම**

යම් කිසි දේපල, පිරියත සහ උපකරණයක් ඒවායින් කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් එය භාවිතාවෙන් හෝ බැහැර කිරීමෙන් බලාපොරොත්තු නොවන විට ඒවා බැහැර කිරීම මත ඉවත් කරනු ලබයි. යම් කිසි වත්කමක් ඉවත් කිරීම මත මතුවන ලබා ගැනීමක් හෝ හානියක් ශුද්ධ බැහැර කිරීමේ ක්‍රියාවලිය සහ ධාරණ වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරන අතර වසර සඳහා වන විස්තීරණ අදායම තුළ වත්කම ඉවත් කළ බව සඳහන් කරනු ලබයි.

2.1.2 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ලැබෙන බවටත් එම වත්කමේ වටිනාකම විශ්වසනීය ලෙස ගණනය කළ හැකි බවටත් වන සම්භාවිතාව මතය. ආයතනය විසින් ලබා ගන්නා අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලබන්නේ සමුච්චිත ක්‍රමක්ෂ වියදම අඩු කිරීම සහ සමුච්චිත හානි අලාභ අඩු කිරීමෙනි.

2.1.3 භාණ්ඩ ලේඛන

යල් පැනගිය සහ මන්දගාමී අයිතමයන් නිසි දීමනා ලබාදීමෙන් පසුව ශුද්ධ උපලභ්‍ය අගය සහ වටිනාකමේ පහළ අගය මත භාණ්ඩ ලේඛණ සකස් කර තිබේ. ශුද්ධ උපලභ්‍ය අගය යනු, සාමාන්‍ය ව්‍යාපාර කටයතුවලදී ඇස්තමේන්තුගත විකුණුම් වටිනාකමින් සම්පූර්ණ ඇස්තමේන්තුගත වියදම සහ විකුණුම් වියදම් අඩු කිරීමෙන් ලැබෙන අගයයි. භාණ්ඩ ලේඛණවල වියදම පදනම් වන්නේ මිලදී ගැනුම් අගයයි. වියදමට භාණ්ඩ ලේඛණ ලබා ගැනීමේදී දරන වියදම සහ ඒවා තිබෙන ස්ථානවලට ගෙන ඒමට සහ එම තත්ත්වයන්ට පත් කිරීමට යන වියදම ඇතුළත් වේ.

2.1.4 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර සක්‍රිය වෙළෙඳ පොළ තුල සඳහන් නොවන නිශ්චිත ගෙවීම් ක්‍රමයක් තිබේ. මූලික වශයෙන් ණය සහ ලැබිය යුතු දෑ හඳුනාගනු ලබන්නේ ඒවා ආරම්භ වූ දින සිටය. ණය සහ ලැබිය යුතු දෑ යන්නට සේවක ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

2.1.5 මුදල් සහ මුදල්වලට සමාන දෑ

ආයතනය විසින් අතැති මුදල් බැංකුවලින් ලැබිය යුතු මුදල් ලෙසත් ප්‍රථම කල් පිරීමක් සහිත මාස තුනක් හෝ ඊට අඩු කෙටි කාලීන තැන්පතු " මුදල් සහ මුදල්වලට සමාන දෑ " ලෙස ආයතනය හඳුනාගනියි. ඉල්ලුම මත ආපසු ගෙවිය යුතු බැංකු ණය ආයතනයේ මූල්‍ය කලමනාරකණයේ වෙන් කළ නොහැකි කොටසක්වන අතර මුදල් ප්‍රවාහවල ඇතුළත් කිරීම සඳහා මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ඇතුළත් වේ. මුදල් සහ මුදල්වලට සමාන දෑ වලට අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ බැංකුවේ ඇති තැන්පතු ඇතුළත් වේ.

2.1.6 වගකීම් සහ ප්‍රතිපාදන

වගකීමක් සේවා අරමුණක් සහිතව සමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ බේරුම්කිරීම අපේක්ෂා කරන විට ජංගම දෙයක් ලෙස වර්ගීකරණය කරන අතර වාර්තා කරන කාළ සීමාවෙන් පසු එය මාස දොළහක කාලයක් තුළ බේරුම් කළ යුතු අතර වාර්තා කිරීමේ කාලයනේ පසු එම වගකීම බේරුම් කිරීම අවම වශයෙන් මාස දොළහකට ප්‍රමාද කිරීම සඳහා කොන්දේසි විරහිත අයිතියක් නොමැත. අනෙකුත් සියළු වත්කම් ආයතනය විසින් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර තිබේ.

2.1.7 ප්‍රතිපාදන

යම් කිසි පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ආයතනයට නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයන් හඳුනා ගන්නා අතර වත්කම් ගලායාමක් එම වගකීම බේරුම් කිරීම සඳහා අවශ්‍ය වන අතර එම වගකීම විශ්වසනීය ලෙස ගණනය කළ හැකිය.

2.1.8 සේවක ප්‍රතිලාභ

1. **සේවක ප්‍රතිලාභ සැළසුම – පාරිතෝෂික**

   1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන සළසා ඇති අතර එම ගෙවීම් සෑම මූල්‍ය වර්ෂයකම අවසන් මාසය තුළ ලබා ගත් වැටුපෙන් අඩ මසක වැටුප ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට සේවය කළ වසර ගණනක සේවය අනුව ලබා දෙනු ලැබේ. මෙම අයිතමය විලම්බිත වගකීම් යටතේ වර්ග කරනු ලැබේ. මෙම ප්‍රතිපාදනවලට බාහිර මූල්‍ය ආධාර ලැබීමක් හෝ ආයුගණක ඇගයීමක් හෝ සිදු කර නැත.

2. **නිශ්චිත දායකත්ව සැළසුම්- සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

   අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුව සේවකයන්ට සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වීමේ හැකියාව තිබේ. මේවා විස්තීරණ ආදායම් තුළ වියදම් ලෙස දක්වයි. ආයතනය විසින් 12%ක් සහ 3%ක් වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායකත්වය සපයයි.

2.1.9 විදේශ මුදල් ගනුදෙනු පරිවර්තනය

ශ්‍රී ලංකා රුපියල් නොවන මුදල්වලින් සිදුකරන ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම එම ගනුදෙනුව සිදු කරන දිනයට ඇති වටිනාකමට සිදු කරනු ලැබේ.

2.1.10 අරමුදල්, ප්‍රදාන සහ සංචිත ලැබීම සහ උපයෝගී කිරීම ගණනය කිරීම.

ආයතනයට විවිධ සංවර්ධන කටයුතු සඳහා විවිධ ආධාර ලැබෙන අතර ඒවා අරමුදල් ලැබුණු සහ උපයෝජනය කළ වසරේ අදායම් සහ වියදම් ලෙස සළකනු ලබයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන 03 - දේපළ, පිරියෙත සහ උපකරණ

ස්ථාවර වත්කම්	**2018.01.01 දිනට මුළු වියදම රු. '000**	**එකතු කිරීම් / වසර තුළ මාරු කිරීම් රු. '000**	**මාරු කිරීම් / වසර තුළ ඉවත් කිරීම් රු. '000**	**2018.12.31 දිනට මුළු වියදම් රු. '000**	**2018.01.01 දිනට ලිඛිත වටිනාකම රු. '000**
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	427,322	-	-	427,322	272,276
කාර්යාල උපකරණ	52,039	19,295	-	71,334	28,627
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	12,838	2,273	-	15,110	7,288
පරිගණක සහ උපාංග	96,529	14,509	-	111,037	32,395
මෝටර් වාහන	366,235	-	5,475	360,760	347,261
විදුලි සංදේශ උපකරණ	1,561,750	986	-	1,562,736	591,974
මෘදුකාංග	6,657	-	-	6,657	5,559
	2,523,369	**37,063**	**5,475**	**2,554,957**	**1,285,380**

ක්ෂය වීම්	2018.01.01 දිනට සමුච්චිත ශේෂය **රු. '000**	ප්‍රතිපාදන ගැලපීම් **රු. '000**	වසර තුළ මාරු කිරීම මත ක්ෂය වීම් **රු. '000**	2018.12.31 දිනට සමුච්චිත ක්ෂය වීම් **රු. '000**	2018.12.31 දිනට ලිඛිත වටිනාකම **රු. '000**
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	155,045	21,366	-	176,412	250,910
කාර්යාල උපකරණ	23,412	3,384	-	26,796	44,538
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	5,550	1,101	-	6,651	8,460
පරිගණක සහ උපාංග	64,134	7,944	-	72,077	38,960
මෝටර් වාහන	18,974	35,569	(5,475)	49,068	311,692
විදුලි සංදේශ උපකරණ	969,776	182,445	-	1,152,221	410,516
මෘදුකාංග	1,098	1,017	-	2,116	4,541
	1,237,989	**252,826**	**(5,475)**	**1,485,341**	**1,069,617**

සටහන 4 - තොග වශයෙන් ඇති ආපදා ප්‍රතිචාර උපකරණ

අයිතමය	2018 ප්‍රමාණය	2018 මුළු වටිනාකම රු. '000	2017 ප්‍රමාණය	2017 මුළු වටිනාකම රු. '000
දම්වැල් කියත්	67	3,704	13	964
ජීවිතාරක්ෂක කබා	402	1,407	47	165
බෝට්ටු එන්ජින්	45	18,225	30	13,200
බෝට්ටු (බඳ)	1	195	38	7,078
ආ. ක. ම. හඳුනාගැනීමේ කබා	1023	506	2286	1,132
මැනුවල් සයිරන්	2	49	2	49
වර්ෂාමාන	452	1,213	371	1,020
ට්‍රැක්ටර් මත ඇති බවුසර්	-	-	-	-
මන්නා කැති	1001	966	10	6
සෙවීම් හා මුදවා ගැනීමේ කඹ	88	5,522	16	1,350
සර්චි ලයිට්	57	106	57	106
බෝට්ටු අදින ට්‍රෙලර් Modl Nu-SH 718 BT	-	-	-	-
අඟුල්	43	5,332	10	1,240
PA පද්ධති UNHABITAT	-	-	-	-
PAපද්ධති UNHABITAT	-	-	-	-
7 වන වැය ශීර්ෂයෙන් ගම් බූට් මිලට ගැනීම	13	17	21	27
විදුලිජනක යන්ත්‍ර	1	38	1	38
ආ.ක.ම. හඳුනාගැනීමේ කබා - UNDP	1350	668	2000	990
බේරාගැනීමේ බෑග්	580	957	1192	1,967
චතුර ටැංකි 1000 l	46	373	46	373
රබර් අත් මේස්	236	41	236	41
මුහුණු ආවරණ	780	116	1030	153
පොරෝ STC	100	89	-	-
වානේ සවල් STC	-	-	-	-
වැහි කබා	174	268	374	576
මැනුවල් කියත්	-	-	-	-
චතුර පොම්ප BGVSP 2 SP	5	155	5	155
බෝට්ටු බඳ වෙනත්	-	-	24	11,940
ටාපෝලින් - NDRSC	167	501	-	-
හදිසි අවස්ථා බේරා ගැනීමේ බෝට්ටු	12	9,540	-	-
මුළු වටිනාකම		49,987		42,570

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2018

	2018	2017
	රු. '000	**රු. '000**
සටහන 05 - භාණ්ඩ ලේඛණ		
ලිපි ද්‍රව්‍ය	2,647	346
පරිගණක ටෝනර් සහ කාට්රිජ්	3,300	4,448
අත්පත්‍රිකා	1,384	756
පොත් පිංච	2,157	1,529
වාහන අළුත්වැඩියා සහ නඩත්තු	1,415	783
වෙනත්	263	77
මුළු එකතුව	11,167	7,939
	රු. '000	**රු. '000**
සටහන 06 - පෙර ගෙවුම් සහ අත්තිකාරම්		
අත්තිකාරම් - උත්සව	185	107
අත්තිකාරම් - UNDP	535	-
පෙර ගෙවීම් - පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	4,392	2,252
අත්තිකාරම් - ආ.ක.ම උමා ඔය සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය	-	100
අත්තිකාරම් - මුදල් ප්‍රධාන කාර්යාලය	4	48
අත්තිකාරම් - සේවා සහ නඩත්තු ප්‍රධාන කාර්යාලය	12	12
අත්තිකාරම් - මුදල් දිස්ත්‍රික්ක	344	-
අත්තිකාරම් - පෙර සූදානම් හා සැලසුම් අංශය	185	8
අත්තිකාරම් - පුහුණු හා දැනුවත් කිරීමේ අංශය	20	6
අත්තිකාරම් - ඉන්ධන දිස්ත්‍රික්	40	118
	5,717	**2,650**
	රු. '000	**රු. '000**
සටහන 07 - තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ		
ඩොන්ගල් මත තැන්පතු	3	3
තැන්පතු - ලංකා විදුලිබල මණ්ඩලය	1,109	1,109
තැන්පතු - ජාතික ජල සැපයුම් සහ ජලාපවාහන මණ්ඩලය	52	52
වෙනත් ලැබිය යුතු දෑ	466	451
	1,629	**1,614**
	රු. '000	**රු. '000**
සටහන 08 - මුදල් හා මුදල්වලට සමාන දෑ		
ලංකා බැංකුව - 2744646	38,471	10,225
අතැති මුදල්	-	-
	38,471	**10,225**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2018	2018	2017
සටහන 09 - ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	රු. '000	රු. '000
ප්‍රාග්ධන වියදම්		
ධාරිතා වර්ධන - ආපදා කළමනාකරන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල පුහුණු දිස්ත්‍රික්කවල මධ්‍යම ප්‍රමාණයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	3,000	2,127
	394,258	370,894
දිස්ත්‍රික්කවල කුඩා ප්‍රමාණයේ ආපදා අවම කිරීමේ වැඩසටහන්	-	-
හදිසි අවස්ථාවල ආරක්ෂිත ඉවත් කිරීම්	-	-
ගං වතුර හදිසි තත්ත්වයන් සඳහා උපකරණ මිලට ගැනීම (ආ. ක. ම.)	85,590	51,812
පෙර සූදානම් සැළසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය නියෝජිතායතනවලට සහාය දීම (ආ.ක.ම.)	24,968	19,422
ශ්‍රී ලංකා ආපදා අවදානම් කළමනාකරණ ධාරිතා වර්ධනය -UNDP ((ආ. ක. ම.))	-	-
පානදුර කළුතර ප්‍රා. ලේ. කොට්ඨාසවල ගං වතුර පාලනය	-	-
දඹුල්ල ප්‍රා. ලේ. කොට්ඨාසයෙහි ගං වතුර පාලනය	-	-
යාපනය දිස්ත්‍රික්කයේ ගං වතුර පාලනය	-	-
ආපදා සූදානම් හා කළමනාකරණය මත දැනුවත් වීම	19,496	12,017
පූර්ව දැනුම් දීම මත ධාරිතා වර්ධනය - UNHABITAT	-	-
පූර්ව දැනුම් දීම පද්ධතිකය පිළිබඳ ධාරිතා වර්ධනය - UNHABITAT අදියර II	-	-
ගං වතුර අවම කිරීමේ වැඩසටහන	-	47,160
ශ්‍රී ලංකාවේ බහුවිධ ආපදා පැතිකඩ සකස් කිරීම	3,603	205
ආ. ක. ම.- අත්පත් කර ගැනීම් සහ වෙනත්	-	-
ගොඩනැගිලි ව්‍යුහය- පුහුණු මධ්‍යස්ථානය	-	-
ට්‍රැක්ටර් බවුසර් සහ බෝට්ටු මිලට ගැනීම	31	401
ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයට ප්‍රධාන ධාරා ගත කිරීම	3,032	-
ප්‍රාග්ධන ප්‍රදාන මත ශුද්ධ ආයෝජන	**533,979**	**504,037**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – 2018

	2018	2017
	රු. '000	රු. '000
සටහන **10** - වෙනත් සංවිධානවලින් ආධාර		
Oxfam	688	-
UNDP	645	966
World Vision Lanka	28	-
ADPC	265	265
CSE	234	234
තොරතුරු තාක්ෂණයට අදාළ මිලදී ගැනීම් A/C	38	38
ලෝක සෞඛ්‍ය සංවිධානය - WHO	355	168
Ministry of DM for Deyata Kirula	121	121
UNHABITAT අදියර II	86	86
NEOP සඳහා UNDP	-	5
ADPC ආරක්ෂිත දිනය	33	33
වැඩමුළු සඳහා SAARC	1,756	1,756
I DMP සඳහා UNDP	1,104	1,104
RSSDP සඳහා UNDP	160	160
SFDRR සඳහා UNDP	981	981
DOSEG සඳහා UNDP	668	668
ආපදා අවදානම් අවම කිරීම පළාත් පාළන මට්මටමට ගෙන යාම සඳහාUNDP	1,000	1,000
NDMP සඳහා UNDP	5	5
ආ.ක..අ.උමා ඔය ව්‍යාපෘති කාර්යාලය	1,001	2,518
1% පරිපාලන වියදම් - සම්පූර්ණ කළ ව්‍යාපෘති	3,386	-
NDRSC ප්‍රදානයන්	1,908	-
CRIWMP සඳහා ආ.ක. අමාත්‍යාංශයේ අරමුදල්	647	-
පාසල් සූනාමි වැඩසටහන සඳහා UNDP	913	-
මූළු එකතුව	**16,020**	**10,108**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - **2018**

සටහන **11 - විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්**	2018 රු. **'000**	2017 රු. **'000**
2018 ජනවාරි 01 දිනට ශේෂය	28,429	23,409
වසර සඳහා ප්‍රතිපාදන	5,556	5,175
වසර සඳහා ගෙවීම්	298	155
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	33,686	28,429

	2018 රු. **'000**	2017 රු. **'000**
සටහන 12 - වෙනත් ගෙවිය යුතු දෑ		
ගෙවිය යුතු EPF	2,478	2,243
ගෙවිය යුතු ETF	-	337
PAYE & SRL	7	10
ගෙවිය යුතු වැටුප් හා වේතන	29	-
ගෙවිය යුතු අතිකාල	1,185	1,924
ගෙවිය යුතු ප්‍රවාහන වියදම්	598	917
ගෙවිය යුතු මුද්‍රණ ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	-	63
ගෙවිය යුතු ඉන්ධන වියදම්	176	159
ගෙවිය යුතු වාහන නඩත්තු	660	1,896
ගෙවිය යුතු දේපළ පිරියෙත සහ උපකරණ නඩත්තු	-	146
ගෙවිය යුතු කුලී සහ දේශීය බදු	50	75
තැපැල් සහ විදුලි සංදේශ	1,336	2,975
ගෙවිය යුතු විදුලි සහ ජල ගාස්තු	840	1,045
ගෙවිය යුතු වෙනත් සේවා	18	-
ගෙවිය යුතු අවම කිරීම් ව්‍යාපෘති	68,367	22,123
ගෙවිය යුතු රක්ෂණ	-	342
ගෙවිය යුතු දැන්වීම්	-	203
ගෙවිය යුතු ආරක්ෂක සේවා	127	448
ගෙවිය යුතු සනීපාරක්ෂක සේවා	112	122
ගෙවිය යුතු පාරිතෝෂික	50	-
ශ්‍රී ලංකා වාණිජ නීතිගත සංස්ථාව	-	5
සෝමරත්න දිසානායක	1,017	-
	77,048	**35,033**

සටහන 13 - වෙනත් ප්‍රතිපාදන	රු. **'000**	රු. **'000**
තොග හානිවීම් සහ ප්‍රතිපාදන	206	206
	206	**206**

	2018	2017
	රු.'000	රු. '000
සටහන 14 - ආදායම		
වර්තන වියදම් සඳහා ආධාර	287,125	237,700
	287,125	237,700

සටහන 15– වෙනත් ආදායම්	රු. '000	රු. '000
Oxfam ආධාර	-	-
UNDP ආධාර	322	-
ටෙන්ඩර් තැන්පතු - ආපසු නොගෙවන	136	147
විවිධ ආදායම්	5	16
ප්‍රාග්ධන ප්‍රදාන මත ක්‍රමක්ෂය	212,525	215,290
ආ. ක. අ. දැයට කිරුළ සඳහා ආධාර	-	-
UN Spider ප්‍රාග්ධන ප්‍රදාන මත ක්‍රමක්ෂය	-	-
නාම පුවරු සඳහා ආධාර	-	-
ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ආධාර	1,078	1,334
NEOP සඳහා UNDP ආධාර	5	-
ADPC ආරක්ෂිත දිනය සඳහා ආධාර	-	-
වැඩමුළු සඳහා SAARC ආධාර	-	-
NDMC ආධාර	-	-
රක්ෂණ ප්‍රතිලාභ ඉල්ලීම්	51	158
SAARC අවශ්‍යතා තක්සේරු වැඩසටහනේ සහාය	-	-
China CAMC Eng. Co. Ltd වෙතින් මීරියබැද්ද නිවසා ව්‍යාපෘතිය සඳහා සහාය	-	1,000
NDMP සඳහා UNDP ආධාර	-	2,003
ආ.ක.ම. ව්‍යාපෘති කාර්යාලය සඳහා උමා ඔය සහාය	2,766	2,504
	216,888	**222,452**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2018
උප සටහන - **15:01 වත්කම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය**

ලබාදුන් වත්කම්	මුළු වියදම 2018.01.01 රු. **'000**	එකතු කිරීම / ආයෝජන (වසර තුළ) රු. **'000**	පෙර වසරේ මුළු වියදම ගැලපීම් රු. **'000**	2018.12.31 රු. **'000**
ස්‍ථානාම් සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	426,287			426,287
කාර්යාල උපකරණ	5,916			5,916
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	559			559
මෝටර් වාහන	259,413			259,413
විදුලි සංදේශ උපකරණ	1,547,757			1,547,757
පරිගණක සහ උපාංග	66,763			66,763
මෝටර් වාහන - වෙනත් භාණ්ඩාගාර	31,675			31,675
	2,338,370	-	-	**2,338,370**

ක්‍රම ක්ෂය	සමුච්චිත ශේෂය 2018.01.01	වසර සඳහා ක්‍රම ක්ෂය	පෙර වසර සඳහා ගැලපීම්	සමුච්චිත ශේෂය 2018.12.31
මෝටර් වාහන ICET	259,413	-	-	259,413
සුනාම් සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු ICET	133,214	21,314	-	133,214
කාර්යාල උපකරණ ICET	5,366	183	-	5,366
විදුලි සංදේශ උපකරණ ICET	967,895	181,584	-	967,895
ගෘහ භාණ්ඩ සහ මෙවලම් ICET	391	56	-	391
මෝටර් වාහන භාණ්ඩාගාර වෙනත්	26,412	2,711	-	26,412
	1,429,623	212,525	-	1,429,623

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2018

සටහන **16** - පරිපාලන වියදම්	**2018** රු. **'000**	**2017** රු. **'000**
ක්ෂය වීම්		
වාහන	35,569	13,908
ගෘහභාණ්ඩ සහ මෙවලම්	1,101	1,226
නාම සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	21,366	21,366
විදුලි සන්දේශ උපකරණ	182,445	182,445
පරිගනක	7,944	8,515
කාර්යාල උපකරණ	3,384	3,302
මෘදුකාංග	1,017	810
නඩත්තු වියදම්		
වාහන නඩත්තුව	15,814	10,094
පිරියත යන්ත්‍රෝපකරණ සහ වෙනත් උපකරණ නඩත්තුව	14,526	57,644
ගොඩනැගිලි නඩත්තුව	481	-
පුද්ගල පාරිශ්‍රමික		
වැටුප් සහ වේතන වියදම් ගිණුම	99,737	74,505

රියදුරන්ට නිල ඇඳුම් දීමනා	152	144
අතිකාල වියදම්	12,995	11,481
ආ.ක.ම. විසින් සේ.අ.සා.අ. දායකත්වය (12%)	17,302	14,362
වෙනත් දීමනා	45,940	48,412
ආ.ක.ම. විසින් සේ.හා.අ. දායකත්වය (3%)	4,325	3,691
චර්තන වියදම්		
ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	5,556	5,175
සේවා		
AMC ගෙවීම්	131	164
වෙනත් වියදම්	626	166
විදුලිය සහ ජලය	11,924	11,932
ආරක්ෂක සේවා	1,556	1,733
නීති ගාස්තු	85	-
ප්‍රවාහන ගාස්තු	18	19
සනීපාරක්ෂක කටයුතු	1,208	1,096
විමර්ශන ගාස්තු	221	-
කුළී සහ දේශීය බදු	2,041	892
IMC ගෙවීම්	376	480
සම්මුඛ පරීක්ෂණ වලට අදාළ වියදම්	114	257
තැපැල් සහ විදුලිසන්දේශ	18,346	17,266
වෙළෙඳ දැන්වීම්	931	338
භාෂා පරිවර්තන ගෙවීම්	164	188
සැපයුම්		
සංග්‍රහ වියදම්	1,266	867
මුද්‍රණ, ලිප ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	7,055	4,212
පුවත් පත් සහ වෙනත්	195	93
ඉන්ධන වියදම්	9,302	8,791
ප්‍රවාහන සහ යැපුම් වියදම්		
ප්‍රවාහන සහ යැපුම වියදම් - විදේශ	3,687	5,346
ප්‍රවාහන සහ යැපුම වියදම් - දේශීය	5,766	4,882
	534,668	515,800

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2018

	2018	2017
	'000	රු. '000
සටහන **17 -** වෙනත් වියදම්		
UNDP ආධාරවලින් වියදම්	322	-
වෙනත්	-	474
දැයට කිරුළ වියදම්	-	-
ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් වියදම්	1,078	1,334
CHA වියදම්	-	-
NEOP වියදම්	5	-
මීරියබැද්ද නිවාස ව්‍යාපෘතිය සඳහා China CAMC Eng. Co. Ltd හිවියදම්	-	1,000
IDMP ආධාරවලින් වියදම්	-	-
UNDP වෙතින් NDMP ආධාරවලින් වියදම්	-	2,003
ආ.ක.ම. ව්‍යාපෘති කාර්යාලය සඳහා උමා ඔය වියදම්	1,517	2,504
DATA ව්‍යාපෘතිය සඳහා UNDP වියදම්	-	-
NDRSC වියදම්	7,667	-
ආ.ක.අ. අරමුදල් සපයන CRIWMP වියදම්,	272	-
UNDP අරමුදල් සපයන පාසල් සුනාමි ව්‍යාපෘතිය සඳහා වියදම්	2,163	-
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ආධාර	415	-
එකතුව	**13,439**	7,316

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ඩීඑමජී/ඒ/ඩීඑමඔ/එෆ්එස්/2018/13 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019 මැයි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රසිද්ධ කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිවිසුම් ප්‍රකාර නියමිත දිනට බෝට්ටු එන්ජින් සපයා නොකිබීම හේතුවෙන් මධ්‍යස්ථානය විසින් අයකරගෙන තිබුණු රු.මිලියන 1.82 ක් වූ ප්‍රමාද ගාස්තුව අදාල වත්කම් වල පිරිවැයට හිලව්කර පෙන්වා තිබීම හේතුවෙන් වත්කම් වල වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) 2018 දෙසැම්බර් 31 මධ්‍යස්ථානය වෙත භෞතිකව ලැබී නොතිබුනු පිරිවැය රු.මිලියන 4.49 ක් වූ මහජන ඇමතුම් කට්ටල 29 ක් හා පිරිවැය රු.975,000 ක් වූ හෙඩ් සෙට් 25 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කාර්යාල උපකරණ යටතේ වත්කම් වශයෙන් දක්වා තිබුණි. ඉන් පිරිවැය රු.මිලියන 2.80 ක් වූ මහජන ඇමතුම් කට්ටල 17 ක ප්‍රසම්පාදන කටයුතු 2019 ජනවාරි 30 දින අවලංගු කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වූ තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත

විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම් හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් නොමැති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති විධිවිධාන වලට යොමුව	විස්තරය
(අ) 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතේ 05 ජේදය	වාර්ෂිකව අවම වශයෙන් කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 04 ක් වත් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.
(ආ) මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද 2017 පෙබරවාරි 21 දිනැති අංක 2017/01 අභ්‍යන්තර චක්‍රලේඛයේ 03 ජේදය	ව්‍යාපෘතියක් තෝරා ගැනීමේදී මහජන විරෝධතාවය අවමවන පරිදි හා වරින්වර සංශෝධනයන් සිදු නොවන ආකාරයේ ව්‍යාපෘති තෝරාගත යුතු වුවත් ඇස්තමේන්තු ගත වටිනාකම රු.මිලියන 171.91 ක් වූ ව්‍යාපෘති 47 ක් විවිධ හේතුමත අවලංගු කර තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය බලතල සහ කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා අරමුදල් උපයෝජනය.

i. සමාලෝචිත වර්ෂයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් රු. මිලියන 480 ක ප්‍රතිපාදනයක් සලසාදී තිබුණද ඒ ඒ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සම්බන්ධ විස්තර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී සැලසුම් වල දක්වා නොතිබුණි. 2017 වර්ෂයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 15 ක හිඟ බිල්පත් නිරවුල් කිරීම සඳහා වෙන් කරන ලද රු.මිලියන 20 ක් වූ ප්‍රතිපාදනයන් ද ඊට ඇතුලත් වූ අතර රු.මිලියන 22.14 ක් වූ හිඟ බිල්පත් 2018 දෙසැම්බර් 31 දිනට නිරවුල් කර තිබුණි.කෙසේ වෙතත්, මධ්‍යස්ථානයේ ප්‍රගති වාර්තාව අනුව 2018 වර්ෂය වෙනුවෙන් ව්‍යාපෘති 278 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 486.56 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මුදාහැර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට එම ප්‍රතිපාදන වලින් රු.මිලියන 361.49 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

ii. වෙන්කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් නියෝජනය වූ රු.මිලියන 104.97 ක මුදලක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 93 ක් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර තිබීම හේතුවෙන් දිවයිනේ දිස්ත්‍රික්ක අතර ප්‍රතිපාදන වෙන්කිරීම සමගාමී නොවුනු බව නිරීක්ෂණය විය. ගාල්ල දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා තෝරාගන්නා ලද අළුත්වැත්ත පාර ඉඩම සංවර්ධනය සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 10 ක ප්‍රතිපාදනය ආපදා අවම කිරීමේ අරමුණුවලට අනුගත නොවූ කාර්යයක් බව නිරීක්ෂණය විය.

iii. බහුවිධ අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම වෙනුවෙන් වෙන් කර තිබුණු රු. මිලියන 50 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 20.31 ක් පමණක් වැයකර තිබුණ අතර ඒ සඳහා වූ සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 59 ක අරමුදල් උපයෝජනය කර නොතිබුණි.

iv. ආපදා අවම කිරීමේ ව්‍යාපෘති වල වැඩ අවසන් වූ වහාම අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ගිවිසුම් ප්‍රකාරව සාර්ථකව වැඩ නිම කර ඇති බවට වැඩ අවසන් සහතිකය ඉදිරිපත් කළ යුතු වුවත් ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 333.92 ක් වූ ව්‍යාපෘති 202 ක වැඩ අවසන් වාර්තා 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදනයන්

i. මධ්‍යස්ථානය විසින් ඔරු අහුල් 80 ක් සපයා ගැනීම වෙනුවෙන් ලංසු ආරාධනා පත්‍ර ආයතන 06 ක් වෙත යොමුකර තිබුණු නමුත් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි නොවූ ආයතන 02 ක් ඒ සඳහා තෝරාගෙන තිබුණි. තවද තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව ඔරු අහුල් සපයා ගැනීමට තෝරාගත් ආයතන විසින් ඉදිරිපත් කර තිබූ පිරිවිතරය ආයතනයේ අවශ්‍යතාවන්ට නොගැලපෙන අවස්ථා 06 ක් හඳුනාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ඡේදය ප්‍රකාරව ඔරු අහුල් සැපයුම්කරු වෙතින් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර ඒ සඳහා ගිවිසුමකටද එළඹ නොතිබුණි. ප්‍රසම්පාදන ලේඛන වලට අනුව මධ්‍යස්ථානය විසින් නම් කරන ස්ථාන වෙත

ඔරු අඟුල් සැපයිය යුතු අතර රු.මිලියන 9.92 ක් වූ එකඟ වූ පිරිවැය තුල ප්‍රවාහන ගාස්තු ද අන්තර්ගත වුවද ප්‍රවාහන ගාස්තු ලෙස රු. 675,155 ක මුදලක් අමතරව වැය කර තිබුණි.

ii. වීඩියෝ දර්ශන පථයක් ප්‍රසම්පාදනය සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබී නොතිබියදීත් සාවද්‍ය ලෙස සකස්කර තිබුණු හාණ්ඩ සැපයීම් නියෝගයක් පදනම් කරගෙන 2018 දෙසැම්බර් 28 දින රුපියල් මිලියන 12 ක් වූ වෙක්පතක් ගෙවීම සඳහා පිළියෙල කර තිබුණි. මෙම උපකරණ 2019 අප්‍රේල් 30 දින වන විටත් ලේඛන වලට ඇතුලත් නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

iii. ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 13.95 ක් වූ මහජන ඇමතුම් කවිටල 149 ක ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ඡේදය අනුව ලිඛිත ගිවිසුමකට එලඹ නොතිබුණ අතර කාර්යය සාධන සුරක්ෂණයක් ලබාගැනීම වෙනුවට පිළිවිතර වලට අනුකූල නොවන ලෙස සපයා තිබුණු මහජන ඇමතුම් කවිටල 29 ක් ඇපකරයක් ලෙස ගබඩාවේ රඳවා තබාගෙන තිබුණි. 2018 දෙසැම්බර් 31 දින අදාල උපකරණ ගබඩාව වෙත ලැබුණු බව සලකා රු.මිලියන 9.10 ක් ගෙවා තිබුණ ද අදාල උපකරණ 2019 මාර්තු 01 දින වන විටත් ගබඩාවට ලැබී නොතිබුණි.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ.

(අ) ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම

i. 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සංශෝධන කටයුතු 2008 වර්ෂයේ සිට සිදු කර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන තෙක් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

ii. 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන පරිච්ඡේදයේ 2 (අ) පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කළ යුතු අතර ඒසඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2017 වර්ෂයේදී රු.මිලියන 02 ක් මධ්‍යස්ථානය වෙත ලැබී තිබුණි. ඒ අනුව 2018 - 2030 දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් නව සැලැස්මක් පිළියෙල කිරීම 2017 මාර්තු 07 දින ආරම්භකර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

iii. ජාත්‍යන්තර අවශ්‍යතාවයක් වන සෙන්දායි රාමුව අනුව ආපදා අවදානම අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී මධ්‍යස්ථානයට රු.මිලියන 1.30 ක ලබා දී තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. උක්ත සැලැස්ම සකස් කිරීමේ කටයුතු රේඛීය අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දන්වා තිබුණි.

(ආ) තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඇ) වාර්ෂික වාර්තා සභාගත කිරීම

මධ්‍යස්ථානය විසින් 2014 සිට 2017 දක්වා වාර්ෂික වාර්තා 2019 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවට සභාගත කර නොතිබුණි.

(ඈ) ඌණ උපයෝජිත අරමුදල්

2015 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මගින් විවිධ වැඩ සටහන් 06 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු.මිලියන 3.99 ක මුදලක් සහ සාර්ක් සංවිධානය මගින් අත්තිකාරම් වශයෙන් 2015 වර්ෂයේ ලැබී තිබුණු රු.මිලියන 1.75 ක් අදාල කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(ඉ) නොවිසඳුනු නීතිමය ගැටළු

i. මෝටර් වාහන 02 ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වර්ෂ 05 ක කාල සීමාවක් සඳහා සපයා ගැනීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 11 දින එළඹෙන ලද ගිවිසුම මධ්‍යස්ථානය විසින් ඒක පාර්ශවිකව කඩ කිරීම හේතුවෙන් රු.15,000,000 ක වන්දි මුදලක් අයකර ගැනීම සඳහා සැපයුම්කාර ආයතනය විසින් මධ්‍යස්ථානයට විරුද්ධව ප්‍රවර්තන වර්ෂය තුලදී නඩු පවරා තිබුණි. ඊට අමතරව මධ්‍යස්ථානයට එරෙහිව විවිධ අධිකරණවල නඩු 07 ක් පවරා තිබුණ ද ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

ii. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.මිලියන 1.34 ක වියදමින් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2010 වර්ෂයේදී ඉදිකර තිබුණු නමුත් එම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත නීත්‍යානුකූල ව පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිම කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක ඩීඑම්ජී/ඒ/එෆ්එස්/2018 හා 2019 මැයි මස 22 වන දිනැති ලිපිය හා බැඳේ. ඊට අදාල කරුණු දැක්වීම පහත පරිදි වේ.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

නීති රීති, විධිවිධාන වලට යොමුව

(අ) 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතේ 05 ඡේදය

එකඟනොවෙමි.

ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව කැඳවීමේ බලය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී නොමැත. ආපදා කළමනාකරණ පනතේ 3.2 වගන්තියේ අනුව ජාතික ව්‍යසන කළමනාකරණ සභාවේ ලේකම්වරයා සභාවේ සාමාජිකයෙකු විය යුතු බව සඳහන්වේ.

ව්‍යසන කළමනාකරණය සඳහා වූ 2007 ජූලි 30 වන දින දැවති දෙවන සභා රැස්වීමේ දී ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ව්‍යසන කළමනාකරණ ජාතික සභාවේ ලේකම්වරයා ලෙස පත්කර ඇත. ඒ අනුව ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කරමින් සිටින්නේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාය. කෙසේ වෙතත් ඉදිරියේදී ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව ක්‍රමවත් ලෙස පැවැත්වීමට ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්තුමා සමග සාකච්ඡා කර අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ) මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද අංක 2017/01 හා 2017 පෙබරවාරි 21 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 03 ඡේදය.

එකඟ වෙමි.

මෙම ව්‍යාපෘති තෝරා ගැනීමේදී මහජන විරෝධතාවන් අවම වන ලෙස ව්‍යාපෘති තෝරාගෙන ඇති බවට දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක, ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සහතික කර

ඇති අතර, අනතුරුව ව්‍යාපෘති අවලංගු වන බව දන්වා ඇත. ඉදිරියේදී මෙම තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(අ) ආපදා අවම කිරීමේ ව්‍යාපෘති මූල්‍ය උපයෝජනය

i. එකඟ වෙමි.

2017 වර්ෂයේ හිඟ බිල්පත් මුදල් ලෙස රුපියල් 22,137,936.00 ක මුදලක් පැවතින. මේ සඳහා ගෙවීම් කිරීමට අතිරේක ප්‍රතිපාදන ලබා දෙන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කළ අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරය මඟින් වාචිකව ලබා දෙන ලද උපදෙස් අනුව 2018 වසරේ ප්‍රතිපාදන මුදලින් රුපියල් 20,000,000.00 ක මුදලක් ලබා ගත් අතර, දිස්ත්‍රික්ක මඟින් 2017 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පසු ඉතිරි වූ මුදල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ආපසු එවන ලදී. එම මුදල් උපයෝගි කොටගෙන ඉතිරි හිඟ මුදල වූ රුපියල් 2,137,936.00 පියවීමට කටයුතු කරන ලදි.

ii. එකඟ වෙමි.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ පානීය ළිං හා වගා ළිං යථාතත්ත්වයට පත් කිරීමට රුපියල් මිලියන 34 ක පමණ මුදලක් වෙන් කිරීම නිසා අනුරාධපුර දිස්ත්‍රික්කය වැය කළ ප්‍රතිපාදන ඉහළ ගොස් ඇත.

නැවත පදිංචි කිරීම සඳහා තෝරා ගන්නා ලද ඉඩමකට යාමට මාර්ග පහසුකම් නොමැති වීම හේතුකොට ගෙන ප්‍රාදේශියව විශාල සාමාජීය ගැටළුවක් පැන නැඟී ඇති බව ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගේ හා ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමකදි දිස්ත්‍රික් ලේකම් , ගාල්ල විසින් කරන ලද දැනුම්දීමට අනුව ලේකම්, ආපදා කළමකාකරණ අමාත්‍යාංශය විසින් එම රැස්වීමේදි දෙන ලද උපදෙස් පරිදි මෙම රුපියල් 10,000,000.00 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් ලේකම්, ගාල්ල වෙත යොමු කොට ඇත.

iii. එකඟ වෙමි.

iv. එකඟ වෙමි

ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට අදාළ වාර්තා එවන මෙන් දිස්ත්‍රික්ක වෙත දැනුම්දී ඇති අතර, මේ වන විටත් ව්‍යාපෘති 125 ක පමණ වැඩ අවසන් වාර්තා ලැබී ඇති අතර, ඉතිරි ව්‍යාපෘතිවල අවසන් වාර්තා ලබා ගැනීමට කටයුතු කොට ඇත.

(ආ)

i. එකඟ නොවෙමි.

2018 වසර මැයි මස දී නිරිතදිග මෝසම සක්‍රීය වීම නිසා රත්නපුර හා කළුතර දිස්ත්‍රික්ක වල ඇතිවූ භදිසි ගංවතුර අවස්ථාවේදී විපතට පත් වූවන් පිළිබඳ නිරීක්ෂණ කටයුතු සඳහා ගරු ඇමතිතුමා, ලේකම්තුමා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ පැවති රැස්වීම් වලදී ඔරු අහුල් විශාල ප්‍රමාණයක් අවශ්‍ය බවත් ඒවා කඩිනමින් මිලදීගෙන අදාළ ස්ථාන වෙත ලබාදෙන ලෙසත් තීරණය කර ඇත. තවද,

වෙළඳපොළ තුළ ඔරු අඟුල් නිෂ්පාදනය කරන ආයතන ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවක් බැවින් එම ආයතන මගින් මිල කැඳවීම් සිදු කර ඇති අතර එහිදී ලියාපදිංචි හා ලියාපදිංචි නොවූ බෝට්ටු නිෂ්පාදන ක්ෂේත්‍රයේ තරඟකාරී ආයතන මගින් මිල විමසීම් සිදු කරන ලදි. එම ඔරු අඟුල් වලට අදාල පිරිවිතරයන් සළකා බැලීමේදී සිදු කර ඇත්තේ පසුගිය වර්ෂයන් වලට අදාල පිරිවිතරයන් බව සටහන් කරමි. මෙම සැපයුම්කරු මෙයට ප්‍රථමද එනම් 2017 වර්ෂයේදී අඟුල් 90ක් මෙම ආයතනයට සැපයීම් සිදු කර ඇති බැවින් හා ඒවා නියමිත පරිදි ඉටුකර ඇති බැවින් කාර්යය සාධන ඇපකරයක් ලබාගෙන නොමැත. මෙය සිදු කරන ලද්දේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:8 ප්‍රකාරව භාණ්ඩ වලට අදාළව (ආ) සැලකිල්ලට ගෙනය. මෙවැනි අඟුල් නිෂ්පාදකයින් රටෙහි ඉතා සුළු සංඛ්‍යාවක් සිටින අතර ඔවුන් කුඩා පරිමාණයෙන් තම කර්මාන්ත පවත්වාගෙන යයි. එකඵර මෙවැනි සැළකිය යුතු විශාල ඇණවුම් ඉදිරිපත් කිරීමේදී නිෂ්පාදනයේ සුළු ප්‍රමාදයක් සිදු වී ඇත.

ප්‍රසම්පාදන ලේඛන වලට අනුව මධ්‍යස්ථානය විසින් අපේක්ෂා කරන ලද්දේ සැපයුම්කරුගේ නිෂ්පාදන ආයතනයේ සිට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය දක්වා ඔරු අඟුල් ප්‍රවාහනය කර දීමය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නම් කරන ලද ස්ථාන සඳහා ප්‍රවාහනය කර දීම අප විසින් අපේක්ෂා කර නොතිබිණි. ඒ අනුව ප්‍රවාහනය සිදු කිරීම අමතර කාර්යයක් වූ බැවින් ඒ සඳහා වෙනම මිල ගණන් කැඳවා , ආයතනය තෝරාගෙන අදාළ කටයුතු සිදු කර ඔරු අඟුල් බෙදා හැරීම සිදු කර ඇත.

ii. එකඟ වෙමි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් විඩියෝ දර්ශන පථයක් මිලදී ගැනීම පැවති තත්ත්වය අනුව අත්‍යවශ්‍ය වූ කරුණක් බැවින් අදාළ අධිකාරීන්ගේ එකඟතාවයන් මත මිලදී ගැනීමට කටයුතු සිදු කරනු ලැබූ අතර එහිදී ඇති වූ යම් අඩුපාඩු මත අදාළ ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරීමට නොහැකි විය. ඒ අනුව, අදාළ ගෙවීම් කිසිවක් සිදු කර නොමැති බැවින් මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැති බව සටහන් කරමි. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.

iii. එකඟ නොවෙමි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ජන ඇමතුම් කවටල මිලදී ගැනීම අවශ්‍යතාවන් 03 ක් සඳහා වෙන් වෙන් වූ ප්‍රතිපාදන උපයෝගී කොට ගෙන ප්‍රසම්පාදනයන් සිදු කර ඇති අතර ඒ අනුව ජන ඇමතුම් කවටල එක් එක් අවශ්‍යතාවයන් සඳහා ඊට අදාළ වූ පිරිවිතරයන්ට අනුකූලව මිලදී ගැනීම සිදුකරන ලදි. එම අවශ්‍යතාවයන් පහත පරිදි වේ.

- ජන ඇමතුම් කවටල (Portable) 12ක් පුහුණු හා දැනුවත් කිරීම් අංශය සඳහා
- ජන ඇමතුම් කවටල 17ක් දිස්ත්‍රික් ඒකක සඳහා
- ජන ඇමතුම් කවටල (Loud Speaker) 120ක් හදිසි මෙහෙයුම් අංශය සඳහා

මෙම මිලදී ගැනීම් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් තුළ සිදු කිරීමට හැකි බැවින් ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු අනුගමනය කර ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:9:3 ට අනුව විධිමත් ගිවිසුමකට එලඹ නොතිබුණද මිලට ගැනීමේ ඇණවුම් නිකුත් කර ඇත. එහි 5:4:8 භාණ්ඩ (අ) (ආ) ට අනුව අස්ථිත්වයේ කාර්යය සාධන සුරක්ෂණයන් ලබා ගැනීම් සිදු නොකරන ලද්දේ සැපයුම්කරු විසින් සැපයුම නිසි කාල සීමාව තුළ සාර්ථකව සම්පූර්ණ කිරීමේ විශ්වාසය පදනම් කර ගෙනය. ඊට අනුව ප්‍රතිචාර දක්වා නොමැති ජන ඇමතුම් කවටල 120ක් සපයන ලද සැපයුම්කරු වෙත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ

යොමු අංක 5:4:13 ට අනුව ප්‍රමාද ගාස්තු අය කර ගෙවීම් සිදු කර ඇත. තවද, අදාළ සැපයුම් නිසි වේලාවට සිදු නොකිරීම මත ජන ඇමතුම් කට්ටල (Portable) 17ට අදාළ ප්‍රසම්පාදනය පසුව අවලංගු කර ඇත.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) ආපදා කළමනාකරණ සැලසුම් පිලියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම

i. එකඟවෙමි.

අදාල පනත සංශෝධනය කිරීමේ කටයුතු ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සිදු කෙරේ.

ii. එකඟවෙමි.

මේ වන විට සකස් කර අවසන්ව ඇති ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ අඩුපාඩු සකස් කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

iii. සෙන්දායි සැළැස්ම අනුව ආපදා අවදානම් අවම කිරීම සඳහා කෙටුම්පත් කරන ලද උපාය මාර්ගික සැළැස්ම අමාත්‍යාංශය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කොට ඇත. 2018 වර්ෂයේදී ආපදා අවදානම් කළමනාකරණය සඳහා වන සෙන්දායි රාමුව සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්ථනය කර මුද්‍රණය කිරීම් සඳහා මෙම ප්‍රතිපාදන යොදවා ඇත.

(ආ) තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

එකඟවෙමි.

මේ වන විට අරමුණු හඳුනාගෙන ඇති අතර ඒ සඳහා උපාය මාර්ග සකස් කරමින් පවතී. මේ සම්බන්ධව තිරසාර සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කල අතර උපාය මාර්ග හඳුනාගත් පසු තිරසාර සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කර වසර 2030 දක්වා ඊට අදාල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) වර්ෂික වාර්තා සභාගත කිරීම

2014 – 2017 වර්ෂයන්හි ආපදා කළමනාකරණ ඔධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාවන්හි වර්ථමාන තත්ත්වය පහත සඳහන් පරිදි වේ.

2014	පොත් සහ CD තැටි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත භාර දී ඇත. (2019.05.24 වන දින)
2015	පොත් සහ CD තැටි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත භාර දී ඇත. (2019.03.11 දින, මෙම වාර්තාව ගරු අමාත්‍යතුමාගේ අත්සන සඳහා

	ඉදිරිපත් කර ඇත.)
2016	මුද්‍රණ කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. (2019.05.16)
2017	මෙම වාර්තාවේ භාෂා භූනෙහි වැරදි අඩුපාඩු සකස් කර මුද්‍රණ කටයුතු සඳහා මෙම මස ඇතුළත ලබා දීමට කටයුතු කරනු ලබයි.

(ඇ) ඌණ උපයෝජිත අරමුදල්

එකඟවෙමි.

මෙම මුදල් යොදා ගෙන ඉදිරියේදී අදාල කාර්යයන් සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඉ) නොවිසඳුනු නීතිමය ගැටළු

- මෙම සියළු නඩු පිලිබඳ විස්තර ඔබ වෙත ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කරනු ලබන ආයතනයේ මූල්‍ය තත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ තීරණ ගැනීමේදී එම මූල්‍ය ප්‍රකාශයන් පරිශීලනය කරනු ලබන්නන්ගේ තීරණ කෙරෙහි මෙම නඩු විස්තර තීරණාත්මක බලපෑමක් නොමැති බව අපගේ හැඟීමයි.
- මෙම නඩු 07න් නඩු අංක 1153/M යටතේ පවරණ ලද නඩුවේ තීන්දුව ප්‍රකාශ කිරීමට නියමිතව ඇත.
- නඩු අංක M/43/14 යටතේ පවරා ඇති නඩුව පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා අස්කරගෙන ඇතිබව නීතිපති දෙපාර්තුමේන්තුව දැනුම් දී ඇත.
- අනෙකුත් නඩු තවමත් විභාග වෙමින් පවති.

ඩබ්.ඒ. ධර්මසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.